# පටුන

## පළමුවන කොටස
### ශ්‍රී ලංකා නාවික හමුදාවේ සංවිධානය


1. ලුහුඬු නාමය
2. ශ්‍රී ලංකා නාවික හමුදාව
3. ස්ථිර නාවික හමුදාව
4. නිත්‍ය නාවික උපසේවය
5. ස්වේච්ඡා නාවික බල හමුදාව
6. ස්වේච්ඡා නාවික උපසේවය
7. පුහුණුව
8. නාවික හමුදාධිපති


## දෙවන කොටස
### අධිකාරිලත් නිලධාරිහු


9. අධිකාරිලත් නිලධාරින් පත්කිරීම
10. පත්කිරීම්වල කාලසීමාව
11. ඉල්ලා අස්වීම


## තෙවන කොටස
### නාවිකයෝ


12. බඳවා ගැනීම
13. මුල්බඳවා ගැනීම සහ නැවත සේවයෙහි යෙදවීම
14. ස්වේච්ඡා නාවික බල හමුදාවේ හෝ ස්වේච්ඡා නාවික උපසේවයේ නාවිකයන් නිදහස් කිරීම


## හතරවන කොටස
### සේවය


15. ස්ථිර නාවික බලහමුදාව
16. ස්ථිර නාවික උපසේවය ස්වේච්ඡා නාවික බලහමුදාව සහ ස්වේච්ඡා නාවික උපසේවය සේවයෙහි යෙදවීම
17. නාවික හමුදාවේ සේවය දීර්ඝකිරීම
18. එක් ව ක්‍රියාකරන ශ්‍රී ලංකා නාවික යුධ හා ගුවන් බට හමුදාවන් අතර සම්බන්ධකම්
19. ලංකාව හැර පොදු රාජ්‍ය මණ්ඩලයේ සාමාජිකත්වය දරන වෙනයම් රටක නැව්වල සහ නාවික ආයතනවල සිටින නාවික හමුදාවේ නිලධාරින් හා නාවිකයෝ
20. විදේශීය නාවික බල හමුදාවක් සමග සහයෝගය
21. නාවික නොවූ රාජකාරි ඉටු කිරීම


## පස්වන කොටස
### නාවික නීතියට යටත් තැනැත්තෝ


22. නාවික නීතියට යටත් තැනැත්තා යන්නෙහි අර්ථය
23. නාවික සිරභාරයට යටත්වන තැනැත්තන්
24. නාවික සිරභාරයට ගන්නා ලෙස අණ කළ හැකි තැනැත්තෝ
25. සක්‍රිය සේවයෙහි යෙදී නොසිටින නිලධාරියකු හෝ නාවිකයකු නාවික සිරභාරයේ තැබීම
26. නඩු පැවරීමේ කාල සීමාව
27. නාවික නීතියට යටත්වීමෙන් වැලකුණු වරදකරුවන් පිළිබඳ නඩු විභාගය හා ඔවුන්ට දඬුවම් කිරීම

## හයවන කොටස
### අණදෙන නිලධාරින්ගේ අධිකරණ බලතල

28. හමුදාපතිවරයා විසින් හෝ අණදෙන නිලධාරින් විසින් ලඝු කාර්ය පටිපාටිය අනුව වරදකරුවන් පිළිබඳව නඩු විභාග කිරීම
29. ලඝු කාර්ය පටිපාටිය කරණයක් විසින් හෝ නඩුව විභාග කිරීම තෝරා ගැනීමට සුළු නිලධරයකු හෝ බලලත් නිලධරයකු වන වරදකරුවකුට ඇති අයිතිවාසිකම
30. අණදෙන නිලධාරියාගේ අධිකරණ බලතල පවරා දීම
31. ලඝු නඩු විභාග වලදී දිව්රුම් පිට හෝ සහතික ප්‍රකාශයක් පිට සාක්ෂි දිය යුතු බව
32. ලඝු නඩු විභාග වලදී නීතකෘත්‍ය සටහන් කිරීම

## හත්වන කොටස
### යුධාධිකරණ

33. යුද්ධාධිකරණ වල අධිකරණ බලතල
34. යුද්ධාධිකරණ පැවැත්වීමට අණ කළ හැකි බලධාරියෝ
35. යුධාධිකරණ සංස්ථාපනය
36. යුද්ධාධිකරණ පැවැත්විය යුතු ස්ථාන
37. යුද්ධාධිකරණ පැවැත්වීම
38. විනිශ්චයකාර අධිනීතිඥයා පත්කිරීම
39. විනිශ්චයකාර අධිනීතිඥයාගේ යුතුකම්
40. යුද්ධාධිකරණයේ සාමාජිකයන් විනිශ්චයකාර අධි නීතිඥයා සහ සාක්ෂිකරුවන් විසින් දිය යුතු දිවුරුම් හෝ කළයුතු සහතික ප්‍රකාශය
41. විත්තිකරුවා විසින් යුද්ධාධිකරණයේ සාමාජිකයන්ට විරුද්ධකම් දැක්වීම
42. යුද්ධාධිකරණ විසුරුවා හැරීම
43. යුද්ධාධිකරණයක් ඉදිරියේ වූ ප්‍රශ්න විසඳන ආකාරය
44. කරුණාව දැක්වීමට නිර්දේශ කිරීම
45. යුද්ධාධිකරණයක් පැවැත්වෙන ස්ථානයේ සිටින තැනැත්තන් එතැනින් ඉවත් කිරීමට ණකිරීමේ බලය
46. වරදකින් නිදහස් කිරීමේ හෝ වරදකට වරදකරු කිරීමේ ප්‍රතිඵලය
47. ඔප්පු වූ වරද චෝදනා ලැබූ වරදෙහි ඇතුළත් ව ඇති අවස්ථා
48. සිහි විකල වූ විත්තිකරුවා
49. ඉහත දී කළ වරදක් සම්බන්ධයෙන් දණ්ඩනයට නියමව සිටින වරදකරුවකු බන්ධනාගාර ගත කිරීම හෝ රඳවා තැබීම
50. යුද්ධාධිකරණයක පෙනී සිටින අධිනීතිඥයා
51. යුද්ධාධිකරණයක  නීති කෘත්‍ය පිළිබඳ වාර්තාව
52. යුද්ධාධිකරණයක විසින් විභාගයකට භාජන කරුණු තැනැත්තකුට නීතිකෘත්‍යවල පිටපතක් ගැනීමට ඇති හිමිකම
53. යුද්ධාධිකරණයක නීතිකෘත්‍ය පිළිබඳ සටහන් සුරක්ෂිතව තැබීම

## අටවන කොටස
### නාවික වරදවල්

#### සතුරා ඉදිරියෙහි නොමනා ලෙස හැසිරීම

54. ක්‍රියාවෙහි යෙදවීම පැහැර හැරීම
55. සතුරා ලුහු නොබැඳීම හෝ අපේක්ෂිත මිත්‍රරකුට සහාය  නොවීම
56. සේවය ප්‍රමාදකිරීම  හෝ අධෛර්යමත්  කිරීම

#### සතුරා සමග පණිවුඩ හුවමාරුව

57. ඔත්තුකාරයෝ
58. සතුරා සමග ලියුම් ගනුදෙනු කිරීම ආදිය
59. සතුරා සමග නොනිසි ලෙස පණිවුඩ හුවමාරු කිරීම
60. සක්‍රිය සේවයෙහි යෙදී සිටිය දී මුරපොළ අත්හැර යාම ආදිය

61. සක්‍රිය සේවයෙහි යෙදී සිටියදී නිවාඩු නො ගෙන බැහැරව සිටීම ආදිය
62. නිවාඩු නොගෙන මාසයක් බැහැර ව සිටීම
63. සාහසික ලෙස හමුදා කැරලි ගැසීම
64. සාහසිකත්වයෙන් තොර හමුදා කැරලි ගැසීම
65. හමුදා කැරලි ගැසීමට පෙළඹවීම
66. හමුදා කැරලි ගැසීමට රැස්වීම හෝ හමුදා කැරලි ගැසීම පිළිබඳ වචන ප්‍රකාශ කිරීම
67. හමුදා කැරලි ගැසීමේ ක්‍රියා වසන් කිරීම
68. නාවික නීතියට යටත් යම් තැනැත්තකුට පහරදීම හෝ පහර දීමට තැත්කිරීම ආදිය

**අණට අකීකරු වීම**

69. ඉහළ නිලධරයන්ට හෝ කණිෂ්ඨ නිලධරයන්ට අකීකරු වීම හෝ තර්ජනාත්මක වචන පාවිච්චි කිරීම
70. දබර කිරීම හෝ අපවාදාත්මකව කථා හෝ ඉඟි කිරීම
71. පැනයාම
72. පැනයාමට පෙළඹවීම
73. පැනයන්නකුට සංග්‍රහ කිරීම

**යුද්ධාධිකරණ හා අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරීන් සම්බන්ධ වරදවල්**

74. සාධාරණ හේතුවක් නොමැතිව යුද්ධාධි කරණයක සාමාජික යකු බැහැරව සිටීම
75. නාවික නීතියට යටත් සාක්ෂි කරුවකුගේ නොමනා හැසිරීම හා ඔහුගෙන් වන අපහාසය
76. නාවික නීතියට යටත් සාක්ෂි කරුවකු විසින් බොරු සාක්ෂි දීම

**සිරභාරයේ සිටින තැනැත්තන් සම්බන්ධ වරදවල්**

77. සිරභාරයේ සිටින තැනැත්තකු බේරී යාමට අවසර දීම
78. අයථා ලෙස අත් අඩංගුවේ හෝ සිර අඩස්සියේ තැබීම
79. සිර අඩස්සියෙන් බේරී යාම

**දේපළ සම්බන්ධ වරදවල්**

80. නාවික හමුදාවේ සැපයුම් පිළිබඳ දූෂණ කටයුතු
81. නාවික බඩු මුට්ටු වංචනික ලෙස ප්‍රයෝජනයට ගැනීම ආදිය
82. නාවික දේපළක අඩුපාඩුවක් ඇති කිරීම හෝ ඊට හානියක් කිරීම
83. නීති විරෝධී ලෙස දේපළ පිළිස්සීම

**ලේඛන හා ප්‍රකාශ සම්බන්ධ වූ වරදවල්**

84. අසත්‍ය ලේඛන හා ප්‍රකාශ
85. අසත්‍ය චෝදනා

**බඳවා ගැනීම සම්බන්ධ වරදවල්**

86. අපකීර්ති සහගතව නිදහස් කරනු ලැබූ නාවිකයකු සෙබළෙකු හෝ ගුවන් භටයකු බඳවා ගැනීම
87. බඳවා ගැනීම් වලදී අසත්‍ය පිළිතුරු දීම
88. බඳවා ගැනීම සම්බන්ධ සාමාන්‍ය වරදවල්
89. බීමත්කම හා දුශ්චරිතය
90. කෲරකම හා ගර්හිත හැසිරීම
91. නැව් හෝ ගුවන් නැවක් නොනිසි ලෙස නාස්ති වීමට ඉඩ හැරීම
92. ආරක්ෂාව යටතේ තිබෙන නැව්වලට නොසැලකීම හා ඒවා ආරක්ෂා නොකිරීම
93. නැව් පාවිච්චියට හැර නැවකට භාණ්ඩ ගෙන යාම
94. රෝගයක් හෝ බෙලහීනතාවයක් ඇති කිරීම හෝ බරපතළ කිරීම
95. සපයන ලද කෑම්බීම්වල අපථ්‍යතාවය හෝ වෙනයම් හේතු

96. කොල්ලකා ගත් යාත්‍රාවක තිබී සොයා ගත් පත්‍රිකා
97. කොල්ල කා ගත් යාත්‍රාවකට අයත් දේපළ වාංචනික ලෙස ප්‍රයෝජනයට ගැනීම
98. කොල්ලකා ගත් යාත්‍රාවක සිටින තැනැත්තන්ට සැලකීම
99. යාත්‍රාවක් කොල්ලකා ගැනීමෙහිලා වංක සහයෝගය දැක්වීම ආදිය
100. වංචනික ලෙස ප්‍රයෝජනයට ගැනීමේ අදහසින් කොල්ලකා ගත් යාත්‍රාවක බඩුබැම
101. නාවික හමුදාවේ පත් කිරීම් හෝ උසස් කිරීම් සම්බන්ධයෙන් නීති විරෝධී වූ ප්‍රතිජ්ඨාවක් දෙන හෝ ලබන නාවික නීතියට යටත් තැනැත්තෝ
102. හානිකර වූ එළිදරවූ කිරීම
103. සිවිල් වරදවල්වලට චෝදනා ලැබූ හෝ වරදකරුව කරනු ලැබූ නිලධාරීන් සහ නාවිකයන් සිවිල් අධිකරණයකට භාර දීම පැහැර හැරීම
104. නාවික විනය පිළිබඳව විශේෂයෙන් සඳහන් නොවූ වරදවල්

## නව වැනි කොටස
## මේ පනත යටතේ නාවික වරදවල් නොවන වරදවල්

105. නීති විරෝධී බඳවාගැනීම
106. බඳවා ගැනීම සඳහා ඉල්ලුම් කරන්නන් ලබන අසත්‍ය පිළිතුරු
107. පැන යාමට හෝ නිවාඩු නොගෙන බැහැරව සිටීමට නිලධාරීන් හෝ නාවිකයන් පෙලඹවීම ඔවුන්ට සහාය වීම.
108. නාවික රාජකාරි වලට මැදිහත් වීම
109. නාවික හමුදාවේ පත් කිරීම් හා උසස් කිරීම් සම්බන්ධයෙන් නීති විරෝධී වූ ප්‍රතිජ්ඨාවක් දෙන හෝ ලබන නාවික නීතියට යටත් නොවූ තැනැත්තෝ
110. නාවික දේපළ මිලට ගැනීම
111. නයට ඇපයක් වශයෙන් නාවික සහතිකයක් සතු කොට ගැනීම
112. බලය නොලැබ නාවික පළඳනා ආදිය පාවිච්චි කිරීම
113. සේවා යෝජකයන්ගේ බැඳීම
114. අසෛනික වූ සාක්ෂි කරුවකුගේ නොමනා හැසිරීම
115. අසෛනික සාක්ෂි කරුවකු බොරු සාක්ෂි දීම හා අපහාස කිරීම 15 වෙනි අධිකාරිය
116. බලය නොලැබ නාවික පුහුණුවක් බඳු පුහුණුවක් ලබාදීම
117. ගැලවී යාමෙහි දී හෝ ගැලවී යාමට තැත්කිරීමේ දී නාවික සිරකරුවන්ට ආධාර වන හෝ නාවික බන්ධනාගාර නියෝග කඩ කරන නාවික නීතියට යටත් නොවූ තැනැත්තෝ

## දහවන කොටස
## යුද්ධාධිකරණය විසින් සිවිල් වරදවල් සම්බන්ධයෙන් දෙනු ලබන දඬුවම්

118.

## එකොළොස් වන කොටස
## යුද්ධාධිකරණ විසින් සහ අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරීන් විසින් දඬුවම් දීම

119. 118 වෙනි වගන්තියේ සඳහන් නොවූ යම අසෛනික වරදක්
120. දණ්ඩන ක්‍රමය
121. දඬුවම් දීම සම්බන්ධව විශේෂ විධිවිධාන

## දොලොස්වන කොටස
## යුද්ධාධිකරණවලින් හා අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරීන් විසින් කෙරෙන දණ්ඩන නියම ප්‍රතිශෝධනය කිරීම හා ක්‍රියාවේ යෙදවීම

122. දණ්ඩන නියම ප්‍රතිශෝධනය කිරීම
123. මරණ දණ්ඩන නියමය
124. නියම කිරීමේ බලධාරියෝ
125. නාවික සිරකරුවන් නියම කිරීම මාරු කිරීම ඉවත් කිරීම සහ නිදහස් කිරීම

126. බන්ධනාගාරගත කිරීමේ හෝ රඳවා තැබීමේ වාර ආරම්භය
127. නාවික සිරභාරයේ රඳවා තැබීම
128. සිහි විකලවූ සිරකරුවෝ
129. නාවික බන්ධනාගාර සහ නිවර්තන නිවාස පිහිටුවීම

## දහතුන් වෙනි කොටස
### සිවිල් අධිකරණ

130. මේ පනතින් හානියක් නොවූ සිවිල් අධිකරණවල අධිකරණ බලය
131. නාවික වරද කරුවන් සිවිල් බලදරන තැනකට භාර දීම
132. ශ්‍රේෂ්ඨාධිකරණය මගින් පරමාධිකාර ආඥාපත්‍ර නිකුත් කිරීම
133. මේ පනත යටතේ කරනු ලබන ක්‍රියාවලට විරුද්ධව නඩු පැවරීම

## දහහතරවන කොටස
### සාක්ෂි නීති

134. යුධාධිකරණ ඉදිරියේ පැවැත්වෙන නීති කාකෘත්‍ය සම්බන්ධ සාක්ෂි නීති
135. 136 සිට 146 දක්වා වූ වගන්ති අදාළ කිරීම
136. නාවිකයකු ලෙස තැනැත්තකු බඳවා ගැනීමේ දී හෝ නැවත සේවයෙහි යෙදවීමේ දී ඔහු විසින් දෙන පිළිතුරුවලට සාක්ෂි
137. බඳවාගත් බව ඔප්පු කිරීම
138. සේවය පිළිබඳ වූ ලියුම් වාර වාර්තා හෝ වෙනත් ලේඛණ
139. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් මුද්‍රිත නියෝග සහ ආඥා පිටපත්
140. නාවික ලේඛණය හෝ ගැසට් පත්‍රය
141. නාවික බලධාරින් විසින් මේ පනත යටතේ පනවනු ලබන ආඥා
142. රාජකාරිය අනුව නාවික හමුදාවේ පොතක කරනු ලබන සටහනක්
143. සවිස්තර වාර වාර්තාව
144. පැන ගොස් හෝ නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු හෝ අනිසි ලෙස ඉවත්ව ගිය තැනැත්තකු භාරවීම පිළිබඳ සහතිකය
145. නිලධාරියකු හෝ නාවිකයකු ලංකා වෙන් පිටත දී අත්අඩංගුවට ගැනීම හෝ භාර අවීම පිළිබඳ සහතිකය
146. යුධාධිකරණයක නීතිකෘත්‍යවල පිටපතක්
147. අසෛනික අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ බවට හෝ නිදොස් කරනු ලැබූ බවට සාක්ෂි

## පහළොස්වන කොටස
### විවිධ කරුණු

148. යුධ කාලය තුළ විනය කඩකිරීමේ වරදවල් සම්බන්යෙන් නිලධාරීන් විභාගයකට භාජනය කිරීම
149. සන්නද්ධ කැරලි කරුවන් සහ හමුදා කැරලි කරුවෝ
150. වරදකරුවන් අත්අඩංගුවට ගැනීමේ බලය
151. පැනයන්නන් හා නිවාඩු නොගෙන බැහැරව සිටින්නන් අත්අඩංගුවට ගැනීම
152.
153.
154. අඹු දරුවන් නඩත්තු කිරීම
155. සොර ගත් බඩු ආපසු දීමේ බලය
156. ශ්‍රී ලංකා නාවික හමුදාවට සම්බන්ධ වෙනත් විදේශීය නාවික හමුදාවල සාමාජිකයන්
157. ශ්‍රී ලංකා නාවික හමුදාවට සම්බන්ධ වෙනත් විදේශීය නාවික හමුදාවල සාමාජිකයන්
158. නාවික හමුදාධිපතිවිසින් කරනු ලබන ආඥාවල් පිළිබඳ විධි විධාන
159. නාවික නැව් තොටු
160. නැව් තොටුවලට බලපාන ලිඛිත නීතිය බැහැර කිරීම හෝ එය වෙනස්කොටඅදාළ කිරීම
161. නියෝග
162.
163.

# 1950 අංක 34 දරණ නාවික හමුදා පනත

නාවික හමුදාවක් පිහිටුවීම හා පවත්වා ගෙන යාම සඳහාත් ඒ හා සම්බන්ධ කරුණු සඳහාත් විධි විධාන සැලැස්වීමට පනවනු ලබන පනතකි.

(1950 දෙසැම්බර් මස 09 වන දින)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය

1. මේ පනත 1993 අංක 11 දරණ නාවික හමුදා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## 1 කොටස
## ශ්‍රී ලංකා නාවික හමුදාවේ සංවිධානය

ශ්‍රී ලංකා නාවික හමුදාව

2. (1) මේ පනතෙහි ද එය යටතේ පනවන ලද නියෝගවලද විධි විධාන අනුව පාර්ලිමේන්තුව විසින් කලින් කල තීරණය කරනු ලබන සංඛ්‍යාවක් නො ඉක්මවන (මෙහි මින් මතු නාවික හමුදාව යයි කියනු ලබන) ශ්‍රී ලංකා නාවික හමුදාව නමින් හැඳින්විය යුතු නාවික හමුදාවක් පිහිටුවා පවත්වා ගෙන යා යුතුය.

(2) නාවික හමුදාව

(අ) ස්ථිර නාවික බල හමුදාවකින් ද

(ආ) ස්ථිර නාවික උපසේවයකින් හා

(ඇ) 5 වෙනි හා 6 වෙනි වගන්ති යටතේ සංස්ථාපනය කල හැකි ස්වේච්ඡා නාවික බල හමුදාවකින් ද හා ස්වේච්ඡා නාවික උපසේවයකින්ද සමන්විත විය යුතුය.

ස්ථිර නාවික හමුදාව

3. (1) ස්ථිර නාවික බල හමුදාව තම තමන් සේවයෙහි යෙදී සිටින කාලය තුල දි නො කඩවා සේවය කිරිම සඳහා මේ පනත යටතේ පත් කරනු ලබන හෝ බඳවා ගනු ලබන නිලධාරින්ගෙන් හා නාවිකයන්ගෙන් ද සමන් විත විය යුතුය.

(2) කලින් කල ජනාධිපතිණීය විසින් තීරණය කරනු ලැබිය හැකි අයුරින් ස්ථිර නාවික බල හමුදාවක් සංවිධානය කළ යුතුය

(3) මෙහි මින් මතු විධි විධාන යොදනු ලබන පරිදි සක්‍රිය සේවය සඳහා හෝ නාවික පුහුණුව සඳහා ස්ථිර නාවික උපසේවය ස්වේච්ඡා නාවික බල හමුදාව හෝ ස්වේච්ඡා නාවික උපසේවය සම්පූර්ණයෙන් හෝ එයින් යම් කොටසක් කැඳවනු ලැබු අවස්ථාවක එසේ කැඳවනු ලැබු උපසේවයෙහි බල හමුදාවෙහි හෝ කොටසෙහි නිලධාරින් සහ නාවිකයන් ඒ සේවා කාලය හෝ පුහුණුවිමේ කාලය තුළ සියලුම කාර්යයන් සඳහා ස්ථිර නාවික බල හමුදාවේ නිලධාරින් හා නැවියන් ලෙස සලකනු ලැබිය යුතුය

නිත්‍ය නාවික උපසේවය

4. නිත්‍ය නාවික බලකායෙන් හෝ නිත්‍ය නාවික බලකායේ සේවයෙන් පසුව හෝ ජනාධිපතිවරයාගේ නියමයක් මගින් මාරු කරනු ලැබූ නිලධාරයන්ගෙන් සහ නාවිකයන් බඳවා ගැනිමේ කොන්දේසිවලට අනුකූලව නිත්‍ය නාවික බලකාය හෝ නිත්‍ය නාවික බලකායේ සේවයෙන් පසුව හෝ නිත්‍යා නාවික උපසේවය වෙත මාරු කරනු ලැබූ නාවිකයන්ගෙන් ද නිත්‍ය නාවික උපසේවය සමන්විත විය යුතුය.

**ස්වේච්ඡා නාවික බල හමුදාව**

**5.** (1) මේ පනතෙහි ද එය යටතේ පනවන ලද නියෝග වල ද විධි විධාන වලට අනුකූලව මේ පනත යටතේ සේවය කිරීම සඳහා ස්වේච්ඡා බල හමුදාවක් පිහිටුවා පවත්වා ගෙන යා හැකිය

(2) මේ පනත යටතේ පිහිටුවා පවත්වා ගෙන යනු ලබන ස්වේච්ඡා බල හමුදාව ස්වේච්ඡා නාවික බල හමුදාව නමින් හැඳින්විය යුතුය

(3) ජනාධිපතිවරයා විසින් කලින් කල තිරණය කරනු ලැබිය හැකි අයුරින් ස්වේච්ඡා නාවික බල හමුදාව සංවිධානය කල යුතුය

254 වන අධිකාරිය

(4) මේ පනත වලංගු වන දිනයට පෙරාතුව ම දිනයේ (නාවික ස්වේච්චා අණපනතේ අර්ථය ඇතුලත ) නියම සේවයෙහි යෙදී නොසිටින නාවික ස්වේච්ඡා ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ස්වේච්චා නාවික බල හමුදාවේ සාමාජිකයකු ලෙස සලකනු ලැබිය.

**ස්වේච්ඡා නාවික උපසේවය**

6. (1) ජනාධිපතිගේ ආඥාවෙන් ස්වේච්ඡා නාවික උපසේවයට මාරු ලබන ස්වේච්ඡා නාවික බල හමුදාවේ හෝ නාවික හමුදාවේ වෙනයම් අංශයක නිලධාරින්ගෙන් හා නාවිකයන්ගෙන් ද සමන්විත වන ලෙස ස්වේච්චා නාවික උපසේවයක් සංවිධානය කොට නඩත්තු කල හැකිය

**පුහුණුව**

7. ජනාධිපතිගේ ආඥාවෙන් ස්ථිර නාවික උපසේවය ස්වේච්ඡා නාවික බල හමුදාව හෝ ස්වේච්ඡා නාවික උපසේවය සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් ඒ ආඥාවේ නියම කරනු ලබන යම් කාලයක් තුළ දි මුළු ස්ථිර නාවික බල හමුදාව හෝ එයින් යම් කොටසක් සමග පුහුණුව සඳහා කැඳවනු ලැබිය හැකි ය

**නාවික හමුදාධිපති**

8. (1) නාවික හමුදාවට අණදීම පිණිස සුදුසු වූද යෝග්‍ය වූද තැනැත්තකු ජනාධිපති විසින් පත් කළ යුතුය

(2) (1) වෙනි උපවගන්තිය යටතේ පත් කරනු ලබන තැනැත්තා නාවික හමුදාධිපති යන නිලනාමයෙන් හැඳින්විය යුතුය

## දෙවන කොටස
## අධිකාරිලත් නිලධාරිහු

**අධිකාරිලත් නිලධාරින් පත්කිරිම**

9. (1) බලපත්‍රලත් නිලධාරින් සහ යටත් නිලධාරින් හැර සෙසු සියලුම නිලධාරින් ජනාධිපතිගේ අත්සන යෙදූ අධිකාරි මගින් පත්කළ යුතුය එසේ පත් කරනු ලබන නිලධාරියකු මෙහි මින්මතු අධිකාරලත් නිලධාරියා නමින් හඳුන්වනු ලැබේ

(2) ජනාධිපති විසින් (1) වෙනි උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන කිසිම අධිකාරියක් ඔහුගේ මරණය හෝ රාජකාරිය අත්හැර යාම හේතු කොට ගෙන අවලංගු නො විය යුතුය

**පත්කිරිම්වල කාලසීමාව**

10. සැම අධිකාරලත් නිලධාරියකුම ජනාධිපතිගේ කැමත්ත ඇති තාක් කල් තම පත්විම දැරිය යුතුය

**ඉල්ලා අස්විම**

11. (1) ස්ථිර නාවික බලහමුදාවේ හේ ස්ථිර නාවික උප සේවයේ අධිකාරලත් නිලධරියකුට ඔහුගේ අධිකාරයෙන් ඉල්ලා අස්විමේ අයිතියක් නො තිබිය යුතු ය එහෙත් එසේ කිරිමට ජනාධිපති විසින් ඉඩ දිය හැකි ය

(2) සිය අධිකාරියෙන් ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා වෙත භාර දෙන නිත්‍ය නාවික හමුදාවේ හෝ නිත්‍ය නාවික උපසේවයේ අධිකාරිලත් නිලධාරියකු -

(අ) නාවික හමුදාවේ දේපළ වන්නා වූද ස්වකීය සන්තකයේ ඇත්තාවූ සියලු යුද්ධ ආයුධ ඇඳුම් සහ නිල ලාංජණ (සාධාරණ ලෙස ගෙවීම සහ ක්ෂයවීම හැර) හොඳ තත්ත්වයෙන් නියමිත නිලධාරියා වෙත ඔහු විසින් ආපසු භාර දෙන තුරු සහ

(ආ) ඔහුගේ ඉල්ලා අස්වීම පිළිගනු ලැබූ බවට ගැසට් පත්‍රයේ පළල කරනු ලබන තුරු එම අධිකාරිලත් නිලධරයාගේ ධුරයේ කාර්යවලින් ඔහු නිදහස් කරනු නොලැබිය යුතුය

(3) ස්වේච්ඡා නාවික බල හමුදාවේ හෝ ස්වේච්ඡා නාවික උපසේවයේ අධිකාරලත් නිලධාරියකු යම් දිනයක ඔහුගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීමට කැමැති වූ අවස්ථාවක ඒ දිනයේ දී ඔහු තම අධිකාරියෙන් ඉල්ලා අස්වන බව ඒ දිනයට තෙමසකසට අඩුනොවූ කාලයකට පෙර ජනාධිපති වෙත ලියවිල්ලකින් දැනිවය යුතුය.

(4) ස්වේච්චා නාවික බල හමුදාවේ හේ ස්වේච්ඡා නාවික උප සේවයේ අධිකාරිලත් නිලධාරියකු (3) වන උපවගන්තියට අනුකූල ව සිය අධිකාරියෙන් ඉල්ලා අස්වීමේ දැන්වීම දි ඇති අවස්ථාවක ඔහුගේ සන්තකයේ ඇති නාවික හමුදාවේ දේපළ වන සියලු යුධ ආයුධ ඇඳුම් සහ නිල ලාංජන (සාධාරණ ලෙස ගෙවීම සහ ක්ෂයවීම හැර ) හොද තත්ත්වයෙන් නියමිත නිලධරයා වෙත ආපසු භාර දිමේදි =

(අ) එම දැන්වීමේ නිශ්චිතව දැක්වෙන ඉල්ලා අස්වීමේ දිනයේදි ඔහු සක්‍රිය සේවයෙහි නොමැති නම් හෝ

(ආ) එම සේවයෙන් ඉල්ලා අස්වීමට ඉක්බිතිව ම ඔහු සක්‍රිය සේවයේ සිටි නම් ඔහුගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීමට ඔහුට හිමිකම් තිබිය යුතුය

## තෙවන කොටස
## නාවිකයෝ

බඳවා ගැනිම

12. (1) නාවිකයන් ලෙස තැනැත්තන් බඳවා ගැනිම කළ යුත්තේ මේ පනත යටතේ ඒ සඳහා පනවනු ලැබිය හැකි නියෝග වලට අනුකූලවය

(2) නාවිකයකු ලෙස බඳවා ගැනිම සඳහා තෝරා ගනු ලබන සෑම තැනැත්තකු විසින් ම නියමිත නිලධාරියකු ඉදිරියේ පෙනී සිට ඔහුගේ බඳවා ගැනිම පිළිබඳ කොන්දේසි අඩංගු සහතික කිරිමේ පත්‍රිකාවක් අත්සන් කළ යුතුය

(3) 2 වෙනි උපවගන්තියෙහි සඳහන් සහතික කිරිමේ පත්‍රිකාව නියමිත ආකෘතිය අනුව විය යුතුය

මුල්බඳවා ගැනිම සහ නැවත සේවයෙහි යෙදවීම

13. (1) ස්ථිර නාවික බල හමුදාවේ නාවිකයකු ලෙස 17 වැනි වගන්තියේ විධි විධානවලට යටත් ව තැනැත්තු බඳවා ගත යුත්තේ

(අ) මුල් බඳවා ගැනීමේ කාලය යනුවෙන් හැඳින්විය යුතු නියමිත කාලය සඳහා ද

(ආ) සම්පූර්ණයෙන් ම එකී බල හමුදාවේ සේවය සඳහා හෝ තරමක් දුර එකී සේවයේත් තරමක් දුර ස්ථිර නාවික උපසේවයේත් සේවය කිරීම සඳහා ද වේ

(2) නාවිකයකුගේ මුල් බඳවා ගැනීමේ කාලය ගතවීමට පෙර නැවතසේවයෙහි යෙදවීම පිළිබඳ නියමිත උපරිම කාලයට වැඩි නොවූ තවත් කාලයක් නාවික සේවය සඳහා ඔහු නැවත සේවයෙහි යෙදවිය හැකිය එසේ වුවද නාවිකයකු යම් නිශ්චිත කාලයක් සඳහා නාවික හමුදාවට හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට සේවය කිරීම සඳහා බැඳුම්කරයකට ඇතුළත් වී ඇති විට එම නිශ්චිත කාලසීමාව අවස්ථාවෝචිත පරිදි මුල් බඳවා ගැනීමේ කාලසීමාව හෝ අභිබවා ගිය ද එය නොතකා එම නිශ්චිත කාලසීමාව අවසන් වනතුරු ඔහු නාවික හමුදාවේ සේවය කළ යුතුය තවද

(3) නිත්‍ය නාවික බලකායේ හෝ නිත්‍ය නාවික උප සේවයේ නාවිකයකු ඔහුගේ සන්තකයේ ඇති නාවික හමුදාවේ දේපළ වන සියලු යුද්ධායුධ ඇඳුම් සහ නිල ලාංඡන (සාධාරණ ලෙස ගෙවීම සහ ක්ෂයවීම හැර) හොඳ තත්වයෙන් නියමිත නිලධාරයා වෙත ආපසු භාරදෙන තුරු නාවිකයකු වශයෙන් ඔහුගේ කාර්යවලින් ඔහු නිදහස් කරනු නොලැබිය යුතුය

ස්වේච්ඡා නාවික බල හමුදාවේ හෝ ස්වේච්ඡා නාවික උපසේවයේ නාවිකයන් නිදහස් කිරීම

14. ස්වේච්ඡා නාවික බල හමුදාවේ හෝ ස්වේච්ඡා නාවික උපසේවයේ සේවයේ කිරීමට ස්වේච්ඡාවෙන් ඉදිරිප් ව සිටින කාලය ගතවීමට පෙර කයම් දිනයක ඔහු ඒ බල හමුදාවෙන් හෝ උපසේවයෙන් නිදහස් වීමට කැමති වූ අවස්ථාවක ඒ දිනයට තුන් මසකට අඩු නොවූ කාලය කට පෙර ඔහු එසේ නිදහස් කිරීම සඳහා ඔහුගේ අණදෙන නිලධාරියා වෙත ලියවිල්ලකින් ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය තවද ඔහු එවැනි ඉල්ලීමක් කළහොත් 17 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව සහ ඔහුගේ සන්තකයේ ඇති නාවික හමුදාවේ දේපළ වන සියලු යුද්ධායුධ ඇඳුම් සහ නිල ලාංඡන (සාධාරණ ලෙස ගෙවීම සහ ක්ෂයවීම හැර) හොඳ තත්ත්වයෙන් නියමිත නිලධරයා වෙත ඔහු විසින් ආපසු භාර දෙනු ලැබීමෙන් පසුව එම බලකායෙන් හෝ එම උප සේවයෙන් එම දිනයේ දී නිදහස් කරනු ලැබීමට ඔහුට හිමිකම තිබිය යුතුය

## හතරවන කොටස
## සේවය

ස්ථිර නාවික බලහමුදාව සේවයෙහි යෙදවීම

15. ස්ථිර නාවික බල හමුදාව හැම කල් හි ම සක්‍රිය සේවයෙහි යොදවනු ලැබීමට බැඳී සිටිය යුතුය

ස්ථිර නාවික උපසේවය ස්වේච්ඡා නාවික බලහමුදාව සහ ස්වේච්ඡා නාවික උපසේවය සේවයෙහි යෙදවීම

16. (1) (අ) නියම යුද්ධයක් පවතින කාලයක හෝ යුද්ධියක් ඇති වෙතැයි සැක කරන කාලයක ලංකාව ආරක්ෂා කිරීම සඳහා හෝ

(ආ) ලංකාවේ යම් කැරැල්ලක් ආරම්භ කැරැල්ලක් හෝ වෙනත් මහජන කැළඹීමක් වැළැක්වීම හෝ යටපත් කිරීම සඳහා ප්‍රකාශනයක් මගින් හෝ ප්‍රකාශනයක් නිකුත් කළ නොහැකි තැනට කරුණු යෙදී ඇති අවස්ථාවක ආඥාවක් මගින් මෙහි පහත දැක්වෙන නාවික හමුදා අංශ සියල්ල හෝ

කිසිවක සම්පූර්ණයෙන් හෝ ඒවායේ යම් කොටසක් සක්‍රිය සේවය සඳහා ජනාධිපති විසින් කැඳවිය හැකිය ස්ථිර නාවික උප සේවය ස්වේච්ඡා නාවික බල හමුදාව ස්වේච්ඡා නාවික උප සේවය

(2) ප්‍රකාශනයක් හෝ ආඥාවක් (1) වෙනි උපවගන්තිය යටතේ නිකුත් කළ දිනයෙහි දී පාර්ලිමේන්තුව රුස්වන්නේ නම් ජනාධිපති විසින් ප්‍රකාශනය හෝ ආඥාව නිකුත් කිරීමට හේතුව පාර්ලිමේන්තුව වෙත වහාම දැනුම් දිය යුතුය ඒ අවස්ථාවේදි පාර්ලිමේන්තුව රුස් නොවන්නේ නම් ජනාධිපති විසින් හැකි පමණ ඉක්මණින් එහෙත් ඉහත කී දිනයේ සිට තිස් දවසක් ගතවීමට පෙර රුස්වන ලෙස පාර්ලිමේන්තුව කැඳවිය යුතුය තවද පාර්ලිමේන්තුව කැඳවනු ලැබීමෙන් පසු එහි පළමුවෙනි රුස්වීමෙහි දී ඉහත කීහේතුව දැනුම් දිය යුතුය

(3) සක්‍රිය සේවය සඳහා (1) වෙනි උපවගන්තිය යටතේ කැඳවනු ලබන නාවික හමුදාවේ යම් කොටසක සියලු ම නිලධාරි හා නාවිකයන් ජනාධිපති ප්‍රකාශනයක් මගින් ඒ සේවය අවසන් කරන තුරු ඒ සේවයෙහියෙදි සිටිය යුතු බව සැලකිය යුතුය

**නාවික හමුදාවේ සේවය දික්කිරීම**

17. නාවික හමුදාවෙන් නිදහස් කරනු ලැබීමට නාවිකයකුට හිමිකම් ඇති කාලය නාවික හමුදාව සම්පූර්ණයෙන් හෝ එහි යම් කොටසක් සක්‍රිය සේවයෙහි යෙදි සිටිය දි එළඹුණු අවස්ථාවෙක ජනාධිපති විසින් ආඥාවක් මගින් ඒ නාවිකයාගේ නාවික හමුදාවේ සේවය ඒ කාලය සඳහා දික් කළ හැකිය

**එක් ව ක්‍රියාකරන ශ්‍රී ලංකා නාවික යුධ හා ගුවන් බව හමුදාවන් අතර සම්බන්ධකම්**

18. (1) නියම කරනු ලැබිය හැකි අවස්ථාවලදි නාවික හමුදාවේ නිලධාරියකු හෝ නාවිකයකු ලංකාවේ යම් යුද්ධ හෝ ගුවන් බල හමුදාවක සේවයෙහි යොදනු ලැබ හෝ ඒ හා සමග ක්‍රියා කරන නාවික හමුදාවේ යම් කොටසක සාමාජිකයකු ව සිටින විට ඔහු සම්බන්ධයෙන් අණදීම හා විනය පිළිබඳ කාර්යයන් සඳහා ඒ බල හමුදාවේ නිලධාරින් හා (තනතුරින් සැරයන් තැනට වඩා පහත් නොවු) අධිකාර නොලත් නිලධාරින් (දඩුවම් දීමේ බලතල හැර) සියලු ම බලතල පවරනු ලැබු නාවික හමුදාවේ නිලධාරින් හා සුළු නිලධාරින් ලෙස කාරණයට ගැළපෙන පරිදි සලකනු ලැබිය යුතුය

(2) නියම කරනු ලැබිය හැක් අවස්ථාවලදි ලංකා යුද්ධ හමුදාවේ හෝ ගුවන් බල හමුදාවේ නිලධාරියකු හෝ (තනතුරින් සැරයන් තැනට වඩා පහත් නොවු) අධිකාර නොලත් නිලධාරිය ශ්‍රී ලංකා නාවික හමුදාවේ යම් කොටසක සේවයෙහි යොදනු ලැබ හෝ ඒ හා සමග ක්‍රියා කරන ලංකාවේ යම් යුද්ධ හෝ ගුවන් බල හමුදාවක සාමාජිකයකු ව සිටින විට නාවික හමුදාවේ ඒ කොටස සම්බන්ධයෙන් අණදීම හා විනය පිළිබඳ කාර්යයන් සඳහා ඔහු (දඩුවම් දීමේ බලතල හැර) සියලු ම බලතල පවරනු ලැබු නාවික හමුදාවේ නිලධාරියකු හෝ සුළු නිලධාරියකු ලෙස කාරණයට ගැළපෙන පරිදි සලකනු ලැබිය යුතුය

**ලංකාව හැර පොදු රාජ්‍ය මණ්ඩලයේ සාමාජිකත්වය දරන වෙනයම් රටක නැව්වල සහ නාවික ආයතනවල සිටින නාවික හමුදාවේ නිලධාරින් හා නාවිකයෝ**

19. පොදු රාජ්‍ය මණ්ඩලයේ සාමාජිකත්වය දරන (ලංකාව හැර) යම් රටක නාවික බල හමුදාවල හෝ ඒවාට අයිති නැවෙක හෝ ඒ රටෙහි නාවික ආයතනයක නාවික හමුදාවේ අධිපතිගේ ආඥාවක් පරිදි සේවය කරමින් සිටින හෝ ඒ නැවට හෝ ඒ ආයතනයට වී යම් ගමනාන්තයක් කරා යාමේ බලාපොරොත්තුවෙන් හෝ යාමට වාහනයක් බලාපොරොත්තුවෙන් සිටින නාවික හමුදාවේ යම් නිලධාරියකු හෝ නාවිකයකු අණදීම හා විනය පිළිබඳ කාර්යයන් සඳහා ඒ රටේ නැව්වල හා නාවික බල හමුදාවලට එවකට අදාළව පවත්නා නීතිවලට හා සිරිත්වලට යටත් විය යුතුය

විදේශීය නාවික බල හමුදාවක් සමග සහයෝගය

**20.** (1) නාවික හමුදාව සම්පූර්ණයෙන් හෝ එහි යම් කොටස යම් විදේශීය නාවික බල හමුදාවක් සමග සහයෝගයෙන් ක්‍රියාකිරීමට අවශ්‍ය වුවහොත් ඒ විදේශීය බල හමුදාවේ අණදෙණ නිලධාරියා නාවික හමුදාවේ හෝ එහි එකි කොටසේ සියලුම නිලධාරීන්ට වඩා තනතුරින් ජ්‍යෙෂ්ඨ නම් ජනාධිපති විසින් නාවික හමුදාව හෝ එහි කොටස ඒ නිලධාරියාගේ අණ යටතේ තැබිය හැකිය

(2) ලංකාව ආරක්ෂා කිරීම සඳහා නාවික හමුදාවේ යම් නිලධාරියකු හෝ සුළු නිලධාරියකු යම් විදේශීය නාවික බල හමුදාවක් සමග සහයෝගයෙන් ක්‍රියා කරමින් සිටින අවස්ථාවක ඒ බල හමුදාවේ අණදෙන නිලධාරියාගේ එකගත්වය ඇතිව ඒ බල හමුදාවේ එකම හෝ සමාන තනතුරක් දරන සාමාජිකයකු සම්බන්ධයෙන් ඒ නිලධාරියාගේ හෝ සුළු නිලධාරියාගේ අණ දීම පිළිබඳ බලතල හා අග්‍රානුපිළිවෙළ ජනාධිපති විසින් නිරූපණය කළ හැකිය

නාවික නොවූ රාජකාරි ඉටු කිරීම

**21.** (1) මහජන යහපත සඳහා අවශ්‍ය යැයි ජනාධිපති විසින් සැලකිය හැකි නාවික නොවූ රාජකාරි ඉටු කරන ලෙස නාවික හමුදාවේ සියලුම සාමාජිකයන්ට හෝ සාමාජිකයන් කිසිවෙකුට ඔහු විසින් අණ කළ හැකි ය

(2) ජනාධිපතිගේ ආඥාවෙන් (1) වෙනි උපවගන්තය යටතේ තමන් වෙත පවරනු ලැබිය හැකි රාජකාරි නාවික හමුදාවේ සෑම නිලධාරියකු හෝ නාවිකයකු විසින් ම ඉටු කළ යුතු ය

## <u>පස්වන කොටස</u>
## <u>නාවික නීතියට යටත් තැනැත්තෝ</u>

නාවික නීතියට යටත් තැනැත්තා යන්නෙහි අර්ථය

**22.** මේ පනත පිළිබඳ කාර්යයන් සඳහා, නාවික නීතියට යටත් තැනැත්තා යන්නෙන් පහත දැක්වෙන වර්ග වලින් යමකට අයත් තැනැත්තෙක් අදහස් කෙරයි

(අ) ස්ථිර නාවික බල හමුදාවේ සියලුම නිලධාරීන් හා නාවිකයෝ

(ආ) ස්ථිර නාවික බල හමුදාවේ නිලධාරීන් හා නාවිකයන් ලෙස **3** වෙනි වගන්තියේ **(3)** වෙනි උපවගන්තිය යටතේ සලකනු ලබන ස්ථිර නාවික උපසේවයේ ස්වේච්ඡා නාවික බල හමුදාවේ හෝ ස්වේච්ඡා නාවික උපසේවයේ සියලු ම නිලධාරීන් හා නාවිකයෝ

(ඇ) මේ පනතේ විධි විධාන කිසිවක බලය ප්‍රකාර නාවික නීතියට යටත් තැනැත්තන් ලෙස සලකනු ලබන සියලුම තැනැත්තනෝ

නාවික සිරභාරයට යටත්වන තැනැත්තන්

**23.** යම් නාවික හෝ සිවිල් වරදක් කරන නාවික නීතියට යටත් තැනැත්තා නාවික සිරභාරයට ගත හැකිය

නාවික සිරභාරයට ගන්නා ලෙස අණ කළ හැකි තැනැත්තෝ

**24.** (1) නාවික නීතියට යටත් තැනැත්තකු වී සිටියදී යම් නාවික හෝ සිවිල් වරදක් කරන කණිෂ්ඨ නිලධාරියකු නාවික සිරභාරයට ගන්නා ලෙස ජ්‍යෙෂ්ඨ නිලධාරියකු විසින් අණ කළ හැකිය තවද නාවික නීතියට යටත් තැනැත්තකු වී සිටිය දි දබරයක කලහයක හෝ පෙරළියක යෙදී සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරියකු නාවික සිරභාරයට ගන්නා ලෙස කණිෂ්ඨ නිලධාරියකු විසින් අණ කළ හැකිය

(2) නාවික නීතියට යටත් තැනැත්තකු වී සිටිය දී යම් නාවික හෝ සිවිල් වරදක් කරන යම් නාවිකයකු නාවික සිරභාරයට ගන්නා ලෙස යම් නිලධාරියකු විසින් හෝ සුලු නිලධාරියකු විසින් අණ කළ හැකිය

සක්‍රිය සේවයෙහි යෙදී නොසිටින නිලධාරියකු හෝ නාවිකයකු නාවික සිරභාරයේ තැබීම

25. සක්‍රිය සේවයෙහි යෙදී නොසිටින යම් නිලධාරියකු හෝ නාවිකයකු නඩු විභාගයක් නොමැති ව සත් දවසකට වැඩි කාලයක් නාවික සිරභාරයේ තබනු ලැබූ අවස්ථාවක නාවික සිරභාරයේ සිටින තැනැත්තා යුධාධිකරණයකින් විනිශ්චයට භාජන කරනු ලැබිය යුතු නම් ඔහු නඩු විභාගය සඳහා ඉදිරිපත් කරනු ලබන තෙක් හෝ ඒ සිරභාරයෙන් නිදහස් ක්රනු ලබන තෙක් ඒ සිරභාරයේ තබා ගැනීමට ඇති අවශ්‍යකත්වය පිලිබඳ ලිඛිත වාර්තාවක් ඔහුගේ අණදෙන නිලධාරි වෙත සතිපතා ඉදිරිපත් කළ යුතුය

නඩු පැවරීමේ කාල සීමාව

26. අත් අඩංගුවට ගැනීමෙන් වැලකුණු හෝ නෛතික ග්‍රහණයෙන් මිදුණු වරදකරුවකු මිස නාවික නීතියට යටත් කිසි ම තැනැත්තකු විසින් කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් වරද සොයා ගනු ලැබූ දින සිට අවුරුදු තුනක් ඇතුලත හෝ එම කාලය ඇතුලත ශ්‍රී ලංකාවෙන් බැහැරව සිට ඇති අවස්ථාවක ඔහු ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමෙන් පසු අවුරුද්දක් ඇතුලත දී නඩු විභාගය නො පැවැත් වුවහොත් යුද්ධාධිකරණයක් විසින් හෝ මේ පනත යටතේ අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරියකු විසින් ඒ තැනැත්තා විනිශ්චයට හෝ දඩුවමට භාජන නො කළ යුතුය

නාවික නීතියට යටත්වීමෙන් වැලකුණු වරදකරුවන් පිලිබඳ නඩු විභාගය හා ඔවුන්ට දඩුවම් කිරීම

27. (1) නාවික නීතියට යටත් තැනැත්තු වරදක් කොට ඉක්බිති ඔහු නාවික නීතියට යටත්වවීමෙන් වැලකී සිටින අවස්ථාවෙක ඒ වරදට ඔහු නාවික නීතියට සිරභාරයට ගෙන තැබිය හැකි වන්නේත් විනිශ්චයට භාජනය කොට දඩුවම් කරනු ලැබිය හැකි වන්නේත් ඔහු නොකඩවාම නාවික නීතියට යටත් තැනැත්තු ලෙස සිටියේ නම් ඔහු සිරභාරයට ගෙන තබා විනිශ්චයට භාජන කොට දඩුවම් කළ හැකිව තිබුණු ආකාරයෙනි.

එසේ වුවද එම වරද සොයා ගැනීමේ දිනයෙන් පසුව අවුරුදු දෙකක කාලයක් ගතවීමෙන් පසු ඒ වරද හමුදා කැරැලි ගැසීමේ හෝ පැන යාමේ වරදක් වුවහොත් මිස ඒ වරද සම්බන්ධයෙන් ඔහු විනිශ්චයට භාජන නො කළ යුතුය.

(2) යුධාධිකරණයක් විසින් හෝ මේ පනත යටතේ අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරියකු විසින් නාවික නීතියට යටත් තැනැත්තු යම් වරදකට බන්ධනාගාරගත කිරීමට හෝ රඳවා තැබීමට නියම කරනු ලැබීමෙන් පසු ඔහු නාවික නීතියට යටත්වීමෙන් වැලකුණු අවස්ථාවක ඔහු බන්ධනාගාරගත කරනු ලැබූ හෝ රඳවා ගනු ලැබූ කාලය තුළ නොකඩ වා ම ඔහු නාවික නීතියට යටත් තැනැත්තු වී සිටි විටෙක මෙන් ඔහු සම්බන්ධයෙන් ක්‍රියා කළ හැකි ය.

## හයවන කොටස
## අණදෙන නිලධාරීන්ගේ අධිකරණ බලතල

හමුදාපතිවරයා විසින් හෝ අණදෙන නිලධාරීන් විසින් ලඝු කාර්ය පටිපාටිය අනුව වරදකරුවන් පිලිබඳව නඩු විභාග කිරීම

28. (1) යුද්ධාධිකරණයක් විසින් විභාග කළ යුතු බවට මේ පනත මගින් ප්‍රකාශිතවම නියම කර ඇති වරදක් සම්බන්ධයෙන් හැර ලුතිනන්වරුයෙකුගේ නිලය හෝ ඊට වඩා අඩු නිලයක් හෝ දරන නිලධරයකු මරණ දඩුවම දිය නොහැකි වරදකට චෝදනා ලැබ සිටින අවස්ථාවක දී චූදිතයා ලඝුකාර්ය පටිපාටිය අනුව නඩු විභාගයට කැමති ද නැතහොත් යුද්ධාධිකරණයක් මගින් නඩු විභාගයට කැමති ද යන්න නාවික හමුදාපතිවරයා විසින් හෝ

නාවික හමුදාපතිවරයා විසින් බලය පවරන ලද කපිතාන්වරයකුගේ නිලයට වඩා අඩු නොවන නිලයක නිලධරයකු විසින් හෝ චූදිතයාගෙන් විමසිය යුතු අතර යුද්ධාධිරකණයක් මගින් නඩුව විභාග කිරිමට චූදිතයා තෝරාගතහොත් එසේ යුද්ධාධිකරණයක් මගින් නඩුව විභාග කිරිමට පියවර ගත යුතු අතර ලඝුකාර්ය පටිපාටියට අනුව නඩුව විභාග කිරිමට ඔහු කැමති වුවහොත එසේ ලඝුකාර්ය පටිපාටිය අනුව නඩුව විභාග කිරිමට පියවර ගත යුතුය එසේ වුව ද එම නිලධරයාට නියම කළ හැකි දඩුවම ජ්‍යෙෂ්ඨත්වය නැති කිරිම හෝ දණ්ඩන ලැයිස්තුවේ තදබල කමින් අඩු දඩුවමක් හෝ විය යුතුය

(2) යුද්ධාධිකරණයකින් විසඳුමට මේ පනතින් ප්‍රකාශිතවම නියම කෙරෙන නඩුවලදි හැර තෙමසකට වැඩි කාලයක් බන්ධනාගාරගත කිරිමේ හෝ රදවා තැබිමේ බලය අණ දෙන නිලධාරියාට නොතිබිය යුතුය යන සිමාවට යටත් ව අණදෙන නිලධාරියකු විසින් මරණිය නොවන යම් වරදක් කරනු ලැබූ නාවිකයකු ලඝු නඩු විභාගයකට භාජනය කොට දඩුවම් කළ හැකිය

ලඝු කාර්ය පටිපාටිය කරණයක් විසින් හෝ නඩුව විභාග කිරිම තෝරාගැනිමට සුළු නිලධරයකු හෝ බලලත් නිලධරයකු වන වරදකරුවකුට ඇති අයිතිවාසිකම

**29**. විනයානුකූල වරදක් හෝ යුද්ධාධිකරණය විසින් විභාග කළ යුතු බවට මේ පනත මගින් ප්‍රකාශතිවම නියම කර ඇති වරදක් හැරමරණ දඩුවම දිය නොහැකි වරදක් සම්බන්ධයෙන් බලලත් නිලධරයකු හෝ සුළු නිලධරයකු හෝ චෝදනා ලැබ සිටින අවස්ථාවක දි ඔහු ලඝු කාර්ය පටිපාටිය අනුව නඩු විභායට කැමැති ද නැතහොත් යුද්ධාධිකරණයක් මගින් නඩු විභාගයට කැමැති ද යන්න් ඔහුගේ අණ දෙන නිලධරයා විසින් ඔහුගෙන් විමසිය යුතු අතර යුද්ධාධිකරණය මගින් නඩු විභාගය ඔහු විසින් තෝරා ගනු ලැබුවහොත් එම අණ දෙන නිලධරයා විසින් යුද්ධාධිකරණය මගින් එම නඩුව විභාග කිරිම සදහා පියවර ගනු ලැබිය යුතු ය

අණදෙන නිලධාරියාගේ අධිකරණ බලතල පවරා දිම

**30**. අණ දෙන නිලධාරියකු විසින් වරදකරුවකු හා ලඝු වශයෙන් කටයුතු කිරිමට තමාට ඇති බලය මේ පනත යටතේ ඒ සදහා පනවනු ලැබිය හැකි නියෝගවලට අනුකූලව තමන් යටතේ සිටින නිලධාරියකුට පවරා දිය හැකිය

ලඝු නඩු විභාග වලදි දිව්රුම් පිට හෝ සහතික ප්‍රකාශයක් පිට සාක්ෂි දිය යුතු බව

**31**. මේ පනත යටතේ අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරියකු විසින් පවත්වනු ලබන වරදකරුවකගේ ලඝු නඩු විභාගයක දි සැම සාක්ෂිකරුවා විසින් ම සාක්ෂි දිමට පෙර යුධාධිරණයක් ඉදිරියේ සාක්ෂිකරුවකු විසින් දිමට නියමිත දිවුරුම දිය යුතුය නැතහොත් සහතික ප්‍රකාශය ම කළ යුතුය

ලඝු නඩු විභාග වලදි නිතකෘත්‍ය සටහන් කිරිම

**32**. මේ පනත යටතේ අධිකරණ බලතල පාවිච්චි කොට වරද කරුවකු ලඝු වශයෙන් විභාගයකට භාජන කරන සැම නාවික නිලධාරියා විසින් ම නියම කරනු ලැබිය හැකි යම් නඩුවකදි හෝ අවස්ථාවක දි හැර නඩු විභාගයේ දි නිතිකෘත්‍ය පිළිබඳ කෙටි සටහනක් කළ යුතු ය

## හත්වන කොටස
## යුධාධිකරණ

යුද්ධාධිකරණ වල අධිකරණ බලතල

**33**. යම් නාවික හෝ සිවිල් වරදක් කරනු ලැබූ නාවික නිතියට යටත් නැත්තකු යුධාධිකරණයක් විසින් විභාගයකට භාජන කොට ඔහුට දඩුවම් පැමිණවිය හැකිය.

යුද්ධාධිකරණ පැවැත්විමට අණ කළ හැකි බලධාරියෝ

**34**. (1) ජනාධිපති විසින් හෝ ජනාධිපති විසින් බලය පවරනු ලැබිය හැකි නියෝජ්‍ය අණ දෙන්නාගේ තනතුරට වඩා පහත් නොවූ

තනතුරක් දරන නිලධාරියකු විසින් යුධාධිකරණයක් පවතවන ලෙස අණ කළ හැකි ය.

(2) තමාට වඩා තනතුරෙන් උසස් වූද සම්පූර්ණ පඩි පිට නාවික හමුදාවේ නැව් එකකට හෝ වැඩි ගණනකට අණ දෙන්නා වූද නිලධාරියකු යුධාධිකරණය පැවැත්වීමට නියමිත ස්ථානයේ සිටියහොත් යුධාධිකරණ පැවැත්වීම පිණිස අණ කිරීමට ජනාධිපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියකුට එසේ කිරීමේ බලය නො තිබිය යුතු ය එබඳු අවස්ථාවක දි මුලින් සඳහන් වන්නා වූ එ නිලධාරියාට ජනාධිපතිවරයා විසින් යුධාධිකරණයක් පැවැත්වීම පිණිස අණ කිරීමේ බලය පවරා නැති වුවද ඔහු විසින් කළ හැකිය.

(3) යුධාධිකරණ පැවැත්වීම පිණිස අණ කිරීමට ජනාධිපති විසින් බලය පවරනු ලැබූ නිලධාරියකුගේ අණ යටතේ නාවික බල ඇණියක් හෝ යුධ නෞකා ගණයක් විදේශවල තිබියදි ඔහු මිය ගිය අවස්ථාවක ආපසු ගෙන්වනු ලැබූ අවස්ථාවක සේවා ස්ථානයේන බැහැර ගිය අවස්ථාවක හෝ අණ දිමේ බලය ඔහු කෙරෙන් ඉවත් කරනු ලැබූ අවස්ථාවෙක ඒ නාවික බල ඇණියට හෝ යුධ නෞකා ගණයට එවකට අණ දෙමින් සිටි නිලධාරියාට ජනාධිපතිවරයාගේ කිසිදු බලපැවරීමක් නොමැතිව යුධාධිකරණ පැවැත්වීම පිණිස අණ කිරීම සම්බන්ධයෙන් පළමු කී නිලධාරියා වෙත පැවරී තිබූ බලය ම තිබිය යුතුය.

(4) තම අණ යටතේ නාවික බල ඇණියක් හෝ යුධ නෞකා ගණයක් විදේශවල ඇති යුධාධිකරණ පැවැත්වීම පිණිස අණ කිරීමට ජනාධිපති විසින් බලය පවරනු ලැබූ නිලධාරියකු විසින්

(අ) තමා ඒ නාවික බලඇණියෙන් හෝ යුධ නෞකා ගණයෙන් වෙන් වන අව්සථාවක ඒ නාවික බලඇණියේ හෝ යුධ නෞකා ගණයේ සිටින ඊලග ජ්‍යෙෂ්ඨ නිලධාරියා වෙතද

(ආ) තමා ඒ නාවික බලඇණියෝ හෝ යුධ නෞකා ගණයේ කණ්ඩායමට අන්‍ය සේවයක් පවරා දුන් අවස්ථාවක ඒ කණ්ඩායමේ එවකට අණ දෙන නිලධාරියා වෙතද

තමා ඒ නාවික බලඇණියෙන් හෝ යුධ නෞකා ගණයෙන් බැහැර ව සිටින කාලය තුළ දි හෝ ඒ කණ්ඩායම අන්‍ය සේවයක යෙදි සිටින කාලය තුළදි කාරණයට ගැළපෙන පරිදි යුධාධිකරණ පැවැත්වීම පිණිස අණ කිරීමේ බලය ලියවිල්ලකින් පවරා දිය හැකිය.

යුධාධිකරණ සංස්ථාපනය

**35**. (1) යුධාධිකරණයක් තුන් දෙනෙකුටය අඩු නොවූ ද නව දෙනෙකුට වැඩි නොවූ ද සාමජිකයන් ගණනකින් සමන්විත විය යුතුය

(2) යුධාධිකරණයක්

(අ) නාවික නීතියට යටත් තැනැත්තු රාජද්‍රෝහිවීමේ මිනිමැරීමේ හෝ ස්ත්‍රී දූෂණය කිරීමේ වරද සම්බන්ධයෙන් විභාගයකට භාජන කිරීම පිණිස කැඳවනු ලැබූ අවස්ථාවක එය සාමාජිකයන් පස් දෙනෙකුට අඩු නොවූ ගණනකින් ද

(ආ) නාවික නීතියට යටත් තැනැත්තු වෙන යම් වරදක් සම්බන්ධයෙන් විභාගයකට භාජන කිරීම පිණිස කැඳවනු

ලැබූ අවස්ථාවක එය සාමාජිකයන් තුන් දෙනෙකුට අඩු නොවූ ගණනකින් ද සමන්විත විය යුතුය.

(3) කොමාන්ඩර්වරයකු ලුතිනන් කොමාන්ඩර්වරයකු හෝ ලුතිනන් වරයකු යුධාධිකරණයක සාමාජිකයකු වූ අවස්ථාවක යුධාධිකරණයේ සාමාජිකයන් ගණන පහට වැඩි නොවිය යුතුය.

(4) විසි එක් වියට පැමිණ සිටින නාවික හමුදාවේ ධජ නිලධාරියකු කපිතාන් කොමාන්ඩර් ලුතිනන් කොමාන්ඩර් හෝ ලුතිනන්වරයකු හෝ ශ්‍රී ලංකා යුධ හමුදාව හෝ ගුවන් හමුදාවේ සමාන නිලයන් දරණ තැනැත්තකු මිස වෙන කිසිම තැනැත්තකද යුධාධිකරණ සාමාජියකු වීමට සුදුසු නොවිය යුතුය.

(5) යුධාධිකරණ සාමාජිකයන් නාවික හමුදාවේ නිලධාරින්ගෙන් හා යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නිලධාරින්ගෙන් සමන්විත වූ අවස්ථාවක ඒ සාමාජිකයන් අතර සිටින යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ සැම නිලධාරින් දෙදෙනාටම නාවික හමුදාවෙන් එක් නිලධාරියකුට අඩු නොවූ ගණනක් සිටිය යුතුය.

(6) පහත සඳහන් තැනැත්තන් යුධාධිකරණයක සාමාජිකයන් නොවිය යුතුය.

- (අ) වරදකරුවා විනිශ්චය සඳහා ඉදිරිපත් කරනු ලැබීමට හේතු වූ චෝදනාව විමර්ශණය කළ නිලධාරියා
- (ආ) යුධාධිකරණ පැවැත්වීමට අණ කළ නිලධාරියා
- (ඇ) වරදකරුවාගේ අණ දෙන නිලධාරියා
- (ඈ) චෝදකයා
- (ඉ) පැමිණිලි පක්ෂයේ යම් සාක්ෂිකරුවකු

(7) තමාට වඩා තනතුරෙන් උසස් වූද යුද්ධාධිරකණයේ සභාපතිට වඩා කණිෂ්ඨ වූද නිලධාරින් හතර දෙනෙකු යුදධාධිකරණය පවත්වනු ලබන ස්ථානයේදි රැස් කර ගත හැකි වූ විට කිසිම කොමාන්ඩර්වරයකු ලුතිනන් කොමාන්ඩර්වරයකු ලුතිනන් වරයකු යුද්ධාධිකරණයක සාමාජිකයකු වීම අවශ්‍ය විය යුතු නොවේ (එහෙත් යම් අවස්ථාවක කොමාන්ඩර්වරයකු ලුතිනන් කොමාන්ඩර්වරයකු හෝ ලුතිනන් වරයකු එහි සාමාජිකයකු වීම අවශ්‍ය වූ පමණින් ම හෝ සාමාජිකයකු වූ පමණින් ම යුද්ධාධිකරණයක හෝ එහි නීති කෘත්‍යවල විධිමත් කමට හෝ වලංගු භාවයට හානියක් නොවිය යුතුය.

(8) යුද්ධාධිකරණය පැවැත්වීමට අණ කරන බලධරයා විසින් හෝ ඒ බලධාරියා විසින් බලය පවරනු ලැබූ නිලධාරියකු විසින් යුධාධිකරණයක් සභාපති නම් කළ යුතු අතර යුධාධිකරණයේ අනෙක් සාමාජිකයන් යුද්ධාධිකරණය නියම කරන බලධරයා විසින් නම් කරනු ලැබිය හැකිය.

(9) ධජ නිලධාරියකු සභාපති වශයෙන් ද කපිතන් තනතුර හෝ ඊට වඩා උසස් තනතුරක් දරන්නන් යුද්ධාකරිණයේ සෙසු සාමාජිකයන් වශයෙන් ද ඇතිව මිස ධජ නිලධාරියකුගේ නඩු විභාගයක් සඳහා කිසි ම යුද්ධාධිකරණයක් යථා පරිද්දෙන් සංස්ථාපනය නොවිය යුතුය.

(10) කපිතාන්වරයකු හෝ ඊට වඩා උසස් වූවකු සභාපති වශයෙන්ද කොමාන්ඩර් හෝ තනතුරින් ඊට වඩා උසස් නිලධාරින් යුද්ධාධිකරණයේ සෙසු සාමාජිකයන් වශයෙක් ද ඇතිව මිස

කපිතාන්වරයකුගේ නඩු විභාගයක් සඳහා කිසි යුද්ධාධිකරණයක් යථා පරිද්දෙන් සංස්ථාපනය නොවිය යුතුය.

(11) කපිතාන්වරයකුට වඩා තනතුරින් පහත් තැනැත්තකුගේ නඩු විභාගයක් සඳහා වූ යුද්ධාධිකරණයක සභාපති හැටියට කපිතාන්වරයකු හෝ තනතුරින් ඊට වඩා උසස් වුවක ද විභාගයකට භාජන කරනු ලැබීමට සිටින තැනැත්තා කොමාන්ඩර් තනතුරක් දරන්නකු වුවහොත් යුද්ධාධිකරණයේ සභාපතිට අතිරේකව කොමාන්ඩර් තනතුර හෝ ඊට වඩා උසස් තනතුරක් දරණ තවත් සාමාජිකයන් දෙදෙනකු ද ඇතිව මිස කිසිම යුද්ධාධිකරණයකත් යථා පරිද්දේන් සංස්ථිාපනය නොවිය යුතුය.

(12) මේ වගන්තයේ අනෙක් විධිවිධානවලට යටත්ව යුද්ධාධිකරණයක් පැවැත්වීමට ඇති විට යුද්ධාධිකරන්‍ය නියම කරන බලධරයා විසින් අනෙක් සාමාජිකයන් නම් කරනු ලැබ ඇත්නම් මිස එහිද සභාපති ධූරය දැරීමට පත් කර ඇති නිලධාරියා විසින් යුද්ධාධිකරණය පැවැත්වීමට ඇති ස්ථානයට පැමිණ සිටින නිලධාරීන් අතර ජ්‍යෙෂ්ඨතාව අනුව තමා ළඟම වූ තැනැත්තන්ගෙන් යුද්ධාධිකරණයේ සාමාජිකයන් වීම සඳහා අවශ්‍ය වූ ගණන කැඳවිය යුතුය.

**යුද්ධාධිකරණ පැවැත්විය යුතු ස්ථාන**

**36**. යුද්ධාධිකරණය පැවැත්වීමට අණ කරන තැනැත්තා විසින් තීරණය කරනු ලබන පහසු ස්ථානයක දී යුද්ධාධිකරණයක් පැවැත්විය යුතුය.

**යුද්ධාධිකරණ පැවැත්වීම**

**37**. යුද්ධාධිකරණයක් අඩාල වී කල් තැබීම යෝග්‍ය යයි යුද්ධාධිකරණයට පෙනී ගියහොත් දවස් හයකට වැඩි නොවන කාලයක් එය අඩාල ව කල් තැබිය හැකිය එහෙත් එබඳු අඩාල ව කල් තැබීමක් කිරීමට අණ කරනු ලැබුව හොත් මිස යුද්ධාධිකරණයක් පැවැත්වීම කාලගුණයේ බලපෑමක් නිසා හෝ මග හැරිය නොහැකි හදිසි අනතුරක් නිසා නො වැළැක්විණි නම් දණ්ඩනය නියම කරනු ලබන තුරු 1971 අංක 29 දරණ නිවාඩු පනතේ අර්ථානුකූලව රජයේ නිවාඩු දිනයන්හි දී හැර දවසින් දවස එය පැවැත්විය යුතුය යුද්ධාධිකරණයක යම් සාමාජිකයකු නො පැමිණීමේ ප්‍රතිඵලයක් වශයෙන් මේ පනත යටතේ යුද්ධාධිකරණයක් සංස්ථාපනය කිරීම පිණිස වූ උවමනා කෙරෙන අවම වූ සමාජික සංඛ්‍යාව පැමිණි නො සිටිය හොත් මිස යුද්ධාධිකරණයේ යම් සාමාජිකයකු නො පැමිණීම හේතු කොට ගෙන එහි නීති කාත්‍ය ප්‍රමාද නො කළ යුතුය එසේ වුවද යම් යුධාධිකරණයක පැවැත්වුණ යම් නඩු කටයුත්තක් රජයේ නිවාඩු දිනයක පැවැත්වීමේ හේතුව මත පමණක් එම නඩු කටයුත්තේ වලංගුභාවයට බලපෑමක් සිදු නොවිය යුතුය.

**විනිශ්චයකාර අධිනීතිඥයා පත්කිරීම**

**38**. (1) යුද්ධාධිකරණයක් පැවැත්වීම පිණිස අණ කරන බලධාරියා විසින් යුධාධිකරණවල කාය්‍යීය පරිපාටිය ද නීතිය පිළිබඳ සාමාන්‍ය ප්‍රතිපත්තිය හා සාක්ෂි නීති ද ගැන සෑහෙන දැනීමක් ඇති තැනැත්තකු යුධාධිකරණයේ විනිශ්චයකාර අධිනීතිඥයා ලෙස කටයුතු කිරීමට පත් කළ යුතුය.

(2) මේ පනත යටතේ යුධාධිකරණයක සාමාජිකයකු වීමට නුසුදුසු තැනැත්තකු එ යුධාධිකරණයේ විනිශ්චයකාර අධිනීතිඥයා ලෙස කටයුතු කිරීමට පත් නො කළ යුතුය.

**විනිශ්චයකාර අධිනීතිඥයාගේ යුතුකම්**

**39**. යුධාධිකරණයක විනිශ්චයකාර අධිනීතිඥයා සතු බලතල හා යුතුකම් පහත දැක්වෙන පරිදි විය යුතුය.

(අ) ඔහුගේ පත්විමෙන් පසු යම් විටකදි නිතිකෘත්‍යවලට පෙර වුවත් නිතිකෘත්‍ය අතරතුරේ දි වුවත් චෝදනාව හෝ නඩු විභාගය සම්බන්ධ නිති ප්‍රශ්ණ හෝ කාය්‍ය පරිපාටිය පිළිබඳව උපදෙස් ලබා ගැනිමට හිමිකම් ඇත්තන් වෙතැ යි මෙයින් ප්‍රකාශයට පමුණුවනු ලබන චෝදකයාටත් විත්තිකරුවාටත් ඒ උපදෙස් දිම ඔහු සතු යුතුකම විය යුතුය. එසේ වුව ද නිති කෘත්‍ය අතරතුරේදි ඔහු විසින් ඒ උපදෙස් දිය යුත්තේ යුධාධිකරණයෙන් කලින් ලබාගත් අවසර ඇති වය

(ආ) නිතිකෘත්‍යවල යම් විධිහිනතාවකට යුධාධිකරණයේ අවධානය යොමු කරවිම ඔහු සතු යුතුකම විය යුතුය තම අදහස් විමසුවත් නැතත් චෝදනාවෙහි හෝ යුධාධිකරණ සංස්ථාපනයෙහි යම් දෝෂයක් ගැන යුධාධිකරණයටද යුධාධිකරණය පැවැත්විම පිණිස අණ කොට ඇති බලධාරියාටද ඔහු විසින් දැනුම් දිය යුතු ය තවද ඔහු විසින් යුධාධිකරණයඉදිරියේ යම් කරුණක් සම්බන්ධයෙන් තම උපදෙස් දිය යුතුය.

(ඇ) සාක්ෂිකරුවන්ගෙන් ප්‍රශ්න හෝ හරස් ප්‍රශ්න ඇසීමට හෝ පැහැදිලි ලෙස සාක්ෂි දීමට යම් අපොහොසත්කම් ඇතිවිමේ ප්‍රතිඵලයක් වශයෙන් විත්තිකරුවාට කිසි අවාසියක් නොවන ලෙස වග බලා ගැනිමෙහි ලා අවශ්‍ය විය හැකි සියලු ම ක්‍රියා ඔහු විසින් කළ යුතුය තවද ඔහු විසින් ඒ කාර්යය සඳහා යුධාධිකරණයේ අවසර ඇති ව අදාළ වූ යම් කරුණක් සම්බන්ධයෙන් යම් සාක්ෂිකරුවකුගෙන් ප්‍රශ්න ඇසිය හැකිය.

(ඈ) නඩුව අවසානයේදි සාක්ෂි පිඩු කිරිම ඔහුත් යුධාධිකරණයත් යන දෙපක්ෂය විසින් ම අනවශ්‍ය ය යි සැලකුවහොත් මිස ඔහු විසින් එය කළ යුතු වන අතර යුධාධිකරණය එහි තීරණ විචාරණය කර ගෙන යාමට පෙර නඩුවට සම්බන්ධ නීතිය පිළිබඳ ව යුධාධිකරණයට උපදෙස් දිය යුතුය.

**යුද්ධාධිකරණයේ සාමාජිකයන් විනිශ්වයකාර අධි නීතිඥයා සහ සාක්ෂිකරුවන් විසින් දිය යුතු දිවුරුම් හෝ කළයුතු සහතික ප්‍රකාශය**

40. (1) නඩුවක විභාගය ආරම්භ කිරිමට පෙර යුධාධිකරණයක සෑම සාමාජිකයකු විසින් ම හා විනිශ්වයකාර අධිනීතිඥයා විසින් නියමිත දිවුරුම දිය යුතුය නැතහොත් නියමිත සහතික ප්‍රකාශනය කළ යුතුය.

(2) යුධාධිකරණයක් ඉදිරිපිට දි සෑම සාක්ෂිකරුවා විසින් ම තම සාක්ෂිය ආරම්භ කිරිමට පෙර නියමිත දිවුරුම දිය යුතුය නැතහොත් නියමිත සහතික ප්‍රකාශය කළ යුතුය.

**විත්තිකරුවා විසින් යුද්ධාධිකරණයේ සාමාජිකයන්ට විරුද්ධකම් දැක්විම**

41. (1) යුධාධිකරණයක සාමාජිකයන් දිව්රුම් දිමට හෝ සහතික ප්‍රකාශය කිරිමට පෙර එහි සාමාජිකයන්ගේ නම් විත්තිකරුවාට ඇසෙන සේ කියවයි යුතුය තවද විත්තිකරුවා ඒ යම් සාමාජිකයකුට විරුද්ධ වන්නේදයි ඔහුගෙන් ඇසිය යුතු ය මෙහි මින් මතු විධි විධාන යොදනු ලබන පරිදි එබඳු යම් සාමාජිකයකුට විරුධතාවයක් දැක්විම නිසා ඔහු අස් ව යාමේ දි අස්වන සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්තිකයකු පත් කරනු ලැබූ අවස්ථාවක අනුප්‍රාප්තික සාමාජිකයාට විත්තිකරුවා විරුද්ධ වන්නේ දැයි ඔහුගෙන් ඇසිය යුතුය.

(2) විත්තිකරුවා විසින් සාධාරණ විරුධතාවයක් දැක්විය නො හැකි නිලධාරින්ගෙන් යුධාධිකරණය සංස්ථාපනය කරනු ලැබිය හැකි වන සේ යුධාධිකරණයේ සේවය කිරිම පිණිස මුලින් ම පත් කරනු ලැබුවත් විරුද්ධතාවයක් දක්වනු ලැබූ සාමාජිකයකු අස් ව

යාම නිසා ඇතිවුණු පුරප්පාඩුවක් පිරවීම පිණිස පත් කරනු ලැබුවත් යුධාධිකරණයේ සභාපති ඇතුළු යම් සාමාජිකයකුට විත්තිකරුවා විසින් යම් සාධාරණ හේතුවක් පිට විරුද්ධකමක් දැක්විය හැකි ය.

**(3)** යුධාධිකරණයක යම් සාමාජිකයකුට විත්තිකරුවා දක්වන විරුධතාවයක් ගැන තීරණය කිරිම සඳහා එය යුධාධිකරණයේ සෙසු සාමාජිකයන් වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) විත්තිකරුවා යුධාධිකරණයක සභාපතිට දක්වා ඇති විරුධතාවයක් යුධාධිකරණයේ සෙසු සාමාජිකයන්ගෙන් තුනෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් විසින් පිළිගනු ලැබුවහොත් ඊට ඉඩ දිය යුතු ය තදනන්තර ව වෙන සභාපතිවරයකු පත් කිරිමේ කාය්‍යය සඳහා යුධාධිකරණය අඩාල ව කල් තැබිය යුතු ය.

(5) විත්තිකරුවා යුධාධිකරණයක සභාපතිට දක්වා ඇති විරුධතාවයක ඉඩ දෙනු ලැබූ අවස්ථාවක යුධාධිකරණය පැවැත්වීමට අණ කළ බලධාරියා විසින් වෙන නිලධාරියකු සභාපති හැටියට පත් කළ යුතුය ඒ නිලධාරියාට විරුද්ධ වීමට විත්තිකරුවා සතු හිමිකමට යටත් ව ඔහු සභාපති වශයෙන් ක්‍රියා කළ යුතුය.

(6) යුධාධිකරණයක සභාපතිට හැර වෙන සාමාජිකයකුට විත්තිකරුවා දක්වා ඇති විරුධතාවයක් යුධාධිකරණයේ සෙසු සාමාජිකයනගෙන් අඩක් හෝ ඊට වැඩි ගණනක් විසින් පිළිගනු ලැබුවහොත් ඊට ඉඩ දිය යුතු වන අතර විරුධතාවය දක්වනු ලැබූ සාමාජිකයා අස් විය යුතු ය තවද යුධාධිකරණය පැවැත්වීමට අණ කළ බලධාරියා විසින් අස් ව යන සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්තිකයකු පත් කළ යුත්තේ විරුධවීමෙහි ලා විත්තිකරුවාට ඇති හිමිකමට යටත් ව ය.

යුද්ධාධිකරණ විසුරුවා හැරිම

42. (1) නඩුවක විභාගය ඇරඹීමෙන් පසු මරණය හේතු කොට ගෙන හෝ අන් ලෙසකින් යුධාධිකරණයක සාමාජික සංඛ්‍යාව මේ පනත යටතේ යුධාධිකරණය සංස්ථාපනය කිරිම සඳහා නියමිත අවම වූ සාමාජික සංඛ්‍යාවට වඩා අඩු වූ අවස්ථාවක යුධාධිකරණය විසුරුවා හැරිය යුතු ය.

(2) නඩුවක විභාගය ඇරඹීමෙන් පසු යුධාධිකරණයක සභාපති මිය ගිය අවස්ථාවක හෝ අන් ලෙසකින් ඔහුට යුධාධිකරණයට පැමිණිය නොහැකි වූ අවස්ථාවක යුධාධිකරණයේ සාමාජික සංඛ්‍යාව මේ පනත යටතේ යුධාධිකරණය සංස්ථාපනය කිරිම සඳහා නියමිත අවම වූ සාමාජික සංඛ්‍යාවට වඩා අඩු නොවූ විට යුධාධිකරණය පැවැත්වීමට අණ කළ බලධාරියා විසින් යුධාධිකරණයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු සෑහෙන තනතුරක් දරන්නකු වුවහොත් ඔහු සභාපත වශයෙන් පත් කළ හැකි ය යළි නඩු විභාගය එපරිද්දෙන් ම කරගෙන යා යුතු ය එහෙත් ඔහු සෑහෙන තනතුරක් දරන්නකු නොවුවහොත් යුධාධිකරණය විසුරුවා හැරිය යුතු ය.

**(3)** යුධාධිකරණයක විනිශ්චයකාර අධිනීතිඥයා මිය ගිය අවස්ථාවක හෝ අසනිපවීම හො වෙන යම් හේතුවක් නිසා යුධාධිකරණයට පැමිණිය නො හැකි වූ අවස්ථාවක යුධාධිකරණය අඩාල ව කල් තැබිය යුතු වූ අතර සභාපති විසින් යුධාධිකරණය පැවැත්විම පිණිස අණ කළ බලධාරියා වෙත කරුණු වාර්තා කළ යුතු ය තවද විනිශ්චයකාර අධිනීතිඥයාගේ මරණය සිදු වූ

අවස්ථාවක හෝ යුධාධිකරණය පැවැත්වීමට අණ කළ බලධරියා විසින් යුධාධිකරණයට පැමිණිය නො හැකි වූ විනිශ්චයාකාර අධිනීතිඥයාට එසේ කළ හැකි වන තෙක් නඩු විභාගය ප්‍රමාද කිරීම අයෝග්‍යය යන මතය දරණ අවස්ථාවක යුධාධිකරණය විසුරුවා හැරිය යුතුය.

(4) යුධාධිකරණය මගින් පැවැත්වෙන විත්තිකරුවකුගේ නඩු විභාගය විත්තිකරුවා අසනීපවීම නිසා සැහෙන කලක් ඇතුළත පවත්වා ගෙන යා හැකි නොවූ අවස්ථාවක කරුණු සියල්ල ගැන ම සලකා බලා යුධාධිකරණය විසුරුවා හැරිය යුතු ය.

(5) විත්තිකරුවකුගේ නඩු විභාගය සඳහා රැස් වූ යුධාධිකරණයක් ඉහත සඳහන් උපවගන්ති කිසිවක් යටතේ විසුරුවා හරිනු ලැබූ අවස්ථාවක 26 වෙනි වගන්තියේ විධිවිධානවලට හානියක් නොවන පරිදි වෙන යුධාධිකරණයක් මගින් විත්තිකරුවා නැවත විභාගයකට භාජන කළ හැකිය.

යුද්ධාධිකරණයක් ඉදිරියේ වූ ප්‍රශ්න විසඳන ආකාරය

43. යුධාධිකරණයක් ඉදිරියේ ඇති සෑම ප්‍රශ්ණයක් ම යුධාධිකරණයේ සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් තීරණය කළ යුතු ය යම් නඩුවක තීරණ පිළිබඳ ප්‍රශ්නයේ දී යුධාධිකරණයක සාමාජිකයන්ගේ ඡන්ද සම වූ අවස්ථාවක ඒ නඩුවේ විත්තිකරුවා නිදහස් කළ යුතු බව සැලකිය යුතු ය යම් නඩුවක දණ්ඩන නියමයේ දී හෝ යම් නඩුවක් ඇසීම අරඹීමෙන් පසු උද්ගත වන තීරණය පිළිබඳ ප්‍රශ්නයේ දි හැර වෙන යම් ප්‍රශ්නයක දි යුධාධිකරණයක සාමාජිකයන්ගේ ඡන්ද සම වූ අවස්ථාවක සභාපතිට තීරක ඡන්දයක් තිබිය යුතුය.

කරුණාව දැක්වීමට නිර්දේශ කිරීම

44. දණ්ඩනයවට නියම වූ තැනැත්තකුට කරුණාව දක්වන ලෙස යුධාධිකරණයක් විසින් නිර්දේශ කරනු ලැබූ අවස්ථාවක ඒ නිර්දේශය යුද්ධාධිකරණයේ නිති කෘත්‍යවලට අමුණා ඒවායේ ම කොටසක් ලෙස තිබිය යුතුය තව ද එය ප්‍රසිද්ධ කොට තීරණය හා දණ්ඩන නියමයත් සමග ඒ තැනැත්තා වෙත යැවිය යුතු ය.

යුද්ධාධිකරණයක් පැවැත්වෙන ස්ථානයේ සිටින තැනැත්තන් එතැනින් ඉවත් කිරීමට අණකිරීමේ බලය

45. යුද්ධාධිකරණයක සාමාජිකයන් අතර යම් විචාරණයක් ඇති වූ අවස්ථාවක යුද්ධාධිකරණයේ සභාපති විසින් යුද්ධාධිකරණය පවත්වනු ලබන ස්ථානය සෙසු සියලු ම තැනැත්තන්ගෙන් තොර කරවිය හැකි ය.

වරදකින් නිදහස් කිරීමේ හෝ වරදකට වරදකරු කිරීමේ ප්‍රතිඵලය

46. (අ) යුද්ධාධිකරණයක් විසින් හෝ බලය ඇති සිවිල් අධිකරණයක් විසින් යම් වරදක් සම්බන්ධයේන තැනැත්තකු කලින් ම නිදහස් කරනු ලැබූ හෝ ඒ වරදට වරදකරු කරනු ලැබ සිටියහොත් හෝ

(ආ) මේ පනත යටතේ අධිකරණ බලපළ පාවිච්චි කරන නාවික නිලධාරියකු විසින් ඒ වරද සම්බන්ධයෙන් ඔහුට විරුද්ධ ව තිබූ චෝදනාව නිෂ්ප්‍රභ කොට හෝ ඒ වරද සඳහා ඔහු සම්බන්ධයෙන් ලඝු නඩු විභාගයකින් ක්‍රියා කරනු ලැබුවහොත් ඔහු යුද්ධාධිකරණයක් විසින් විභාගයකට භාජන නො කළ යුතු ය.

ඔප්පු වූ වරද චෝදනා ලැබූ වරදෙහි ඇතුළත් ව ඇති අවස්ථා

47. වරදක් සම්බන්ධයෙන් යුද්ධාධිකරණයක් ඉදිරියේ තැනැත්තකු චෝදනා ලැබ සිටිය දි එය සුළු වරදක් බවට පත් කෙරෙන කරුණු ඔප්පුවූ අවස්ථාවක ඔහු චෝදනා ලැබූයේ සුළු වරදක් සම්බන්ධයෙන් නො වුව ද එයට ඔහු වරදකරු කළ හැකි ය.

සිහි විකල වූ විත්තිකරුවා

48. (1) විත්තිකරුවකු සිහි විකල ව සිටින බවත් ඒ හේතු කොට ගෙන ඔහුගේ නිදහසට කරුණු කීමට අපොහොසත් ව සිටින බවත් යුද්ධාධිකරණයට පෙනී ගිය අවස්ථාවක යුද්ධාධිකරණය විසින් ඔහුගේ සිහිවිකලවීම සහ අපොහොසත්කම පිළිබඳ ප්‍රකාශිත තීරණයක් සටහන් කළ යුතුය ඒ සම්බන්ධයෙන් ජනාධිපතිගේ නියම ලැබෙන තෙක් හෝ ඉන් පෙර තම නඩු විභාගයට පෙනී සිටීමට යම් සුදුසු අවස්ථාවක් එළඹෙන තෙක් ඔහු සිරභාරයේ තැබිය යුතු ය.

(2) යුද්ධාධිකරණයක් විසින් විත්තිකරුවකුගේ නඩු විභාගය පැවැත්වීමේදී චෝදනා ලැබූ ක්‍රියාව හෝ නොකර හැරම ඔහු විසින් කර ඇති බව ද එහෙත් ඒ ක්‍රියාව හෝ නොකර හැරීම වූ කාලයේ දී ඔහු සිහි විකල ව සිටි බව ද පෙනී ගිය අවස්ථාවක ඔහු ඒ ක්‍රියාවට හෝ නොකර හැරීමට වරදකරු වූයේ වී නමුත් ඒ ක්‍රියාව හෝ නොකර හැරීම කළ කාලයේ දී ඔහු සිහි විකල ව සිටි බවට යුද්ධාධිකරණය විසින් ප්‍රකාශිත තීරණයක් සටහන් කළ යුතු ය තවද ඒ සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගේ නියම ලැබෙන තෙක් ඔහු සිරභාරයේ තැබිය යුතු ය.

(3) විත්තිකරුවකු සිහි විකල ව සිටින්නේ ය යි මේ වගන්තිය යටතේ යුද්ධාධිකරණයක් විසින් ප්‍රකාශිත තීරණයක් සටහන් කරනු ලැබූ අවස්ථාවක ජනාධිපතිවරයා විසින් යෝග්‍ය යැයි සිතන තැනෙක යෝග්‍ය යැයි සිතන ආකාරයකින් තමා කැමැති තාක් කල් විත්තිකරුවා සුරක්ෂිත ව සිරභාරයේ තබන ලෙස ආඥා කළ හැකි ය.

ඉහත දි කළ වරදක් සම්බන්ධ යෙන් දණ්ඩනයට නියම ව සිටින වරදකරුවකු බන්ධනාගාර ගත කිරීම හෝ රඳවා තැබීම

49. ඉහත දි කළ වරදක් සම්බන්ධයෙන් මේ පනත යටතේ බන්ධනාගාර ගත කිරීමේ හෝ රඳවා තැබීමේ දණ්ඩනයට කලින් ම නියම ව සිටින තැනැත්තතු යුධාධිකරණයක් විසින් වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක ඔහුට කලින් නියම කරනු ලැබූ බන්ධනාගාරගත කිරීමේ හෝ රඳවාතැබීමේ වාරය ඉකුත්වීමේදී ආරම්භ වන ලෙස බන්ධනාගාරගත කිරීමේ හෝ රඳවා තැබීමේ දණ්ඩනයක් යුද්ධාධිකරණය විසින් නියම කළ හැකි ය එහෙත් අන් ලෙසකින් නියම කළ හැකි ඒ දඬුවම්වලින් යම් දඬුවමක වාරයට වඩා බන්ධනාගාරගත කිරීමේ හො රඳවා තැබීමේ වාර මුළුල්ල වැඩි විය හැකිය.

එසේ වුව ද තැනැත්තකු පිට පිට ම අවුරුදු තුනකට වැඩි වූ වාර මුළුල්ලක් බන්ධනාගාරගත කැරවීමට හෝ රඳවා තැබීමට මේ වගන්තියෙහි ඇතුළත් කිසිවක් හේතු විය යුතු නොවන අතර ඔහුගේ දණ්ඩනයේ මුළු වාරය ඒ කාල සීමාවට වඩා දීර්ඝ වන ප්‍රමාණයක් මේ වගන්තිය අනුව දණ්ඩන නියමයක් මගින් තැනැත්තකුට පනවනු ලබන යම් බන්ධනාගාරගත කිරමේ හෝ රඳවා තැබීමේ වාරයකින් අඩු කළ යුතු බව සැලකිය යුතුය.

යුද්ධාධිකරණයක පෙනී සිටින අධිනීතිඥයා

50. (1) යුද්ධාධිකරණයක් ඉදිරියේ පැවැත්වෙන සියලුම නීති කෘත්‍ය වල දි පැමිණිල පක්ෂයට මෙන් ම විත්ති පක්ෂයට ද අධිනිතිඥයකුගේ මාර්ගයෙන් පෙනී සිටීමේ හිමිකම තිබිය යුතුය.

(2) පැමිණිලි පක්ෂය හෝ විත්ති පක්ෂය වෙනුවෙන් යුද්ධාධිකරණයක පෙනී සිටින අධිනිතිඥයෙකුගේ හැසිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන විධිවිධාන බල පැ යුතු ය.

(අ) සිවිල් අධිකරණයක් ඉදිරියේ නම් දෝෂ දර්ශනයට යටත් විය හැකි හෝ අධිකරණයට අපහාස කිරීමක් විය හැකි අධිනීතිඥයකුගේ යම් හැසිරීමක් යුද්ධාධිකරණයක් ඉදිරියේ වුව ද එපරිද්දෙන් ම දෝෂ දර්ශනයට යටත් විය හැකි බව හෝ යුද්ධාධිකරණයට අපහාස කිරීමක් විය හැකි බව සැලකිය යුතුය.

(ආ) යුද්ධාධිකරණයක් ඉදිරියේ පෙනී සිටින අධිනීතිඥයෙකු ගේ යම් හැසිරීමක් දෝෂ දර්ශනයට යටත් වූ බව හෝ යුද්ධාධිකරණයට අපහාස කිරීමක් වූ බව සලකනු ලැබූ අවස්ථාවක යුද්ධාධිකරණයේ සභාපති විසින් එකී අධිනීතිඥයාගේ ඒ හැසිරීම ගැන ශ්‍රේෂ්ඨාධිකරණය වෙත තම අත්සනින් සහතික කොට ලියා දැන්විය හැකි ය. එවිට ඒ අධිකරණය විසින් ඒ අධිකරණය ඉදිරියේ එබඳු හැසිරීමක් වූවහොත් කටයුතු කළ හැකි ආකාරයෙන්ම ඒ අධිනීතිඥයා සම්බන්ධයෙන් කටයුතු කළ හැකිය.

(ඇ) යුද්ධාධිකරණයක් ඉදිරියේ පෙනී සිටින අධිනීතිඥයකුගේ යම් හැසිරීමක් දෝෂ දර්ශනයට යටත් වූ බව හෝ යුද්ධාධිකරණයට අපහාස කිරීමක් වූ බව සලකනු ලැබූ අවස්ථාවක යුද්ධාධිකරණයේ සභාපති විසින් ඔහුට ඇහුම්කන් දීම ප්‍රතික්ෂේප කරන ලෙස අණ කළ හැකි අතර වෙන අධිනීතිඥයකුගේ සේවය ලබා ගත හැකි වනු පිණිස නීතිකෘත්‍ය අඩාල ව කල් තැබිය හැකිය.

**යුද්ධාධිකරණයක නීති කෘත්‍ය පිළිබඳ වාර්තාව**

51. යුද්ධාධිකරණයක විනිශ්චයකාර අධිනීතිඥයා විසින් හැකි පමණ කඩිනමින් මූලික නීතිකෘත්‍ය හෝ ඒවායේ සම්පූර්ණවූත් සහතික කළාවූත් පිටපතක් ද යුධාධිකරණයේ මූලික දණ්ඩන නියමවල් ද නාවික හමුදාධිපති වෙත යැවිය යුතු අතර නාවික හමුදාධිපති විසින් ඒවා ස්ථිර ලේකම් වෙත යැවිය යුතු ය.

**යුද්ධාධිකරණයක විසින් විභාගයකට භාජන කරුණු තැනැත්තකුට නීතිකෘත්‍යවල පිටපතක් ගැනීමට ඇති හිමිකම**

52. (1) යුද්ධාධිකරණයකින් විභාගයකට භාජන කෙරුණු තැනැත්තකුට ඒ යුධාධිකරණයේ නීතිකෘත්‍ය පිළිබඳ සටහන බාර ව සිටින තැනැත්තගෙන් නියමු කරනු ලැබිය හැකි පරිදි වූ අනුපාතයකට යම් ගාස්තුවක් ගෙවා එහි පිටපතක් ලබා ගැනීමට හිමිකම තිබිය යුතු ය.

(2) යුද්ධාධිකරණයේ අවසාන තීරණය දුන් දිනයෙන් පසු තුන් අවුරුද්දක් ඇතුළත (1) වෙනි උපවගන්තියේ සඳහන් තැනැත්තා විසින් යුද්ධාධිකරණයේ නීතිකෘත්‍යවල පිටපත ඉල්ලුම් කරනු ඇත යන කොන්දේසියට ඒ වගන්තියෙන් පැවරෙන හිමිකම යටත් විය යුතු ය.

(3) (1) වෙනි උපවගන්තියෙ සඳහන් තැනැත්තා (2) වෙනි උප වගන්තියේ නියමිත තුන් අවුරුදු කාලය තුළ මිය ගියහොත් ඔහුගේ මරණ යෙන් පසු දස මාසයක් ඇතුළත දී ඔහුගේ ළඟ ම නෑයාට (1) වෙනි උප වගන්තියේ දැක්වෙන නීතිකෘත්‍යවල පිටපත ලබා ගැනීමට හිමිකම තිබිය යුතු ය.

**යුද්ධාධිකරණයක නීතිකෘත්‍ය පිළිබඳ සටහන් සුරක්ෂිතව තැබීම**

53. නාවික හමුදාධිපති විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකින් හා ඔහු විසින් තීරණය කරනු ලැබිය හැකි නිලධාරියකු විසින් යුද්ධාධිකරණයේ නීතිකෘත්‍ය පිළිබඳ සටහන් සුරක්ෂිත ව තබා ගත යුතු ය.

## අටවන කොටස
## නාවික වරදවල්

### සතුරා ඉදිරියෙහි නොමනා ලෙස හැසිරීම

**ක්‍රියාවෙහි යෙදවීම පැහැර හැරීම**

54. (1) යුද්ධ සංඥාවක් ලැබුණු විට හෝ සතුරකුගේ නැවක් දුටු විට ක්‍රියාවෙහි යෙදවීම තම යුතුකම විය හැකිව තිබිය දී -

(අ) මුළු ශක්තිය යොදා තම නැව ක්‍රියාවට නොමෙහෙයවන හෝ

(ආ) සටන් කරන අතරතුරේ තමා ම පෞද්ගලික ව ද තම තනතුර අනුව ද ධෛර්‍යමත්ව සටන් කරන ලෙස ස්වකිය පහත් නිලධාරින්ට හා මිනිසුන්ට අනුබල නොදෙන හෝ

(ඇ) සාර්ථක ලෙස ආරක්ෂා කර ගත හැකි ව තිබිය දී තම නැව සතුරාට පාවා දෙන හෝ සටන් කරන කාලයේ නොනිසි ලෙස සටනින් ඉවත් වන සෑම ධජ නිලධාරියා කපිතාන් කොමාන්ඩර් හෝ අණදෙන නිලධාරියාම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින්

(i) රාජද්‍රෝහි ලෙස ක්‍රියා කොට තිබේ නම් මරණ දඬුවමද

(ii) බියසුලුකමින් ක්‍රියා කොට තිබේ නම් මරණ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක්ද

(iii) නොසැලකිල්ලෙන් හෝ වෙනත් පැහැර හැරිමකින් ක්‍රියා කොට තිබේ නම් අපකිර්තිසහගත ව හෝ අපකීර්තියෙන් තොර ව නාවික හමුදාවෙන් පහකිරිමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ද ලැබිය යුතුය

(2) සටන් කිරිමට සූදානම් වන ලෙස ආඥා කරනු ලැබූ විට හෝ සටන් කරන අතරතුරේ දි තම උසස් නිලධාරින් විසින් කරනු ලබන ආඥාවල් පිළිපැදිමෙහි ලා මුළු ශක්තිය නොයොදන නාවික නිතියට යටත් වූද අණදෙන නිලධාරියකු නොවන්නා වූද සෑම තැනැත්තකුම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින්

(අ) රාජද්‍රෝහි ලෙස ක්‍රියා කොට තිබේ නම් මරණ දඬුවම ද

(ආ) බියසුළුකමින් ක්‍රියාකොට තිබේ නම් මරණ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ද

(ඇ) නොසැලකිල්ලෙන් හෝ වෙනත් පැහැර හැරිමකින් ක්‍රියා කොට තිබේ නම් අපකිර්තිසහගතව නාවික හමුදාවෙන් පහ කිරිමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊටවඩා ලිහිල් වූ යම් දඬුවමක් ද ලැබිය යුතු ය.

සතුරා ලුහු නොබැඳිම හෝ අපේක්ෂිත මිතුරකුට සහාය නොවිම

**55**. පහර ලැබූ හො පලා යන යම් සතුරකු මුහුදු කොල්ලකරුවකු හෝ කැරලිකරුවකු ලුහුබැඳ යාමෙන් වළකින්නා වූ හෝ හැඳින ගත් අපේක්ෂිත මිතුරකුට තම මුළු බලය යොදා සහයන ලබා නොදෙන්නා වූ ද සහාය නොවන්නා වූද සෑම නිලධාරියකු ම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින්

(අ) රාජද්‍රෝහි ලෙස ක්‍රියා කොට තිබේ නම් මරණ දඬුවමද

(ආ) බියසුළුකමින් ක්‍රියා කොට තිබේ නම් මරණ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ද

(ඇ) නොසැලකිල්ලෙන් හෝ වෙනත් පැහැර හැරිමකින් ක්‍රියා කොට තිබේනම් අපකිර්තිසහගතව නාවික හමුදාවෙන් පහ

කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ද ලැබිය යුතු ය.

සේවය ප්‍රමාදකිරීම හෝ අධෛර්යමත් කිරීම

**56**. යම් ක්‍රියාවක් හෝ සේවයක් කරන ලෙස අණ කරනු ලැබූ විට මොනයම් ව්‍යාජත්වයකින් වුවද ඒ ක්‍රියාව හෝ සේවය ප්‍රමාද කරන හෝ අධෛර්යමත් කරන නාවික නිතියට යටත් සෑම තැනැත්තාම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් මරණ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

**සතුරා සමග පණිවුඩ හුවමාරුව**

ඔත්තුකාරයෝ

**57**. සතුරා වෙනුවෙන් ඔත්තුකාරයන් ලෙස ක්‍රියා කරන සියලුම තැනැත්තන් නාවික නිතියට යටත් තැනැත්තන් ලෙස සැලකිය යුතුය තවද ඔවුන් නාවික වරදකට වරදකරුවන් විය යුතු අතර ඔවුන් විසින් මරණ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

සතුරා සමග ලියුම් ගනුදෙනු කිරීම ආදිය

**58**. (අ) රාජද්‍රෝහී ලෙස සතුරා සමග ලියුම් ගනුදෙනු කරන හෝ ඔහුට ආරංචි සපයන හෝ

(ආ) සතුරාගෙන් තමාට ලැබී තිබිය හැකි යම් තොරතුරක් නිසි බලධාරීන් වෙත නොදන්වා සිටින හෝ

(ඇ) සැපයුම් කිසිවකින් සතුරාට සහනය සලස්වන නාවික නිතියට යටත් සෑම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතු ය ඔහු විසින් මරණ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතු ය.

සතුරා සමග නොනිසි ලෙස පණිවුඩ හුවමාරු කිරීම

**59**. රාජද්‍රෝහිවීමේ චේතනාවෙන් තොර ව සතුරා සමග නොනිසි ලෙස පණිවුඩ හුවමාරු කරන නාවික නිතියට යටත් සෑම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් අපකීර්ති සහගත ව නාවික හමුදාවෙන් පහ කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

සක්‍රිය සේවයෙහි යෙදී සිටිය දී මුරපොළ අත්හැර යාම ආදිය

**60**. (1) සක්‍රිය සේවයෙහි යෙදී සිටියදී තම මුරපොළ අත්හැර යන හෝ තම මුර වාරයෙහි නිදියන නාවික නිතියට යටත් සෑම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින්

(අ) රාජද්‍රෝහී ලෙස ක්‍රියා කොට තිබේ නම් මරණ දඬුවමද

(ආ) බියසුලුකමින් ක්‍රියා කොට තිබේ නම් මරණ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල්වූ යම් දඬුවමක් ද

(ඇ) නොසැලකිල්ලෙන් හෝවෙනත් පැහැර හරිමකින් ක්‍රියා කොට තිබේ නම් අපකීර්තිසහගතව නාවික හමුදාවෙන් පහ කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ද ලැබිය යුතුය.

(2) සක්‍රිය සේවයෙහි යෙදී සිටියදී සේවය අත් හැර යාමට වරද කරු නොවී නිවාඩු නොමැතිව නොපැමිණ සිටින හෝ ඔහුගේ නැවෙන් හෝ සේවා ස්ථානයෙන් අනිසි ලෙස ඉවත් ව යන නාවික නිතියට යටත් සෑම තැනැත්තාම නාවික වරදකට වරදකරු විය යුතු ය ඔහු අවුරුදු දෙකකට වැඩි නොවූ කාලයක් බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

සක්‍රිය සේවයෙහි යෙදී සිටියදී නිවාඩු නො ගෙන බැහැරව සිටීම ආදිය

61. සක්‍රිය සේවයෙහි යෙදී සිටියදී සේවය අත්හැර යාමට වරදකරු නොවී නිවාඩු නොමැතිව නොපැමිණ සිටින හෝ ඔහුගේ නැවෙන් හෝ සේවා ස්ථානයෙන් අනිසි ලෙස ඉවත් ව යන හෝ තමාට පවරන ලද රාජකාරිය නොසැලකිලිමත් ලෙස කරන නාවික නීතියට යටත් සෑම තැනැත්තාම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු අපකීර්තසහගත ලෙස නාවික හමුදාවෙන් පහ කිරීමේ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ලැබිය යුතුය.

නිවාඩු නොගෙන මාසයක් බැහැර ව සිටීම

62. නාවික නීතියට යටත් යම් තැනැත්තකු නිවාඩු නො ගෙන මසක් වූ කාලයක් බැහැර ව සිටි විට ඔහු අත් අඩංගුවට ගැනීම ද ඔහුගේ වරද සම්බන්ධයෙන් ඔහු විභාගයකට භාජන කිරීම ද නොකළ අවස්ථාවක පඩි හා වෙනත් ප්‍රතිලාභ නියම කරනු ලැබිය හැකි අන්දමින් අහිමි කිරීමකට ඔහු යටත් විය යුතු ය තව ද ඔහුගේ රාජකාරි ස්ථානයේ ඔහු තබා ගොස් ඇති යම් රෙදිපිළි හා බඩුබාහිරද අහිමි කරන ලෙප නිවාඩු නො ගෙන බැහැරව සිටටීම පිලිබඳ ප්‍රකාශයක් ඇතුලත් ආඥාවක් මගින් නාවික හමුදාධිපති විසින් අණ කළ හැකිය එබඳු යම් ආඥාවක් කළ අවස්ථාවක ඒ රෙදිපිළි හා බඩුබාහිර විකිණිය හැකිය විකිණීමෙන් ලැබෙන මුදලට නාවික හමුදාධිපති විස්න අණ කරනු ලබිය හැකි දෙයක් කළ යුතුය තව ද මේ වගන්තිය යටතේ කෙරෙන සෑම ආඥාවක ම නම් කොට ඇති තැනැත්තා එහි ම සඳහන් පරිදි නිවාඩු නො ගෙන බැහැර ව සිටින බව තීරණාත්මක ලෙස දැක්විය යුතු ය එහෙත් කවරාකාරයකින් වුව ද සෑහෙන හේතුවක් දැක්වීමේදී තමාට සුදුසු ය යි පෙනී ගියහොත් අහිමි කිරීමෙන් පසු හා විකිණීමට පෙර යම් අවස්ථාවක අහිමිකම ලිහිල් කිරීම හෝ විකිණීමෙන් පසු ඉන් ලැබුණු මුදල හෝ එයින් යම් කොටසක් රෙදිපිළි හෝ බඩුබාහිර අයිති ව සිටි තැනැත්තාට හෝ ඔහුගේ උරුමක්කාරයන් ට ගෙවීම හෝ ඔහුගේ හෝ ඔහුගේ උරුමක්කාරයන්ගේ ප්‍රයෝජනය පිණිස යෙදවීම ජනාධිපති විසින් කළ හැකිය.

සාහසික ලෙස හමුදා කැරලි ගැසීම

63. (1) සාහසිකත්වයෙන් යුක්ත වූ යම් හමුදා කැරැලි ගැසීමකට සම්බන්ධ වන නාවික නීතියට යටත් සෑම තැනැත්තාම නාවික වරදකට වරදකරු විය යුතු අතර ඔහු විසින් මරණ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ලැබිය යුතු ය.

(2) සාහසිකත්වයෙන් යුක්ත වූ යම් හමුදා කැරලි ගැසීමක මැඩලීම පිණිස තම මුළු ශක්තිය නොයොදන නාවික නීතියට යටත් සෑම තැනැත්තාම නාවික වරදකට වරදරු විය යුතු ය ඔහු විසින්

(අ) රාජද්‍රෝහී ලෙස කියා කොට තිබේ නම් මරණ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ද

(ආ) බියසුළුකමින් ක්‍රියා කොට තිබේ නම් අවුරුදු තුනකට වැඩි නොවූ කාලයක් බරපතල වැඩ ඇති ව බන්ධනාගාර ගත කිරීමේ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ද

(ඇ) නොසැලකිල්ලෙන ක්‍රියා කොට තිබේ නම් අපකීර්තිසහගත ව නාවික හමුදාවෙන් පහ කිරීමේ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ද ලැබිය යුතු ය.

සාහසිකත්වයෙන් තොර හමුදා කැරැලි ගැසීම

64. (1) සාහසිකත්වනේ තොර යම් හමුදා කැරැල්ලක කලහ මූලිකයකු වන නාවික නීතියට යටත් සෑම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතු ය ඔහු විසින් මරණ දඩුවම හෝ දණ්ඩණ ක්‍රමයේ ඊට ලිහිල් වූ යම් දඩුවමක් ලැබිය යුතුය.

(2) සාහසිකත්වනේ තොර හමුදා කැරැලි ගැසීමකට සම්බන්ධ වන කලහ මූලිකයකු නොවූ නාවික නිතියට යටත් සැම තැනැත්තා ම නාවික නිතියකට වරදකට වරදකරු විය යුතු ය ඔහු විසින් අවුරුදු දෙකකට වැඩි නොවූ කාලයක් බරපතල වැඩ ඇති ව බන්ධනාගාර ගත කිරිමේ දඬුවම හෝ දණ්ඩණ ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

**හමුදා කැරැලි ගැසීමට පෙලඹවීම**

65. (1) හමුදා කැරැලි ගැසිම පිළිබඳ වූ යම් ක්‍රියාවක් කරන ලෙස නාවික නිතියට යටත් අන් කිසි තැනැත්තකු පොලඹවන හෝ පොලඹවීමට තැත් කරන නාවික නීතියට යටත් සැම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතු ය ඔහු විසින් මරණ දඬුවම හො දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

(2) හමුදා කැරැලි ගැසිම පිළිබඳ වූ යම් ක්‍රියාවක් කරන ලෙපසනාවික නිතියට යටත් අන් කිසි තැනැත්තකු පොලඹවන හෝ පොලඹවීමට තැත් කරන අන් ලෙසකින් නාවික නීතියට යටත් නොවූ සැම තැනැත්තා ම ඒ පෙලෙඹවීම හෝ තැත් කිරිම සම්බන්ධයෙහි ලා නාවික නිතියට යටත් තැනැත්තකු ලෙස සැලකිය යුතු ය තවද ඔහු නාවික වරදකට වරදකරු විය යුතු අතර ඔහු විසින් මරණ දඬුවම හො දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

**හමුදා කැරැලි ගැසීමට රුස්වීම හෝ හමුදා කැරැලි ගැසිම පිළිබඳ වචන ප්‍රකාශ කිරිම**

66. හමුදා කැරලි ගැසිම පිණිස රුස්වීමක් පවත්වන හෝ පැවැත්වීමට තැත් කරන හො යම් හමුදා කැරලි ගැසිමකට සම්බන්ධ වන ලෙස නාවික නිතියට අයත් අන් කිසි තැනැත්තකු කැඳවා ගෙන යන හෝ පොලඹවන හෝ කලහකාරි වචන කිසිවක් ප්‍රකාශ කරන නාවික නිතියට යටත් සැම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතු ය ඔහු විසින් අවුරුදු තුනකට අඩු නොවූ කාලයක් බරපතල වැඩ ඇති ව බන්ධනාගාරගත කිරිමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

**හමුදා කැරලි ගැසිමේ ක්‍රියා වසන් කිරිම**

67. හමුදා කැරලි ගැසිම පිළිබඳ යම් ක්‍රියාවක් හෝ උපක්‍රමයක් ඔනැකමින් ම වසන් කරන නාවික නිතියට යටත් සැම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතු ය ඔහු විසින් අවුරුදු තුනකට අඩු නොවූ කාලයක් බරපතල වැඩ ඇති ව බන්ධනාගාරගත කිරිමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

**නාවික නිතියට යටත් යම් තැනැත්තකුට පහරදිම හෝ පහර දිමට තැත් කිරිම ආදිය**

68. නාවික නිතියට යටත් වන වෙනත් යම් තැනැත්තු ස්වකිය ධූරයේ කටයුතු වල යෙදි සිටියද එසේ නැති වුවද එම තැනැත්තාට එරෙහිව පහර දෙන හෝ පහර දිමට තැත් කරන හෝ ඔහුට විරුද්ධව යම් අවියක් හයන හෝ ඔසවන හෝ ඔහුට සාහසිකකම් කරන හෝ කිරිමට තැත් කරන නාවික නිතියට යටත් සැම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් අවුරුදු තුනකට අඩු නොවූ කාලයක් බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරිමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

## අණට අකිකරු විම

**ඉහල නිලධරයන්ට හෝ කණිෂ්ඨ නිලධරයන්ට අකිකරු විම හෝ තර්ජනාත්මක වචන පාවිච්චි කිරිම**

69. තම ඉහල නිලධරයකුගේ හෝ 24 වන වගන්තිය යටතේ සිය රාජකාරි ඉටුකරන කණිෂ්ඨ නිලධරයකුගේ හෝ යම් නිත්‍යානුකුල අණක් සිතා මතා පිලි නොපදින හෝ සිය ඉහල නිලධරයාට හෝ 24 වන වගන්තිය යටතේ සිය රාජකාරි ඉටු කරන යම් කණිෂ්ඨ නිලධරයකුට හෝ එරෙහිව තර්ජනාත්මක හෝ අපහාසාත්මක වචන පාවිච්චි කරන හෝ එම නිලධරයන්ට අපහාස වන පරිදි හැසිරෙන නාවික නිතියට යටත් යම් තැනැත්තකු නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් අපකිර්ති

සහගත ව නාවික හමුදාවෙන් පහ කිරිමේ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ලැබිය යුතු ය.

දබර කිරිම හෝ අපවාදාත්මක ව කථා හෝ ඉගි කිරිම

**70**. අන් කිසි තැනැත්තකු නාවික නිතියට යටත් තැනැත්තකු වුවත් නො වුවත් ඒ අන් තැනැත්තා සමග දබර වන හෝ ගහගන්නා හෝ යම් දබරයකට හෝ අරගලයකට තුඩු දෙන අපවාදාත්මක වූ හෝ ප්‍රකෝප කරවන්නා වූ කථා හෝ ඉගි කරන නාවික නිතියට යටත් සෑම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතු ය ඔහු විසින් හමසකට වැඩි නොවූ කාලයක් වැඩ නැති ව හෝ බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරිමෙ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ලැබිය යුතුය.

පැනයාම

**71**. තම නැවට හෝ තම රාජකාරිය කිරිම පිණිස සිටිය යුතු ස්ථානයට ආපසු නොඑන අදහසින් ඒ නැවෙන් හෝ ස්ථානයේන බැහැරව සිටින හෝ යම් වේලාවක කරුණු කිසිවක් හේතු කොට ගෙන තම නැවෙන් හෝ රාජකාරි ස්ථානයෙන් බැහැර ව සිටිය දි එ නැවට හො ස්ථානයට ආපසු නොඑන අදහස දැක්වෙන යම් ක්‍රියාවක් කරන නාවික නිතියට යටත් සෑම තැනැත්තාම පැන ගොස් සිටින්නකු ලෙස සැලකිය යුතු ය තවද ඔහු නාවික වරදකට වරදකරු විය යුතු අතර ඔහු විසින්

(අ) සතුරා වෙතට පැන ගොස් සිටියහොත් මරණ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ද

(ආ) අන් කරුණු කිසිවක් නිසා පැන ගොස් සිටියහොත් අවුරුදු පහකට නොවැඩිකාලයක් බරපතල වැඩ ඇති ව බන්ධනාගාරගත කිරිමේ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූයම් දඩුවමක් ද ලැබිය යුතුය.

තවද ඔහු විභාගයකට භාජන කල විනිශ්චය සභාව විසින් හෝ ජනාධිපති විසින් අන් ලෙසකින් අණ කරනු ලැබුවහොත් මිස එබදු හැම අවස්ථාවක දිම ඔහුට ලැබිය යුතු පඩිය දිමනා සහ වෙනත් වේතනද ඔහුට ප්‍රදානය කරන ලද සියලුම පදක්කම් හා පළදනා ද නැවේ හෝ පැන ගිය ස්ථානයේ ඔහු තබා යන්ට ඇති සියලු රෙදිපිළි හා බඩුබාහිරා ද අහිමි කළ යුතුය.

පැනයාමට පෙලඹවිම

**72**. පැනයන ලෙස නාවික නිතියට අයත් අන් කිසි තැනැත්තකු පොලඹවන හො පොලඹවිමට තැත් කරන නාවික නිතියට යටත් සෑම තැනැත්තාම නාවික වරදකට වරදකරු විය යුතු ය ඔහු විසින් අවුරුදු දෙකකට වැඩි නොවූ කාලයක් බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරිමේ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ලැබිය යුතු ය.

පැනයන්නකුට සංග්‍රහ කිරිම

**73**. ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් යුද්ධ හමුදාවෙන් ගුවන් හමුදාවෙන් පැනයන්නකු බව අනාවරණය විමෙන් පසු පැනයන්නතැ පිලිගන්නා වූ හෝ ඔහුට සංග්‍රහ කරන්නා වුද නාවික හමුදාවෙන් පැනයන්නකු වුවහොත් පැනයන්නා අයිති නැවේ අණදෙන නිලධාරියා වෙත හෝ ඒ නැව දුරින් තිබේ නම් නාවික හමුදාධිපති වෙත හෝ යුද්ධ හමුදාවෙන් හෝ ගුවන් හමුදාවෙන් පැනයන්නකු වුවහොත් කාරණයට ගැළපෙන පරිදි යුධහමුදාධිපති වෙත හෝ ගුවන් හමුදාධිපති වෙත හෝ පැනයන්නා අයිති රෙජිමේන්තුවේ හෝ අංශයේ අණදෙන නිලධාරියා වෙත ඉස්පාසු ඇති ව දැන්විය හැකි තරම් ඉක්මණින් නොදන්වන්නා වූ ද නාවික හමුදාවේ යම් නැවක තම අණ යටතේ ඇති සෑම නිලධාරියා ම නාවික වරදකට වරද කරු විය යුතුය ඔහු විසින් අපකිර්තියෙන් තොර ව නාවික හමුදාවෙන් පහකිරිමේ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ලැබිය යුතුය.

## යුද්ධාධිකරණ හා අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරින් සම්බන්ධ වරදවල්

සාධාරණ හේතුවක් නොමැතිව යුද්ධාධිකරණයක සාමාජිකයකු බැහැරව සිටීම

74. යුද්ධාධිකරණයක සාමාජිකයකු අසනීපවීම නිසා හෝ යුද්ධාධිකරණයේ සෙසු සාමාජිකයන් විසින් අනුමත කරන ලද වෙන සාධාරණ හේතුවක් නිසා එයින් බැහැර ව සිටියහොත් මිස යුද්ධාධිකරණයෙන් බැහැර ව සිටින සාමාජිකයකු නාවික වරදකට වරදකරු විය යුතු ය තවද යුද්ධාධිකරණයක් විසින් ඔහු වරදකරු කරනු ලැබූ විට අපකීර්ති සහගතව නාවික හමුදාවෙන් පහ කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

නාවික නීතියට යටත් සාක්ෂි කරුවකුගේ නොමනා හැසිරීම හා ඔහුගෙන් වන අපහාසය

75. (අ) යුද්ධාධිකරණයක් ඉදිරියට හෝ මේ පනත යටතේ අධිකරණ බලතල පාවිච්චි කරනව නාවික නිලධාරියකු ඉදිරියට සාක්ෂිකරුවකු ලෙස නිසියාකාර කැඳවනු ලැබ සිටිය දි පැමිණීම පැහැර හරින හෝ

(ආ) යුද්ධාධිකරණයක් විසින් හෝ එබඳු නිලධාරියකු විසින් නිත්‍යානුකූලව දීමට නියම කෙරෙන දිවුරුමක් හෝ කිරීමට නියම කෙරෙන සහතික ප්‍රකාශයක් දීම හෝ කිරීම ප්‍රතික්ෂේප කරන හෝ

(ඇ) තම බලය ප්‍රකාර හෝ පාලනය යටතෙහි වූ යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස යුද්ධාධිකරණයක් විසින් හෝ එබඳු නිලධාරියකු විසින් නිත්‍යානුකූලව නියම කරනු ලැබූ විට එය ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ

(ඈ) සාක්ෂිකරුවකුව සිටින විට යුද්ධාධිකරණයකට හෝ එබඳු නිලධාරියකුට නිත්‍යානුකූලව පිළිතුරක් වුවමනා කළ හැකි යම් ප්‍රශ්ණයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන හෝ

(ඉ) යුද්ධාධිකරණයකට හෝ එබඳු නිලධාරියකුට නින්දා සහගත හෝ තර්ජනාත්මක වචන පාවිච්චි කිරීමෙන් හෝ ඒ යුද්ධාධිකරණයේ හෝ නිලධාරියාගේ නිතිකෘත්‍ය වලට යම් අවහිරයක් හෝ බාධාවක් පැමිණවීමෙන් හෝ අදහස් මුද්‍රණය කිරීමෙන් හෝ ප්‍රසිද්ධ කිරීමෙන් හෝ ඒ යුද්ධාධිකරණය හෝ නිලධාරියා නොහොත් ඒ යුද්ධාධිකරණය ඉදිරියේ හෝ නිලධාරියා ඉදිරියේ සිටින යම් සාක්ෂිකරුවකු නම්මා ගැනීමට අර ඇද වචන කථා කිරීමෙන් හෝ ඒ යුද්ධාධිකරණය හෝ නිලධාරියා අවමානයට ලක් කිරීමෙන් අපහාස කරන

නාවික නීතියට යටත් සෑම තැනැත්තාම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් කරනු ලැබූ වරදට සම්බන්ධ වූ යුද්ධාධිකරණය හෝ වරද සිදු වූ යුද්ධාධිකරණය හැර වෙන යුද්ධාධිකරණයකින් ඔහු වරදකරු කරනු ලැබූ විට වැඩ නැතිව හෝ බරපතළ වැඩ අතිව මාස හයකට වැඩි නොවූ කාලයක් බන්ධනාගාර ගත කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතු ය.

එසේ වුවද නාවික නීතියට යටත් තැනැත්තකු නින්දාසහගත වූ හෝ තර්ජනාත්මක වූ වචන පාවිච්චි කිරීමෙන් හෝ නිතිකෘත්‍යවලට යම් අවහිරයක් හෝ බාධාවක් පැමිණවීමෙන් යුද්ධාධිකරණයකට අපහාස කිරීමේ වරදකරු වූ අවස්ථාවක ඔහු වෙත යුද්ධාධිකරණයක් මගින් විභාගයකට භාජන කරවනු වෙනුවට මසකට වැඩි නොවූ කාලයක් වැඩ නැතිව හෝ බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමේ දඬුවම යුද්ධාධිකරණය විසින් ඔහුට නියම කළ හැකිය

නාවික නීතියට යටත් සාක්ෂි කරුවකු විසින් බොරු සාක්ෂි දීම

76. යුද්ධාධිකරණයක් ඉදිරියේ හෝ මේ පනත යටතේ අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරියකු ඉදිරියේ දිව්රුම් පිට හෝ සහතික ප්‍රකාශයක් පිට ප්‍රශ්ණ කරනු ලැබූ විට ඕනැකමින් ම බොරු සාක්ෂි දෙන නාවික නීතියට යටත් සෑම තැනැත්තාම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු යුධාධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ විට වැඩ නැතිව හෝ බරපතල වැඩ ඇතිව අවුරුදු දෙකකට වැඩි නොවූ කාලයක් බන්ධනාගාර ගත කිරීමේ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ලැබිය යුතුය.

## සිරභාරයේ සිටින තැනැත්තන් සම්බන්ධ වරදවල්

සිරභාරයේ සිටින තැනැත්තකු බේරී යාමට අවසර දීම

77. (අ) චෝදනාවකට අසුවී නාවික සිරභාරයේ සිටින යම් තැනැත්තකු නියම බලයක් නොමැතිව ඕනැකමින් ම හෝ අන් ලෙසකින් මුදාහරින හෝ

(ආ) චෝදනාවකට අසුවී නාවික සිරභාරය් සිටින යම් තැනැත්තකුට ඕනැකමින් ම හෝ සාධාරණ හේතුවක් නොමැතිව බේරී යාමට ඉඩ දෙන නාවික නීතියට යටත් සෑම තැනැත්තාම නාවික වරදකට වරදකරු විය යුතුය තවද ඔහු ඕනැකමින් ම ක්‍රියා කොට තිබේ නම් අවුරුදු තුනකට අඩුනොවූ කාලයක් බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමේ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ද වෙන යම් අවස්ථාවකදී වැඩ නැතිව හෝ බරපතල වැඩ ඇතිව අවුරුදු දෙකකට වැඩි නොවූ කාලයක් බන්ධනාගාර ගතකිරීමේ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ද ඔහු විසින් ලැබිය යුතුය.

අයථා ලෙස අත් අඩංගුවේ හෝ සිර අඩස්සියේ තැබීම

78. තැනැත්තකු නඩු විභාගයක් සඳහා ඉදිරිපත් නොකොට නුවුවමනා ලෙස අත් අඩංගුවේ හෝ සිර අඩස්සියේ නවත්වා ගන්නා හෝ හෝ ඔහුගේ නඩුව විභාග කිරීම සඳහා නියම බලධාරියා වෙත ඉදිරිපත් නො කරන නාවික නීතියට යටත් සෑම තැනැත්තාම නාවික වරදකට වරදකරු විය යුතුය තවද ඔහු විසින් අපකීර්තියෙන් තොරව නාවික හමුදාවෙන් පහ කිරීමේ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ලැබිය යුතුය.

සිර අඩස්සියෙන් බේරී යාම

79. අත් අඩංගුවේ හෝ සිර අඩස්සියේ හෝ බන්ධනාගාරයේ හෝ වෙන අන්දමකින් නීත්‍යානුකූල වූ සිරභාරයක සිටියදී බේරී යන හෝ බේරී යාමට තැත් කරන නාවික නීතියට යටත් සෑම තැනැත්තාම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු අපකීර්ති සහගතව නාවික හමුදාවෙන් පහ කිරීමේ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ලැබිය යුතුය

## දේපල සම්බන්ධ වරදවල්

නාවික හමුදාවේ සැපයුම් පිළිබඳ දූෂණ කටයුතු

80. නාවික හමුදාව විසින් බඩු කිසිවක් මිලට ගැනීම පිළිබඳව හෝ ඒ සම්බන්ධයෙහි ලා යම් තෑග්ගක් ගාස්තුවක් හෝ වාසියක් ලබන නාවික නීතියට යටත් සෑම තැනැත්තාම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් අවුරුදු දෙකකට වැඩි නොවූ කාලයක් වැඩ නැතිව හෝ බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමේ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ලැබිය යුතුය.

නාවික බඩු මුට්ටු වංචනික ලෙස ප්‍රයෝජනයට ගැනීම ආදිය

81. වෙඩි ද්‍රව්‍ය ආහාර ද්‍රව්‍ය හෝ වෙනත් නාවික බඩුමුට්ටු කිසිවක් වංචාවෙන් ප්‍රයෝජනයට ගැනීමක් හෝ වාංචනික ලෙස මිලට ගැනීමක් විකිණීමක් හෝ භාර ගැනීමක් කරන හෝ දැනුවත් වම එබඳු යම් වංචනික වූ ප්‍රයෝජන ගැනීමකට මිලට ගැනීමකට විකිණීමට හෝ භාර ගැනීමකට අවසර දෙන නාවික නීතියට යටත් සෑම තැනැත්තාම නවික වරදකට වරදකරු විය යුතු ය ඔහු විසින් අවුරුදු දෙකකට වැඩි නොවූ කාලයක් වැඩ

නැතිව හෝ බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගතකිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

නාවික දේපලක අඩුපාඩුවක් ඇති කිරීම හෝ ඊට හානියක් කිරීම

82. (අ) නාවික හමුදාවේ යම් දේපලක් උකස් කිරීමෙන් විකිණීමෙන් විනාශ කිරීමෙන් හෝ අන් ලෙසකින් නාස්ති කරන හෝ නාස්ති කිරීමකට සම්බන්ධ වන හෝ

(ආ) නොසැලකිල්ලෙන් ඒ දේපලක් නැති කරන හෝ පරිහානිය ඇති කිරීමට සලස්වන

(ඇ) ඕනැකමින් ම එබඳු යම් දේපලකට හානි සිදුකරන හෝ විනාශ කරන

නාවික නීතියට යටත් සෑම තැනැත්තාම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් අවුරුදු දෙකකට වැඩි නොවූ කාලයක් වැඩ නැතිව හෝ බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතු ය.

නීති විරෝධී ලෙස දේපල පිළිස්සීම

83. යම් සතුරකුට මුහුදු කොල්ලකරුවකුට හෝ කැරලිකරුවකුට අයිතිනොවන යම් දේපලකට නීති විරෝධී ලෙස ගිනි තබන නාවික නීතියට යටත් සෑම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතු ය ඔහු විසින් මරණ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

## ලේඛන හා ප්‍රකාශ සම්බන්ධ වූ වරදවල්

අසත්‍ය ලේඛන හා ප්‍රකාශ

84. (අ) තමන් විසින් පිළියෙල කරන ලද හෝ අත්සන් කරන ලද යම් වාර්තාවක වාර වාර්තාවක පෙරෙට්ටු නාමාවලියක පඩි ලැයිස්තුවක සහතිකයක පොතක හෝ වෙනත් ලේඛනයක අන්තර්ගත කරුණුවල නිවැරදිභාවය නිශ්චය කිරීම තම යුතුකම වී තිබියදී එහි ඒවා පිළිබඳව යම් අසත්‍ය හෝ වාංචනික ප්‍රකාශයක් හෝ වංචා කිරීමේ චේතනාවෙන් යම් ප්‍රමාදයක් දැනුවත්ව ම කරන හෝ කිරීමෙහි ලා හවුල් වන හෝ

(ආ) යම් ලේඛනයක් සුරක්ෂිතව තබා ගැනීම හෝ ඉදිරිපත් කිරීම තම යුතුකම වී තිබියදී යම් තැනැත්තකුට හානි කිරීමේ හෝ වංචා කිරීමේ චේතනාවෙන් දැනුවත්වම එය යටපත් කරන අපැහැදිලි කරන වෙනස් කරන හෝ නැති කරන හෝ

(ඇ) යම් කාරිණයක් සම්බන්ධයෙන් ප්‍රකාශයක් කිරීම තම රාජකාරි කටයුත්ත වී තිබෙන අවස්ථාවක දැනුවත් වම අසත්‍ය ප්‍රකාශයක් කරන

නාවික නීතියට යටත් සෑම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් අවුරුදු දෙකකට වැඩි නොවූ කාලයක් වැඩ නැතිව හෝ බරපතල වැඩ ඇති ව බන්ධනාගාරගත කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

අසත්‍ය චෝදනා

85. (අ) නිලධාරියකු හෝ නාවිකයකු වී සිටිය දී වෙන යම් නිලධාරියකුට හෝ නාවිකයකුට විරුද්ධ ව තමා කරන චෝදනාව අසත්‍ය බව දැන ගෙන ම අසත්‍ය චෝදනාවක් කරන හෝ

(ආ) නිලධාරියකු හෝ නාවිකයකු වී සිටිය දී තමාට වරදක් කොට ඇතැයි සිතන අවස්ථාවක පැමිණිල්ලක් කිරීමේ දී වෙන යම් නිලධාරියකුගේ හෝ නාවිකයකුගේ චරිතයට හානිකර වූ යම් අසත්‍ය ප්‍රකාශයක් දැන්වත්ව ම කරන හෝ වැදගත් කරුණු කිසිවක් දැනුවත්කමින් ම හා ඕනැකමින් ම යටපත් කරන නාවික නීතියට යටත් සෑම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු

විසින් අවුරුදු දෙකකට වැඩි නොවූ කාලයක් වැඩ නැතිව හෝ බරපතල වැඩ ඇති ව බන්ධනාගාරගත කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතු ය.

## බඳවා ගැනීම සම්බන්ධ වරදවල්

අපකීර්ති සහගත ව නිදහස් කරනු ලැබූ නාවිකයකු සෙබළෙකු හෝ ගුවන් භටයකු බඳවා ගැනීම

86. ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් යුද්ධ හමුදාවෙන් හෝ ගුවන් හමුදාවෙ අපකීර්තිසහගත ලෙස පහ කරනු ලැබ ඉක්බිති තමන් සේවයෙන් පහ කරනු ලැබීම පිළිබඳ කරුණු ප්‍රකාශ නො කොට නාවික හමුදාවට බැඳී සිටින නාවික නීතියට යටත් සෑම තැනැත්තාම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් අවුරුදු දෙකකට වැඩි නොවූ කාලයක් වැඩ නැතිව හෝ බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

බඳවා ගැනීම් වලදී අසත්‍ය පිළිතුරු දීම

87. නාවිකයකු ලෙස බඳවා ගත් අවස්ථාවේ දි තමා විසින් අත්සන් කරනු ලැබූ සහතික කිරීමේ පත්‍රිකාවේ අසා තිබූ යම් ප්‍රශ්ණයකට ඕනෑකමින්ම අසත්‍ය පිළිතුරක් දී ඇති නාවික නීතියට යටත් සෑම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතු ය ඔහු විසින් අවුරුදු දෙකකට වැඩි නොවූ කාලයක් වැඩ නැතිව හෝ බරපතල වැඩ ඇති ව බන්ධනාගාරගත කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

බඳවා ගැනීම සම්බන්ධ සාමාන්‍ය වරදවල්

88. (අ) අන් කිසි තැනැත්තකු නාවිකයකු ලෙස බැඳීමෙන් කරන්නේ වරදක් බව දැන ගෙන ම හෝ ඒ බව විශ්වාස කිරීමට සාධාරණ හේතුවක් ඇති ව සිටිය දි ඒ අනික් තැනැත්තා බඳවා ගැනීමෙහි ලා සම්බන්ධ වන හෝ

(ආ) නාවිකයන් බඳවා ගැනීම හා සම්බන්ධ නීතිය පිළිබඳ යම් විධි විධානයක් ඕනෑකමින් ම කඩ කරන නාවික නීතියට යටත් සෑම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් අවුරුදු දෙකකට වැඩි නොවූ කාලයක් වැඩ නැතිව හෝ බරපතළ වැඩ ඇති ව බන්ධනාගාරගත කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

## විවිධාකාර වරදවල්

බීමත්කම හා දුශ්චරිතය

89. බීමත් ව සිටින හෝ යම් දුරාචාරශීලි ක්‍රියාවක් කරන නාවික නීතියට යටත් සෑම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතු ය ඔහු විසින් අපකීර්ති සහගතව හෝ අපකීර්තියෙන් තොර ව නාවික හමුදාවෙන් පහකිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතු ය.

කෲරකම හා ගර්හිත හැසිරීම

90. කෲර වූ යම් ක්‍රියාවක් කරන හෝ ගර්හිත වූ වංචනික වූ හෝ නිලධාරියකුගේ චරිතයට නොතරම් වූ හැසිරීම් ඇති නාවික නීතියට යටත් සෑම නිලධාරියා ම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් අපකීර්තිසහගත ව හෝ අපකීර්තියෙන් තොර ව නාවික හමුදාවෙන් පහ කිරීමේ දඬුවම ලැබිය යුතු ය.

නැව් හෝ ගුවන් නැවක් නොනිසි ලෙස නාස්ති වීමට ඉඩ හැරීම

91. නාවික හමුදාවේ යම් නැවක් නාස්ති කරන ගොඩ අනින හෝ උපද්‍රවයට කැප කරන හෝ නාස්ති වීමට ගොඩ ඇනීමට හෝ උපද්‍රවයට කැප වීමට ඉඩ හරින හෝ නාවික හමුදාවට අයත් යම් ගුවන් නැවක් නාස්ති කරන හෝ නාස්ති වීමට ඉඩ හරින නාවික නීතියට යටත් සෑම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින්

(අ) සිතා මතා ම ක්‍රියා කොට තිබේ නම් අවුරුදු දෙකකට වැඩි නොවූ කාලයක් බරපතල වැඩ ඇති ව බන්ධනාගාරගත කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ද

(ආ) නොසැලකිල්ලෙන් ක්‍රියා කොට තිබේ නම් අපකීර්ති සහගතව නාවික හමුදාවෙන් පහ කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ද ලැබිය යුතුය.

ආරක්ෂාව යටතේ තිබෙන නැව්වලට නොසැලකිම හා ඒවා ආරක්ෂා නොකිරීම

**92**. යම් නැව් ආරක්ෂාව යටතට ගැනීම හා රැග බලා ගැනීම සඳහා පත් කරනු ලැබූ නාවික හමුදාවේ සියලු ම නැව්වල නිලධාරීන් විසින් ඒ සඳහා ඔවුන්ට ලැබී ඇති උපදෙස් අනුව ඔවුන්ගේ රාජකාරිය අප්‍රමාදවත් අනලස්වත් ඉටු කළ යුතුය තවද මේ සම්බන්ධයෙන් තම රාජකාරිය ඉටු නොකරන්නා වූ ද අන්කිසි විෂයයන් කරා නොගොස් තම ආරක්ෂාව යටතේ වූ නැව් සහ භාණ්ඩ ආරක්ෂා නොකරන්නා වූ ද නැතහොත් ඒවා ආක්‍රමණය කරනු ලැබුවහොත් ආරක්ෂා කර ගැනීම සඳහා සටන් කිරීම ප්‍රතික්ෂේප කරන්නා වූද හෝ තම ආරක්ෂාව යටතේ වූ නැව් බියසුළු ලෙස අත් හැර දමා ඒවාට වන දෙයක් වීමට ඉඩ හරින්නා වූද නැතහොත් තම භාරයේ තබා ඇති නැව් කිසිවක් ආරක්ෂා කිරීම සඳහා යම් වෙළෙන්දකු ගෙන් හෝ නියමුවකුගෙන් කිසි මුදලක් හෝ තෑග්ගක් ඉල්ලන්නා වූ හෝ අයකරන්නා වූ ද නැතහොත ඒවායේ අධිපතින්ගෙන් හෝ නැවියන්ගෙන් අයුතු ප්‍රයෝජන ගන්නා වූද සෑම නිලධාරියා ම නාවික වරදකට වරදකරු විය යුතු ය ඔහු විසින් මරණ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

නැව් පාවිච්චියට හැර නැවකට භාණ්ඩ ගෙන යාම

**93**. යම් වෙළෙන්දකුට අයිති භාණ්ඩ කිසිවක් හෝ මහ මුහුදේදී හෝ යම්කිසි නැව් තොටක දී බොක්කක දී හෝ වරායක දී මුහුදුබත් විය හැකි හෝ අනතුරකට ගොදුරු වීමට ආසන්න ව ඇති යම් නැවක තිබෙන භාණ්ඩ වල නියම අයිතිකාරයන් වෙනුවෙන් ඒවා පරිස්සම් කිරීමේ කාර්යය සඳහා ගන්නා භාණ්ඩ කිසිවක් හැර නොහොත් උසස් නිලධාරියකුගේ ආඥාවකින් යම් වේලාවක නැවට ගන්නා ලෙස හෝ භාර ගන්නා ලෙස තමන්ට අණ කරනු ලැබිය හැකි භාණ්ඩ කිසිවක් හැර තම අණ යටතේ තිබෙන නාවික හමුදාවේ යම් නැවක හුදු ප්‍රයෝජනය සඳහා නොවූ භාණ්ඩ කිසිවක් ඒ නැවට භාර ගන්නා වූ හෝ භාර ගැනීමට අවසර දෙන්නා වූ නිලධාරියකු නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසිසන් අපකීර්තියෙන් තොර ව නාවික හමුදාවෙන් පහ කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

රෝගයක් හෝ බෙලහිනතාවයක් ඇති කිරීම හෝ බරපතල කිරීම

**94**. (අ) හොර ලෙඩ ගන්නා වූ හෝ රැවටිලි කරන්නා වූ හෝ තමන් තුළම රෝගයක් හෝ බෙලහිනතාවයක් ඇති කරගන්නා වූ හෝ

(ආ) තමන් සේවයට නුසුදුසු වීමේ චේතනාවෙන් ඕනැකමින්ම අබ්බගාත කරගන්නා වූ හෝ තුවාල කර ගන්නා වූ හෝ නාවික නීතියට යටත් අන් කිසි තැනැත්තකු ඔහුගේ කීම අනුව වුවත් නැතත් සේවයට නුසුදුසු කිරීමේ චේතනාවෙන් ඕනැකමින් ම ඒ අනික් තැනැත්තා අබ්බාගාත කරන්නා වූ හෝ තුවාල කරන්නා වූ හෝ සේවය සඳහා නුසුදසු වීමේ චේතනාවෙන් වෙන යම් තැනැත්තකු ලවා තමන් අබ්බගාතයකු හෝ තුවාල කාරයකු කරවා ගන්නා වූ හෝ

(ඇ) ආරෝග්‍ය ශාලාවේ දි හෝ වෙන තැනක දි ඕනැකමින් ම නොනිසි ලෙස හැසිරීමෙන් හෝ ඕනැකමින් ම ආඥාවලට අකීකරු වීමෙන් රොගයක් හෝ බෙලහිනතාවයක් ඇතිකර ගන්නා වූ හෝ බරපතල කර ගන්නා වූ හෝ එයින් සුවය ලබා ගැනීම ප්‍රමාද කරන්නා වූ

නාවික නීතියට යටත් සෑම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් අවුරුදු දෙකට වැඩි නොවූ කාලයක් වැඩ නැතිව හෝ බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමේ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ලැබිය යුතු ය.

සපයන ලද කෑම්බීම්වල අපථ්‍යතාවය හෝ වෙනයම් හේතු

**95**. නාවික නිතයට යටත් තැනැත්තන් වෙත සපයන ලද කෑම්බීම්වල අපථ්‍යතාවය හෝ වෙනයම් හේතුවක් ඇසුරු කොට ගෙන ඔවුන් කිසිවකු අතර යම් අරගලයක් ඇති කරන නාවික නීතියට යටත් සෑම තැනැත්තාම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් අවුරුදු දෙකකට වැඩි නොවූ කාලයක් වැඩ නැති හෝ බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමේ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ලැබිය යුතු ය.

කොල්ලකා ගත් යාත්‍රාවක තිබ් සොයා ගත් පත්‍රිකා

**96**. යම් යාත්‍රාවක් කොල්ලකා ගන්නා නාවික හමුදාවේ නැවක අණදෙන නිලධාරියා විසින් කොල්ලකා ගත් යාත්‍රාවේ තිබ් ගත යුතු අල්ලා ගත යුත හෝ සොයා ගත යුතු සියලු ම පත්‍රිකා නැව් භාරක පත්‍ර නෞ භාර පත්‍ර පාර පත්‍ර සහ කවරාකාර වූ හෝ වෙනත් ලියවිලි ද ආරක්ෂා කර ගත නොහැකි වූ අවස්ථාවක හෝ ඒ කොල්ලය නීත්‍යානුකූල අල්ලා ගැනීමක් ද නැද්ද යනු තිරණය කිරීමට බලයලත් යම් විනිශ්වය සභාවක් වෙත නීති ප්‍රකාර ඒවා පරීක්ෂා කිරීම හා පරිහරණය කිරීමත් සඳහා යැවිය නොහැකි වූ අවස්ථාවක ඔහු නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් අපකිර්තියෙන් තොර ව නාවික හමුදාවෙන් පහ කිරීමේ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ රැට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ලැබිය යුතුය තවද ඊට අතිරේක ව අල්ලා ගත් දේවලින් ඔහුට ලැබිය යුතු කොටස ද අහිමි විය යුතුය.

කොල්ල කා ගත් යාත්‍රාවකට අයත් දේපළ වාංචනික ලෙස ප්‍රයෝජනයට ගැනීම

**97**. කොල්ලකා ගන්නා ලද යම් යාත්‍රාවකට අයත් යම් දේපළක් වාංචනික ලෙස ප්‍රයෝජනයට ගන්නා වූ නාවික නීතියට යටත් සෑම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් අප කිර්තිසහගතව නාවික හමුදාවෙන් පහ කිරීමේ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ලැබිය යුතු ය තවද ඊට අතිරේක ව අල්ලා ගත් දේවලින් ඔහුට ලැබිය යුතු කොටස ද අහිමි විය යුතුය.

කොල්ලකා ගත් යාත්‍රාවක සිටින තැනැත්තන්ට නොමනා ලෙස සැලකිම

**98**. කොල්ලකා ගන්නා ලද යාත්‍රාවක සිටින යම් තැනැත්තකු නිර්වස්ත්‍ර කරන හො යම් ලෙසකින් ගසා කන ඔහුට පහර දෙන හෝ නොමනා ලෙස සලකන නාවික නීතියට යටත් සෑම තැනැත්තා ම නාවික ි වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් අපකිර්තිසහගතව නාවික හමුදාවෙන් පහ කිරීමේ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ලැබිය යුතුය.

යාත්‍රාවක් කොල්ල කා ගැනීමෙහි ලා වංක සහයෝගය දැක්වීම ආදිය

**99**. නාවික හමුදාවේ යම් නැවක අණ දෙන නිලධාරියා

(අ) සතුරා සමග වංක සහයෝගයෙන් යම් යාත්‍රාවක් බඩු කිසිවක් හෝ යම් දෙයක් කොල්ලකා ගතහොත් හෝ

(ආ) කොල්ලකා ගන්නා ලද යම් යාත්‍රාවක් බඩු කිසිවක් හෝ යම් දෙයක් මුදලට නිදහස් කිරීම පිණිස යම් තැනැත්තකු සමග නීති විරෝධී ලෙස එකග වුවහොත් හෝ

(ඇ) මුදලට නිදහස් කිරීම සඳහා නීති විරෝධී වූ යම් සහමතියක් අනුව හෝ අන් ලෙසකින් ඇති කර ගත් වංක සහයෝගයක් අනුව කොල්ලකා ගන්නා ලද යම් යාත්‍රාවක් බඩු කිසිවක් හෝ යම් දෙයක් තථ්‍යාකාරයෙන් ම නිදහස් කළහොත් හෝ ආපසු දුනහොත් ඔහු නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් අපකිර්තිසහගත ව නාවික හමුදාවෙන් පහ කිරීමේ දඩුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඩුවමක් ලැබිය යුතු ය.

වංචනික ලෙස ප්‍රයෝජනයට ගැනීමේ අදහසින් කොල්ලකා ගත් යාත්‍රාවක බඩුබැම

**100**. කොල්ලකා ගන්නා ලද හෝ යුද්ධයෙහි දී යම් බලයක් පාවිච්චි කිරීමෙහි ලා නොහොත් එවකට වලංගු ව ඇති යම් නීතියක් යටතේ රඳවා ගන්නා ලද යම් යාත්‍රාවක තිබෙන හෝ ඊට අයිති ව ඇති යම් දෙයක් වංචනික ලෙස ප්‍රයෝජනයට ගැනීමේ චේතනාවෙන් ඒ තැවෙන් බාන නාවික නීතියට යටත් සෑම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් අපකීර්ති සහගතව නාවික හමුදාවෙන් පහ කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබය යුතුය තවද ඊට අතිරේක ව අල්ලා ගත් දේවලින් ඔහුට ලැබිය යුතු කොටස ද අහිමි විය යුතුය.

නාවික හමුදාවේ පත් කිරීම් හෝ උසස් කිරීම් සම්බන්ධයෙන් නීති විරෝධී වූ ප්‍රතිජ්ඨාවක් දෙන හෝ ලබන නාවික නීතියට යටත් තැනැත්තෝ

**101**. නාවික හමුදාවේ යම් පත් කිරීමක් හෝ උසමස් කිරීමක් හෝ නාවික හමුදාවෙන් විශ්‍රාම ගැනීමක් හෝ එහි යම් රක්ෂාවක් සම්බන්ධයෙන් වටිනා යම් ප්‍රතිජ්ඨාවක් දෙන හෝ ලබන හෝ දීමට හෝ ලැබීමට ආධාර වන නාවික නීතියට යටත් සෑම තැනැත්තා ම නාවික වරදකට වරදකරු විය යුතු ය ඔහු විසින් අපකීර්තිසහගත ව නාවික හමුදාවෙන් පහ කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය

හානිකර වූ එළිදරවූ කිරීම

**102**. ලංකාවේ නාවික බල හමුදාවල් කිසිවක සංඛ්‍යා හෝ තත්ත්වය හෝ ඒ බල හමුදාවල්වල යුද්ධායුධ ගබඩා හෝ බඩු තොග කිසිවක් හෝ ඒ බල හමුදාවල්වල ක්‍රියා හෝ ගමන් සඳහා සූදානම්වීම හෝ ඒවාට සම්බන්ධ ආඥාවල් කිසිවක් එවැනි බලකායන්ට හානිකර බලපෑම් ඇති කරන හෝ හානිකර බලපෑම් ඇති කිරීමට ඉඩ ඇති ඒ බල හමුදාවල්වලට අහිජ්ඨ විපාක ගෙන දෙන වේලාවක අහිජ්ඨ විපාක ගෙන දෙන අයුරු කට වචනයෙන් හෝ ලියවිල්ලකින් හෝ සංඥාවකින් හෝ අන් ලෙසකින් එළදරවූ කරන නාවික නීතියට යටත් සෑම තැනැත්තාම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් අවුරුදු තුනකට අඩු නොවූ කාලයක් බරපතල වැඩ ඇති ව බන්ධනාගාරගත කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

සිවිල් වරදවල්වලට චෝදනා ලැබූ හෝ වරදකරුව කරනු ලැබූ නිලධාරීන් සහ නාවිකයන් සිවිල් අධිකරණයකට භාර දීම පැහැර හැරීම

**103**. සිවිල් අධිකරණයක් ඉදිරියේ සිවිල් වරදකට චෝදනා ලැබ හෝ වරදකරු කරනු ලැබ තම අණ යටතේ සිටින යම් නිලධාරියකු හෝ නාවිකයකු ඒ අධිකරණයට භාර දෙන ලෙස හෝ නීත්‍යානුකූල ව අත් අඩංගුවට ගැනීමෙහි ලා සහාය වන ලෙස තමන්ගෙන් ඉල්ලීමක් කරනු ලැබූ විට එසේ කිරම නො සලකා හරින හෝ ප්‍රතික්ෂෙප කරන සෑම අණ දෙන නිලධාරියා ම නාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් අපකීර්ති සහගතතත ව නාවික හමුදාවෙන් පහ කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් ලැබිය යුතුය.

නාවික විනය පිළිබඳව විශේෂයෙන් සඳහන් නොවූ වරදවල්

**104**. (1) මේ පනතේ අන් කිසි වගන්තියක විශේෂ විධි විධාන යොදනු ලැබූ වරදක් ලෙස නො සැලකෙන යම් ක්‍රියාවකින් හැසිරීමකින් පෙරලියකින් හෝ නො සැලකිල්ලකින් නිසි පාලනයට හා නාවික විනයට හානි පමුණුවන නාවික නීතියට යටත් සෑම තැනැත්තා මනාවික වරදකට වරදකරු විය යුතුය ඔහු විසින් අපකීර්ති සහගතව නාවික හමුදාවෙන් පහ කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් ව යම් දඬුවමක් ලැබිය යුතුය.

එසේ වුවද උත්තමාචාරයකදී ආචාර පෙළපාළියක දී උත්සවයක දී හෝ වෙනත් සේවා උත්සවයක දී එම වරද සංයුක්ත වන ක්‍රියාවක් හැසිරීමක් අවිනයක් හෝ පැහැර හැරීමක් කරනු ලැබුවේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා අවුරුදු විස්සකට

වැඩි නොවන කාලයක් සඳහා බරපතල වැඩ ඇතිව සිර දඬුවමකින් දඬුවම් කරනු ලැබිය යුතුය. සහ

(2) වෙනත් තැනැත්තකු විසින් මේ පනත යටතේ වූ වරදක් සිදු කිරීමෙහි ලා ඔහුට ආධාර කරන උපකාර කරන උපදෙස් දෙන හෝ ඔහු ලවා එම වරද සිදු කරවන නාවික නීතියට යටත් යම් තැනැත්තකු වරදකට වරද කරුවකු වන අතර පළමුවෙන් සඳහන් කරන ලද වරද සම්බන්ධයෙන් වන නඩු විභාගය සඳහා නිශ්චිතව දැක්වෙන ආකාරයට නඩු විභාගය පවත්වනු ලැබිය යුතු අතර පළමුවෙන් සඳහන් කරන ලද වරද සඳහා නිශ්චිතව දැක්වෙන දඬුවමටම යටත් විය යුතුය.

## නව වැනි කොටස
## මේ පනත යටතේ නාවික වරදවල් නොවන වරදවල්

නීති විරෝධී බඳවාගැනීම

**105**. නිසි බලය නොමැතිව

(අ) නාවික හමුදාවට ආධුනිකයන් සපයා දීමේ කාර්යය සඳහා හෝ නාවික හමුදාව සඳහා ආධුනිකයන් සම්බන්ධයෙන් දැන්වීම් හෝ නිවේදන පළ කරන හො පළ කරවන හෝ

(ආ) නාවික හමුදාවට ආධුනිකයන් සපයා දීම හා සම්බන්ධ වූ යම් ගෘහයක් සංකේතස්ථානයක් හෝ කාර්යාලයක් පිහිටුවන හෝ නඩත්තු කරන හෝ

(ඇ) පෙර කි න්දමේ යම් දැන්වීමක් හෝ නිවේදනයක් අනුව යම් තැනැත්තකු පිළිගත්තා හෝ

(ඈ) විධිමත් ලෙස පත් කරනු ලැබූ බඳවා ගන්නකු රාජකාරිය ඉටු කරද්දී නියම වශයෙන් හෝ අනියම් වශයෙන් ඊට අවහිර කරන නාවික නීතියට යටත් තැනැත්තකු හැර සෙසු සෑම තැනැත්තා ම වරදකට වරදකරු විය යුතුය සුලු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ඔහු අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා බරප තල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් පන්දහසකට වැඩි නොවන දඩයකින් හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකින්ම හෝ දඬුවම් කරනු ලැබිය යුතුය.

බඳවා ගැනීම සඳහා ඉල්ලුම් කරන්නන් ලබන අසත්‍ය පිළිතුරු

**106**. ඔහු නිලධාරියකු ලෙස පත්කිරීම හෝ නාවිකයකු ලෙස බඳවා ගැනීම සඳහා පැවැත්වුනු පරීක්ෂණයක දී තමන්ගෙන් අසන ලද යම් ප්‍රශ්නයකට දැනුවත් වම අසත්‍ය පිළිතුරක් දී ඇති, නාවික නීතියට යටත් තැනැත්තකු හැර , සෙසු සෑම තැකැත්තා ම වරදකට වරදකරු විය යුතුය. ඔහු , සුළු අපරාධ විනිශ්චය කරුවකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට , තුන් මසකට වැඩිනොවූ කාලයක් වැඩ නැතිව හෝ බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීමේ දඬුවම ලැබිය යුතුය.

පැන යාමට හෝ නිවාඩු නොගෙන බැහැරව සිටීමට නිලධාරීන් හෝ නාවිකයන් පෙලඹවීම ඔවුන්ට සහාය වීම.

**107**. යම් උපක්‍රමයකින්

(අ) යම් නිලධාරියකු හෝ නාවිකයකු පැනයාමට හෝ නිවාඩු නොලබා නොපැමින සිටින හෝ අනිසි ලෙස ඉවත්ව යන හෝ යම් නිලධරයකුට හෝ නාවිකයකුට සේවයඅත්හැර යාමට හෝ නිවාඩු නොලබා නොපැමින සිටීමට හෝඅනිසි ලෙස ඉවත්ව යාමට සැලසීමට හෝ අනුබල දීමට හෝ උත්සාහ කරන හෝ

(ආ) නිලධරයකු හෝ නාවිකයකු සේවය අත්හැර යාමට හෝ නිවාඩු නොලැබ නොපැමිණ සිටීමට හෝ අනිසි ලෙස ඉවත්ව යාමට යන බව දැනුවත්වම ඔහුට සේවය අත්හැර යාමට හෝ නිවාඩු නොලබා නොපැමිණ සටීමට හෝ ඇනිසි ලෙස ඉවත්ව යාමට උදව්වන

(ඇ) යම් නිලධයකු හෝ නාවිකයකු පැනයත්තකු බව හෝ නිවාඩු නොමැතිව නොපැමිණ සිටින්නකු හෝ අනිසි ලෙස ඉවත්ව ගිය අයකු බව දැනගෙනම ඒ නිලධාරියා හෝ නාවිකයා සගවා තබන හෝ සේවයේ යොදන හෝ සැගවීමේ ලා ඔහුට ආධාර වන හෝ අත්අඩංගුවේ ඔහු මුදාලන හෝ මිදීමෙහි ලා ඔහුට ආධාර වන

නාවික නීතියට යටත් තැනැත්තකු හැර සෙසු සැම තැනැත්තාම වරදකට වරදකරු විය යුතුය. ඔහු සුළු අපරාධ විනිශ්වය කරුවකු ඉදිරියේ පැවැත්වෙන ලඝුනඩු විභාගයකින් පසු වරදකරු කරණු ලැබූ විට අවුරුදු දෙකකට වැඩි නොවූ කාලයක් වැඩ නැතිව හෝ බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමේ දඩුවම ලැබිය යුතුය.

**නාවික රාජකාරි වලට මැදිහත් වීම**

108. (අ) යම් නිලධාරියකු හෝ නාවිකයකු ඔහුගේ රාජකාරිය ඉටු කරද්දී ඕනෑකමින්ම ඒ රාජකාරිවලට බාධා පමුණුවන අවහිර කරන හෝ අන්ලෙසකින් මැදිහත් වන හෝ

(ආ) නිලධාරියකු හෝ නාවිකයකු ලෙස හදුන්වන යම් තැනැත්තකුට නාවික සේවයෙන් වැලකී සිටිය හැකි වන සේ ඒ නිලධාරියා හෝ නාවිකයා තුල ඕනෑකමින්ම යම් රෝගයක් හෝ බෙලහීනතාවක් හෝ අබ්බගාත කමක් හෝ තුවාලයක් ඇති කරන හෝ

(ඇ) නිත්‍ය වශයෙන්ම හෝ තාවකාලික වශයෙන් සේවයට නුසුදුසු කර ගැනීමේ ශක්තියක් නිලධාරියකුට හෝ නාවිකයකුට ගෙන දෙන චේතනාවෙන් හෝ එසේ තමා සේවයට නුසුදුසුය යන විශ්වාසය ඒ නිලධාරියා තුල හෝ නාවිකයා තුල ඇති කරවන චේතනාවෙන් නිත්‍ය වශයෙන් හෝ තාවකාලික වශයෙන් සේවයට නුසුදුසු කිරීමට හෝ නුසුදුසුය යන විශ්වාසය ගෙන දීමට අභිප්‍රේත වූ හෝ හැකි හැම වූ යම් ඖෂධයක් හෝ සම්මිශ්‍රණයක් ඒ නිලධාරියාාට හෝ නාවිකයාට හෝ ඔහුගේ ප්‍රයෝජනය පිණිස සපයන,

නාවික නිතියට යටත් තැනැත්තකු හැර සෙසු සැම තැනැත්තා ම වරදකට වරදකරු විය යුතුය ඔහු සුළු අපරාධ විනිශ්වයතකරුවකු කරනු ලැබූ විට රුපියල් දාහකට වැඩි නොවූ දඩයකින් හෝ මාස හයකට වැඩි නොවූ කාලයක් වැඩ නැති ව හෝ බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමෙන් හෝ ඒ දඩය හා ඒ බන්ධනාගාරගත කිරීම යන දෙකින් ම දඩුවම් ලැබිය යුතුය.

**නාවික හමුදාවේ පත් කිරීම් හා උසස් කිරීම් සම්බන්ධයෙන් නිති විරෝධි වූ ප්‍රතිජ්ඨාවක් දෙන හෝ ලබන නාවික නිතියට යටත් නොවූ තැනැත්තෝ**

109. නාවික හමුදාවේ යම් පත් කිරීමක් හෝ උසස් කිරීමක් හෝ නාවික හමුදාවෙන් යම් විශ්‍රම ගැනීමක් හෝ එහි යම් රක්ෂාවක් සම්බන්ධයෙන් වටිනා යම් ප්‍රතිජ්ඨාවක් දෙන හෝ ලබන හෝ දීමට හෝ ලැබීමට ආධාර වන නාවික නීතියට යටත් තැනැත්තකු හැර සෙසු සැම තැනැත්තා ම වරදකට වරදකරු විය යුතු ය ඔහු සුළු අපරාධ විනිශ්වයකරුවකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දාහකට වැඩි නොවූ දඩයකින් හෝ මාස හයකට වැඩි නොවූ කාලයක් වැඩ නැතිව හෝ බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමෙන් හෝ ඒ දඩය හා ඒ බන්ධනාගාරගත කිරීම යන දෙකින් ම දඩුවම් ලැබිය යුතුය.

නාවික දේපළ මිලට ගැනීම

**110.** (1) නාවික හමුදාවේ යම් දේපළක්

(අ) මිලට ගන්න හුවමාරු කරන උකසට ගන්න තබාගන්න හෝ මොනයම් ව්‍යාජයකින් වුව ද යම් තැනැත්තෙකුගෙන් භාර ගන්නා හෝ

(ආ) විකිණීමට හුවමාරු කිරීමට උකස් කිරීමට දීමට හෝ විනාශ කිරීමට යම් තැනැත්තකු අයදින හෝ පොළඹවන හෝ

(ඇ) විකිණීමෙහි හුවමාරු කිරීමෙහි උකස් කිරීම විනාශ කිරීම හෝ බැහැර කිම ලා යම් තැනැත්තකුට ආධාරවන හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන

නාවික නීතියට යටත් තැනැත්තකු හැර සෙසු සෑම තැනැත්තාම ඒ දේපළ නාවික හමුදාවේ දේපළක් බව නොදැනුවත් ව ක්‍රියා කළ බව හෝ නාවික හමුදාධිපතිගේ ආඥාවක් අනුව හෝ කැමැත්ත ඇති ව එය විකිණීමට ඉදිරිපත් කළ විටක මිලට ගත් බව හෝ නිලධාරියකු හෝ නාවිකයකු වි සිට ඒ තත්වයෙන් තොරවූ තැනැත්තකුගේ හෝ මිය ගිය නිලධාරියකු හෝ නාවිකයකු වෙනුවෙන් පෙනී සිටින නීත්‍යානුකූල නියෝජිතයාගේ පෞද්ගලික දේපළක් බව ඔප්පු කළහොත් මිස වරදකට වරදකරු විය යුතුය. ඔහු සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙසියකට වැඩි නොවූ දඩයකින් හා ඊට අතිරේක ව ඔහුගේ වරදේ මාර්ගයෙන් ඔහුට අයිති ව ඇති යම් දේපළක වටිනාකම මෙන් තුන් ගුණයක් වූ දණ්ඩනයකින් හෝ මාස හයකට වැඩි නො වූ කාලයක් වැඩ නකැති ව හො බරපතල වැඩ ඇති ව බන්ධනාගාරගත කිරීමෙන් හෝ ඒ දඩය හා ඒ බන්ධනාගාරගත කිරීම යන දෙකින් ම දඬුවම් ලැබිය යුතුය ඒ දණ්ඩනය සුළු අපරාධ විනිශ්චයකරු විසින් නියම කරනු ලැබූ දඩයක් අය කර ගන්නා ආකාරයෙන් ම අය කර ගත හැකිය.

(2) යම් තැනැත්තකු සතුව හෝ ළඟ තිබී සොයා ගත් මේ දේපළක් සොරකම් කොට තිබෙන හෝ මේ වගන්තියට පටැනි ව මිලට ගෙන හුවමාරු කොට ගෙන උකසට ගෙන ලබා ගෙන හෝ භාර ගෙන තිබෙන නාවික දේපළක් බව ඇදහීමට සාධාරණ හේතුවක් ඇති අවස්ථාවක ඔහු සුළු අපරාධ අධිකරණයක් ඉදිරියට පැමිණවීම හෝ කැඳවීම කළ හැකි ය ඒ දේපළ ලබාගත්තේ නීත්‍යානුකූලවත් මේ පනතට පටහැනි නොවන ලෙසත් ය යි අධිකරණයට ඒත්තු ගැන්වීමට ඔහු අසමත් වුවහොත් ලඝු නඩු විභාගයකින් පසු ඔහු වදරකරු කරනු ලැබ් විට මිට පෙරාතුව ම ඇති උපවගන්තිය උල්ලංගණය කිරීමකට නියම කරනු ලබන දඬුවම් ම ඔහු විසින් ලැබිය යුතුය.

**(3)** මේ වගන්තිය යටතේ වරදක් කොට අසු වූ තැනැත්තකු වරෙන්තුවක් නොමැති ව අත්අඩංගුවට ගැනීම ද වරදට විෂය වූ දේපළත් සමග ම ඔහු සුළු අපරාධ අධිකරණයක් ඉදිරයට ගෙන යාම ද කළ හැකිය.

(4) යම් තැනැත්තකු දිවුරුම් පිට හෝ සහතික ප්‍රකාශයක් පිට සාක්ෂි දීමේ දී මේ වගන්තිය යටතේ කොට ඇති යම් වරදකට සම්බන්ධ වූ යම් දේපළක් වෙන යම් තැනැත්තකු සතුව හෝ ඔහු ගේ ගෙදරදොරෝ ඇතැයි සැක කිරීමට සාධාරණ හේතුවක් ඇති බව

සුළු අපරාධ අධිකරණයකට ඒත්තු ගියහොත් සොරා ගත් දේපළ සම්බන්ධයෙන් මෙන් ම ඒ දේපළ සෙවීම පිණිස වරෙන්තුවක් පිට කළ හැකි ය තවද ඒ වරෙන්තුව ක්‍රියාත්මක කිරීමේ කාර්යය පැවරුණු නිලධාරියා විසින් ඒ අනිත් තැනැත්තා හෝ ඔහුගේ ගෙදරදොර සෝදිසි කිරීමේ දී සොයා ගනු ලබන එබඳු යම් දේපළක් තහනමට ගත යුතු අතර ඒ දේපළ සතු කොට ගෙන සිටි තැනැත්තා සමග නීති ප්‍රකාර කටයුතු කිරීම පිණිස ඔහු ඒ අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතුය.

(5) මේ වගන්තිය පිළිබඳ කාර්යයන් සඳහා තැනැත්තකු වෙනුවෙන් අන්කිසි තැනැත්තකු සතු කොට ගෙන හෝ ළඟ තබා ගෙන ඇති දේපළක් වුවහොත් එය ඒ තැනැත්තා සතු කොට ගෙන හෝ ළඟ තබා ඇති දේපළක් ලෙස සැලකිය යුතුය.

**නයට ඇපයක් වශයෙන් නාවික සහතිකයක් සතු කොට ගැනීම**

111. නාවික විශ්‍රාම වැටුපකට හෝ පඩියකට නාවික සේවය සම්බන්ධයෙන් ප්‍රදානය කරන ලද යම් ත්‍යාගයකට දීමනාවකට පාරිතෝෂිකයකට සහනයකට ප්‍රතිලාභයකට හෝ වාසියකට යම් තැනැත්තකු සතු හිමිකමට සාක්ෂි වශයෙන් හෝ ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද යම් හැඳින්වීමේ සහතිකයක් ජීවිත සහතිකයක් හෝ වෙනත් සහතික්යක් හෝ කාර්යාලීය ලිපියක් හිමි තැනැත්තා ගෙන් තමාට හෝ අන්කිසි තැනැත්තකුට ලැබිය යුතු ණයක් අයකර ගැනීමේ අදහසින් හෝ ණයකට උකසක් හෝ ඇපයක් වශයේන එය ලබන හෝ සතු කොට ගෙන සිටින නාවික නීතියට යටත් තැනැත්තකු හැර සෙසු සැම තැනැත්තා ම වරදකට වරදකරු විය යුතුය ඔහු සුළු අපරාධ විනිශ්චයකාරුවකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙසියකට වැඩි නොවූ දඩයකින් හෝ මාස හයකට වැඩි නොවූ කාලයක් වැඩ නැතිව හෝ බරපතල වැඩ ඇති ව බන්ධනාගාරගත කිරීමෙන් හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දෙකින් ම දඬුවම් ලැබිය යුතු ය.

**බලය නොලැබ නාවික පළඳනා ආදිය පාවිච්චි කිරීම**

112. (අ) නිත්‍යානුකූල බලයක් නොමැති ව රූවටීමේ අදහසින් යම් නාවික පළඳනාවක් පදක්කමක් පදක්කම් බඳනයක් නිල ලකුණක් සම්මාන පටියක් හෝ සංකේතයක් හෝ එහි යම් අනුකෘතියක් පාවිච්චි කරන හෝ පළඳින හෝ

(අ) එබඳු යම් පළඳනාවක් පදක්කමක් පදක්කම් බඳනයක් නිල ලකුණක් සම්මාන පටියක් හෝ සංකේතයක් පාවිච්චි කිරීමට හෝ පැළඳීමට බලය හිමිකම් ලැබූ හෝ ලබා සිටින තැනැත්තකු ලෙස ව්‍යාජයෙන් පෙනී සිටින හෝ

(ඇ) එබඳු යම් පළඳනාවක් පදක්කමක් පදක්කම් බඳනයක් නිල ලකුණක් සම්මාන පටියක් හෝ සංකේතයක් පාවිච්චි කිරීමට හෝ පැළඳීමට බලය නොලත් යම් තැනැත්තකු වෙත නිත්‍යානුකූල බලයක් හෝ හේතුවක් නොමැති ව එබන්දක් සපයන හෝ සැපයීමට කැමති වන නාවික නීතියට යටත් තැනැත්තකු හැර සෙසු සැම තැනැත්තා ම වරදකට වරදකරු විය යුතු ය ඔහු සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබ් විට රුපියල් දෙසියකට වැඩි නොවූ දඩයකින් හෝ මාස තුනකට වැඩි නොවූ කාලයක් වැඩ නැති ව හො බරපතල වැඩ ඇති ව බන්ධනාගාර ගතකිරීමෙන් හෝ ඒ දඩය හා ඒ බන්ධනාගාරගත කිරීම යන දෙකින් ම දඬුවම් ලැබිය යුතුය.

**සේවා යෝජකයන්ගේ බැඳීම**

113. (1) තම සේවයේ යෙදී සිටින යම් තැනැත්තකුට ස්වේච්ඡා නාවික බල හමුදාවේ හෝ ස්වේච්ඡා නාවික උපසේවයේ සාමාජිකයකු වීමට හෝ සාමාජිකයකු ව සිටීමට ද ඒ බල හමුදාවේ හෝ උපසේවයේ සාමාජිකයකු වූ එබඳු යම් තැනැත්තකුට මේ පනතේ බලය ප්‍රකාර ලැබීමට සහ ඉටු කිරීමට නියම කරනු ලබන නාවික පුහුණුව සහ

සේවය ලැබීමට සහ ඉටු කිරීමට ද හැකිවනු පිණිස නිසි පහසුකම් සියල්ල සලසා දීම සෑම සේවායෝජකයකුගේ ම යුතුකම විය යුතු ය.

(2) (අ) (1) වෙනි උපවගන්තයේ සඳහන් පහසුකම් සලසා නො දෙන හෝ

(ආ) ඒ උපවගන්තියේ සඳහන් යම් පුහුණුවක් හෝ සේවයක් ලැබීම සහ ඉටු කිරීම නිසා සේවකයකු සේවයෙන් පහ කරන හෝ ඔහුගේ වැටුප් අඩු කිරීමෙන් හෝ වෙන යම් ක්‍රමයකින්දඬුවම් කරන යම් සේවකයෝජකයකු වරදකට වරදකරු විය යුතුය ඔහු සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් සියයකට වැඩි නොවූ දඩයකින් හෝ මාස හ යකට වැඩි නොවූ කාලයක් වැඩ නැතිව හෝ බරපතල වැඩ ඇති ව බන්ධනාගාරගත කිරීමෙන් හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දෙකින් ම දඬුවම් ලැබිය යුතුය.

අසෙනික වූ සාක්ෂි කරුවකුගේ නොමනා හැසිරීම

114. නාවික නිතියට යටත් තැනැත්තකු හැර වෙන යම් තැනැත්තකු

(අ) ඔහුගේ පැමිණීම සම්බන්ධයෙන් වන සාධාරණ වියදම් ගෙවීමෙන් පසු හෝ ගෙවන බව දැන්වීමෙන් පසු සාක්ෂිකරුවකු ලෙස යුද්ධාධිකරණයක් ඉදිරියට හෝ මේ පනත යටතේ අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරියකු ඉදිරියට විධිමත් ලෙස කැඳවනු ලැබූ සිටිය දී පැමිණීම පැහැර හරින අවස්ථාවක හෝ

(ආ) සාක්ෂිකරවකු ලෙස යුද්ධාධිකරණක් ඉදිරියට හෝ ඒ නිලධාරියා ඉදිරියට පැමිණ සිටියදි

(i) ඒ යුද්ධාධිකරණය විසින් හෝ නිලධාරියා විසින් දෙන ලෙස හෝ කරන ලෙස නිත්‍යානුකූල ව ඔහුට නියම කරනු ලබන යම් දිවුරුමක් හෝ යම් සහතික ප්‍රකාශයක් දීම හෝ කිරීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක හෝ

(ii) ඒ යුද්ධාධිකරණය විසින් හෝ නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලෙස නිත්‍යානුකූල ව නියම කරනු ලබන පරිදි ඔහුගේ බලය ප්‍රකාර හෝ ඔහුගේ පාලනය යටතෙහි වූ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක හෝ

(iii) ඒ යුද්ධාධිකරණය විසින් හෝ නිලධාරියා විසින් පිළිතුරු දෙන ලෙස ඔහුට නිත්‍යානුකූල ව නියම කරනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක

ඔහු වරදක් කරන බව සලකනු ලැබිය යුතුය තවද යුද්ධාධිකරණයේ සභාපති විසින් හෝ ඒනිලධාරියා විසින් ඒ තැනැත්තාගේ ඒ වරද තම අත්සනින් සහතික කොට ලගම ඇති කලාපයේ පවත්වනු ලබන මහාධිකරණය වෙත දන්වා යැවිය හැකිය එවිට ඒ අධිකරණය විසින් ඒ අධිකරණයේ දි ඒ තැනැත්තා එවැනි ම වරදක් කළ විටක මෙන් ඔහු සම්බන්ධයෙන් කටයුතු කළ හැකි ය.

අසෙනික සාක්ෂි කරුවකු බොරු සාක්ෂි දීම හා අපහාස කිරීම 15 වෙනි අධිකාරිය

**115.** (1) නාවික නීතියට යටත් තැනැත්තකු හැර වෙන යම් තැනැත්තකු යුද්ධාධිකරණයක් ඉදිරියේ හෝ මේ පනත යටතේ අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරියකු ඉදිරියේ දිවුරුම් පිට හෝ සහතික ප්‍රකාශයක් පිට ප්‍රශ්න කරනු ලැබූ විට ඔහු දැනුවත්ව ම බොරු සාක්ෂියක් දුන් අවස්ථාවක දණ්ඩ නීති සංග්‍රහයේ ඩප වෙනි පරිච්ඡේදය යටතේ ඔහු බොරු සාක්ෂි දීමේ වරද කළ බව සලකනු ලැබිය යුතු ය ඔහුට විරුද්ධව චෝදනා තත්වාකාරයෙන් දඬුවම් කළ හැකි ය.

(2) නාවික නීතියට යටත් තැනැත්තකු හැර වෙනයම් තැනැත්තකු යුද්ධාධිකරණයක් ගැන හෝ මේ පනත යටතේ අධිකරන බලතල පාවිච්චි කරන නිලධාරියකු ගැන හෝ යුද්ධාධිකරණයකට හෝ එබඳු නිලධාරියකුට නින්දා සහගත හෝ තර්ජනාත්මක වචන පාවිච්චි කරන හෝ යුද්ධාධිකරණයක හෝ එබඳු නිලධාරියකුගේ නීතිකෘත්‍යවලට යම් අවහිරයක් හෝ බාධාවක් පමුණුවන හෝ යුද්ධාධිකරණයක් හෝ එබඳු නිලධාරියකු නොහොත් යුද්ධාධිකරණයක් ඉදිරියේ හෝ එබඳු නිලධාරියකු ඉදිරියේ වූ සාක්ෂිකරුවන් තම්මා ගැනීමට හෝ යුද්ධාධිකරණයක් හෝ එබඳු නිලධාරියකු අවමානයට ලක් කිරීමට අභිප්‍රේත වූ අදහස් මුද්‍රණය කරන හෝ ප්‍රසිද්ධ කරන හෝ වචන පවසන අවස්ථාවක ඔහු යුද්ධාධිකරණයට හෝ ඒ නිලධාරියාට අපහාස කිරීමේ වරද කරන බව සලකනු ලැබිය යුතුය තව ද යුද්ධාධිකරණයේ සභාපති විසින් හෝ ඒ නිලධාරියා විසින් ඒ තැනැත්තා ගේ එකී වරද තම අත්සනින් සහතික කොට ශ්‍රේෂ්ඨාධිකරණය වෙත දන්වා යැවිය හැකිය එවිට ඒ අධිකරණයේ බලයට විරුද්ධ ව අපහාස කිරීමේ වරදකට ඔහු චෝදනා ලැබූ විටක මෙන් ඒ අධිකරණය විසින් ඒ තැනැත්තා සම්බන්ධයෙන් කටයුතු කළ හැකි ය.

බලය නොලැබ නාවික පුහුණුවක් බඳු පුහුණුවක් ලබාදීම

**116.** ජනාධිපතිගේ අවසරය නොමැති ව යම් නාවික යුධායුධයක් පරිහරණය කිරීමේ ලා පුහුණුව ලබමින් සිටින හෝ නාවික පුහුණුවක් බඳු යම් පුහුණුවක් ලබමින් සිටින තැනැත්තන්ගේ යම් සංගමයක් හෝ සංස්ථාව ක් යම් තැනැත්තකු ආරම්භ කරන විට හෝ සංවිධානය කරන විට හෝ එහි සාමාජිකයකු වන විට ඔහු වරදකට වරදකරු විය යුතුය ඔහු සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට මාස හයකට වැඩි නොවූ කාලයක් වැඩ නැති ව හෝ බරපතල වැඩ ඇති ව බන්ධනාගාරගත කිරීමේ දඬුවම ලැබිය යුතු ය.

ගැලවී යාමෙහි දී හෝ ගැලවී යාමට තැත්කිරීමේ දී නාවික සිරකරුවන්ට ආධාර වන හෝ නාවික බන්ධනාගාර නියෝග කඩ කරන නාවික නීතියට යටත් නොවූ තැනැත්තෝ

**117.** (1) යම් නාවික සිරකරුවකුගේ ගැලවී යාම පහසු කරලීමේ කාර්යය සඳහා නාවික බන්ධනාගාරයක් හෝ නාවික නිවර්තන නිවාසයක් තුළට භාණ්ඩ කිසිවක් ගෙන යන හෝ ගෙන යාමට සලස්වන හෝ යම් නාවික බන්ධනාගාරයකින් හෝ නාවික නිවර්තන නිවාසයකින් ගැල වී යාමට හෝ ගැල වී යාමෙහි ලා දරන තැතකදී යම් නාවික සිරකරුවකුට කවරාකාර උපක්‍රමයකින් වුව ද ආධාර වන නාවික නීතියට යටත් තැනැත්තකු හැර සෙසු සැම තැනැත්තාම වරදකට වරදකරු විය යුතු ය

ඔහු සුලු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගය කින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු දෙකකට වැඩි නොවූ කාලයක් වැඩ නැති ව හෝ බරපතල වැඩ ඇති ව බන්ධනාගාරගත කිරීමේ දඬුවම ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ නාවික බන්ධනාගාර සහ නාවික නිවර්තන නිවාස සම්බන්ධයෙන් පැනවිය හැකි නියෝගවලට පටහැනි ව (1)වෙනි උපවගන්තියේ විශේෂිත වූ කාර්යය හැර වෙනයම් කාර්යයක් සඳහා යම් නාවික බන්ධනාගාරයක් තුළට හෝ නාවික නිවර්තන නිවාසයක් තුළට යම් භාණ්ඩයක් ගෙන එන හෝ

ගෙන ඒමට තැත් කරන නාවික නිතියට යටත් තැනැත්තකු හැර සෙසු සැම තැනැත්තා ම වරදකට වරදකරු විය යුතුය ඔහු සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරියේ පැවැත්වෙන ළඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙසියකට වැඩි නොවූ දඩයකින් දඬුවම් ලැබිය යුතු ය.

## දහවන කොටස
## යුද්ධාධිකරණය විසින් සිවිල් වරදවල් සම්බන්ධයෙන් දෙනු ලබන දඬුවම්

118. (1) රාජද්‍රෝහිවීමේ වරදට යුද්ධාධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ නාවික නිතියට යටත් සැම තැනැත්තා විසින් ම මරණ දඬුවම ලැබිය යුතු ය.

(2) මිනිමැරීමේ වරදට යුද්ධාධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ නාවික නිතියට යටත් සැම තැනැත්තා විසින් ම මරණ දඬුවම ලැබිය යුතුය.

(3) මිනි මැරීමේ වරදට අයත් නොවන සාපරාධ මනුෂ්‍ය ඝාතන යේ වරදකට යුද්ධාධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ නාවික නිතියට යටත් සැම තැනැත්තා විසින් ම අවුරුදු විස්සකට වැඩි නොවූ කාලයක් වැඩ නැතිව හෝ බරපතළ වැඩ ඇති ව බන්ධනාගාරගත කිරීමේ දඬුවම ලැබිය යුතුය.

(4) ස්ත්‍රී දූෂණය කිරීමේ වරදට යුද්ධාධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ නාවික නිතියට යටත් සැම තැනැත්තා විසින් ම අවුරුදු විස්සකට වැඩි නොවූ කාලයක් වැඩ නැතිව හෝ බරපතල වැඩ ඇති ව බන්ධනාගාරගත කිරීමේ දඬුවම ලැබිය යුතු ය.

118 වෙනි වගන්තියේ සදහන් නොවූ යම අසෛනික වරදක්

119. 118 වෙනි වගන්තියේ සදහන් නොවූ යම් අසෛනික වරදකට යුද්ධාධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ නාවික නිතියට යටත් සැම තැනැත්තා විසින් ම

(අ) අපකිර්ති සහගත ව හෝ අපකිර්තියෙන් තොර ව නාවික හමුදාවෙන් පහ කිරීමේ දඬුවම හෝ දණ්ඩන ක්‍රමයේ ඊට වඩා ලිහිල් වූ යම් දඬුවමක් හෝ

(ආ) මේ පනත හැර ලංකාවේ වෙන යම් නිතියකින් එ වරදට නියම කෙරෙන දඬුවමක් ලැබිය යුතුය.

## එකලොස් වන කොටස
## යුද්ධාධිකරණ විසින් සහ අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරින් විසින් දඬුවම් දිම

දණ්ඩන ක්‍රමය

120. යුද්ධාධිකරණ විසින් හෝ මේ පනත යටතේ අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරින් විසින් වරදවල් වලට වරදකරුවන් කරනු ලබන තැනැත්තන්ට තදබලකම අඩුවි යන පිළිවෙළින් මේ පනතේ විධිවිධානවලට යටත් ව පැනවිය හැක දණ්ඩන ක්‍රමය මෙහි පහත දැක්වෙන පරිදි විය යුතුය.

(අ) මරණය
(ආ) බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරිම

(ඇ) අපකීර්තිය සහිතව නාවික හමුදා සේවයෙන් නෙරපීම
(ඈ) බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම
(ඉ) අපකීර්තිය නොමැතිව නාවික හමුදා සේවයෙන් නෙරපීම
(ඊ) රඳවා තබා ගැනීම
(උ) යම් නිශ්චිත කාලයකට හෝ අන්‍යාකාරයකට නිලධරයකු ලෙස ඇති ජ්‍යෙෂ්ඨත්වය නැති කිරීම
(ඌ) යටත් නිලධරයන් බලලත් නිලධරයන් හෝ සුළු නිලධරයන් නිල තත්වයෙන් පහත දැමීම
(එ) වැටුප් දීමනා සහ අයවිය යුතු වෙනත් දීමනා වරදකරුට දෙන ලද නිල ලාංඡන සැරසුම් හෝ එවැනි වෙනත් දේ රාජසන්තක කිරීම තවද සේවය අත්හැර යාමකදී සේවය අත්හැරගිය තැනැත්තා විසින් නැවේ හෝ ඔහු අත්හැර ගිය ස්ථානයේ දමා ගිය සියලු ඇඳුම් හා වෙනත් බඩු බාහිරාදිය රාජ සන්තක කිරීම
(ඒ) දැඩි ලෙස තරවටු කිරීම
(ඔ) තරවටු කිරීම
(ඕ) නියම කරනු ලැබිය හැකි වෙනත් සුළු දඬුවම්

දඬුවම් දීම සම්බන්ධව විශේෂ විධි විධාන

121. යුද්ධාධිකරණ විසින් හෝ මේ පනත යටතේ අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරින් විසින් දඬුවම් දීම සම්බන්ධයෙන් පහත සඳහන් විධි විධාන අදාල විය යුතුය -

(අ) යුද්ධාධිකරනයක සාමාජික සංඛ්‍යාව පහකට වැඩි නොවූ අවස්ථාවක පැමිණ සිටින සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙන් හතර දෙනෙකු හා යුද්ධාධිකරණයේ සාමාජික සංඛ්‍යාව පස් දෙකනුට වැඩි වූ අවස්ථාවක පැමිණ සිටින සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකොටසකට අඩු නොවූ සංඛ්‍යාවක් ද දණ්ඩන නියමයට එකග වුවහොත් මිස යුද්ධාධිකරණයක් විසින් කිසිම තැනැත්තකුට ම රණ දණ්ඩනය නියම නො කළ යුතු ය.

(ආ) වරදකරුවාට ලැබිය යුතු පඩි දීමනා සහ වෙනත් වේතන සියල්ල ද ප්‍රදානය කරන ලද පදක්කම් සහ පළදනා සියල්ල ද අහිමි වන බවත් ශ්‍රී ලංකා නාවික හමුදාවේ යුද්ධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නැවත සේවය කිරීමට හෝ රජයේ යම් නිලයක් දැරීමට ද නොහැකි වන බවත් සෑම අවස්ථාවන්හි දි ම නාවික හමුදාවෙන් අපකීර්තිසහගත ව පහ කිරීමේ දණ්ඩන නියමයට ඇතුලත් විය යුතුය.

(ඇ) බන්ධනාගාරගත කිරීමේ වාරයෙන් යම් විටක දි දින දහ හතරකට වැඩි නොවූ ද යම් අවුරුද්දක දි දින අසූහතරකට වැඩි නොවූ ද යම් කාල සීමාවක් හුදකලාව සිර කොට තැබීමේ කාලසීමාවලට වඩා අඩු නොවූ කල් පවතින අතරවාර ඒ කාලසීමාවේ වඩා අඩු නොවූ කල් පවතින අතරවාර එ කාලසීමාව මධ්‍යයේ ඇති ව සිරකරුවා හුදකලාව සිර කොට තැබිය යුතුය යනුවෙන් හා බන්ධනාගාරගත කිරීමේ වාරය දින අසූහතරකට වැඩි වූ විට ඒ මථ වාරයෙන් යම් දින විසි අටක් තුළ දි හුදකලාව සිර කොට තැබීමේ කාල සීමාවලට වඩා අඩු නොවූ කල් පවතින අතරවාර ඒ කාලසීමා මධ්‍යයේ ඇති ව හුදකලාව සිර කොට තැබීමේ කාලය දින හතකට වැඩි නොවිය යුතු ය යනුවෙන් ද ඇති මේ නියය බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයට එකතු කල හැකිය.

(ඇ) මේ පනතේ අන් ලෙසකින් ප්‍රකාශිත ව ම විධිවිධාන යොදනු ලැබුවහොත් මිස රඳවා තැබීමේ දඬුවම දිය හැකිවනුයේ අවුරුදු දෙකකට වැඩි නොවූ යම් කාලයකට ය.

(ඉ) සුළු නිලධාරියකු බන්ධනාගාරගත කරනු ලබන හෝ රඳවා තබනු ලබන අවස්ථාවක තත්වය පහත් කිරීම දඬුවමට ඇතුලත් විය යුතු අතර සෑම අවස්ථාවන්හි දී ම බන්ධනාගාරගත කිරීමේ හෝ රඳවා තැබීමේ කාලය තුළ වැටුප් නැවැත්වීම ද දඬුවමට එකතු කල යුතු ය.

එසේ වුවද නියම කරන ලද දඬුවම දින දහ හතරකට වැඩි නොවූ කාලයක් රඳවා තැබීම වූ අවස්ථාවක රඳවා තැබීමේ කාලය තුළ පඩි නැවැත්වීම දඬුවමට එකතු කළ යුතු නොවේ ය යි දණ්ඩන නියමයෙන් නියම කළ හැකි ය.

## දොළොස්වන කොටස
## යුද්ධාධිකරණවලින් හා අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරීන් විසින් කෙරෙන දණ්ඩන නියම ප්‍රතිශෝධනය කිරීම හා ක්‍රියාවේ යෙදවීම

දණ්ඩන නියම ප්‍රතිශෝධනය කිරීම

**122.** යුධාධිකරණයක් විසින් හෝ මේ පනත යටතේ අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරියකු විසින් කරනු ලබන යම් දණ්ඩන නියමයක් (මරණ දණ්ඩන නියමයක් ඇතුලුව ) අවලංගු කිරීම අත්හිටවීමට හෝ වෙනස් කිරීම හෝ එබඳු යම් දණ්ඩන නියමයක ඇතුලත් දඬුවමකට වඩා ප්‍රමාණයෙන් අඩු වූ දඬුවමක් ඒ වෙනුවට ආදේශ කිරීම හෝ එබඳු යම් දණ්ඩන නියමයක ඇතුලත් දඬුවම සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් ලිහිල් කිරීම හෝ එබඳු යම් දණ්ඩන නියමයක ඇතුලත් දඬුවම පරිවර්තනය කිරීමෙන් පනවා ඇති දඬුවම සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් ලිහිල් කිරීම ජනාධිපති විසින් කළ හැකිය එසේ වෙනස් කරනු ලැබූ යම් දණ්ඩන නියමයක් මේ පනතේ විධිවිධානවලට යටත් ව වලංගු විය යුතුය තවද ඒ යුධාධිකරණය හෝ නිලධාරියා විසින් එබඳු වෙනස් කිරීමක් ද සහිතව ඒ දණ්ඩනය මුලින් ම නියම කරනු ලැබූ විටක මෙන් එය ක්‍රියාවේ යෙදවිය යුතුය.

එසේ වුවද යම් දණ්ඩන නියමයක ඇතුලත් දඬුවමේ ප්‍රමාණය හෝ එය පවත්නා කාලය එබඳු යම් වෙනස් කිරීමක් මගින් වැඩි කරනු නොලැබිය යුතුය.

මරණ දණ්ඩන නියමය

**123.** යුධාධිකරණයක් විසින් කරන ලද මරණ දණ්ඩන නියමයක් ජනාධිපති විසින් ස්ථිර කරනු ලබන තෙක් ක්‍රියාවේ යොදනු නො ලැබිය යුතුය.

නියම කිරීමේ බලධාරියෝ

**124.** (1) නාවික සිරකරුවකු බන්ධනාගාරයට හෝ නිවර්තන නිවාසය නියම කිරීමට අණ කිරීමේ බලය ජනාධිපති විසින් ඒ සඳහා බලය පවරනු ලැබ තනතුරින් අණ දෙන්නකුට වඩා පහත් සෑම නිලධාරියාටම තිබිය යුතුය

(2) ආඥාවක් කිරීමට (1) වෙනි උපවගන්තිය යටතේ බලය ලත් නිලධාරියකු මෙහි මින්මතු නියම කිරීමේ බලධාරියා නමින් හඳුන්වනු ලැබේ.

නාවික සිරකරුවන් නියම කිරීම මාරු කිරීම ඉවත් කිරීම සහ නිදහස් කිරීම

**125.** (1) නාවික සිරකරුවකු බන්ධනාගාරයට හෝ නිවර්තන නිවාසය නියම කිරීම සඳහා නියම කිරීමේ බලධාරියකු විසින් කරනු ලබන ආඥාව ප්‍රමාණවත් වූ බලපත්‍රයක් විය යුතුය.

(2) නාවික සිරකරුවකු බන්ධනාගාරයේ සිට නිවර්තන නිවාසය වෙත හෝ නිවර්තන නිවාසයේ සිට බන්ධනාගාරය වෙත හෝ යම් බන්ධනාගාරයක සිට හෝ නිවර්තන නිවාසයක සිට වෙන යම්

බන්ධනාගාරයක් වෙත හෝ නිවර්තන නිවාසයක් වෙත මාරු කිරීම සඳහා නියම කිරීමේ බලධාරියකු විසින් කරනු ලබන ආඥාව ප්‍රමාණවත් වූ බලපත්‍රයක් විය යුතුය

(3) යුධාධිකරණයක් විසින් හෝ මේ පනත යටතේ අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරියකු විසින් කරන ලද දණ්ඩන නියමයක් ප්‍රකාර බන්ධනාගාරගත කොට හෝ රඳවා සිටින යම් තැනැත්තකු යුධාධිකරණයක් ඉදිරියේ සාක්ෂිකරුවකු ලෙස හෝ නඩු විභාගයක් සම්බන්ධයෙන් හෝ අන් ලෙසකින් කරුණු විමසීම සඳහා නාවික සිරභාරයට භාර දෙන ලෙස නියම කිරීමේ බලධාරියා විසින් ලිඛිත ආඥාවක් මගින් කරනු ලබන විධානය නිත්‍යානුකූල විය යුතු ය ඒ ආඥාව ඉදිරිපත් කළ විට ඒ තැනැත්තා එපරිද්දෙන් ම ඒ සිරභාරයට භාර දිය යුතුය.

(4) දණ්ඩන නියමය ලිහිල් කරනු ලැබූ නාවික සිරකරුවකු නියම කිරීමේ බලධාරියාගේ ආඥාවක් මගින් නිදහස් කළ හැකිය.

බන්ධනාගාරගත කිරීමේ හෝ රඳවා තැබීමේ වාර ආරම්භය

126. (1) මේ පනත අනුව බන්ධනාගාරගත කිරීමේ හෝ රඳවා තැබීමේ සෑමවාරයක් ම දණ්ඩනය නියම කරන ලද දවසේ ආරම්භවන බව සැලකිය යුතු ය.

(2) නැවක් සමුද්‍රස්ථවීම හේතු කොට ගෙන හෝ එය සුදුසු බන්ධනාගාරයක් හෝ සුදුසු නිවර්තන නිවාස නොමැති තැනකට ඈතින් තිබීම හේතු කොට ගෙන වරදකරුවකුට නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ හෝ රඳවා තැබීමේ දණ්ඩනයක් විඳීමන් ලෙස ක්‍රියාවේ යෙදිය නො හැකි වූ අවස්ථාවක සුදුසු බන්ධනාගාරයක් හෝ සුදුසු නිවර්තන නිවාසය ඇති යම් තැනකට ඔහු පැමිණීමේ දි එසේ පැමිණි අවස්ථාව දණ්ඩනය නියම කරනු ලැබූ දවස වූ විටක මෙන් නියමිත දණ්ඩනය ඔහු විසින් විඳිය යුතු ය තවද ඔහුට නියම කොට තිබූ දණ්ඩනය සම්බන්ධයෙන් ඔහු සිර කොට තබන ලද යම් කාලයක් එපරිද්දෙන් ම අඩු කිරීමට යටත් ව බන්ධනාගාරගත කිරීමේ හෝ රඳවා තැබීමේ වාරය ගණන් ගත යුතුය.

නාවික සිරභාරයේ රඳවා තැබීම

127. බන්ධනාගාරගත කිරීමේ හෝ රඳවා තැබීමේ දණ්ඩනයට නියම වූ යම් වරදකරුවකු නාවික සිරභාරයේ රඳවා තබනු ලැබූ කාලය ඔහුගේ දණ්ඩන නියමය අනුව බන්ධනාගාරගත කිරීමේ හෝ රඳවා තැබීමේ කාලයක් ලෙස ගණන් ගත යුතුය.

සිහි විකල වූ සිරකරුවෝ

128. යුධාධිකරණයක් විසින් හෝ මේ පනත යටතේ අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරියකු විසින් නියම කරන ලද දණ්ඩනයක් ප්‍රකාර බන්ධනාගාරගත කොට හෝ රඳවා තබනු ලැබ සිටින තැනැත්තකු සිහි විකල වුවහොත් ඒ තැනැත්තා සිහි විකල ව සිටින බව දැක්වෙන සහතිකයක් සුදුසුකම් ඇති වෛද්‍ය වෘත්තිකයන් දෙදෙනකුගෙන් ඉදිරිපත් කරනු ලැබූ කල් හි ඒ තැනැත්තා මානසික ආරෝග්‍යශාලාවකට හෝ සිහි වකල වූ තැනැත්තන් භාරගන්නා වෙන තැනකට ගෙන යා යුතු ය යි ද ඔහුගේ බන්ධනාගාරගත කිරීමේ හෝ රඳවා තැබීමේ වාරයෙන් නොගෙවුනු කාලය හෝ නැවත ඔහුට හොඳ සිහිය ලැබෙන තුරු එහි ම සිර කොට තැබිය යුතු ය යි ද ජනාධිපති විසින් ආඥාවක් කළ හැකිය තවද ඒ කාලය ගත වීමට පෙර නැවතත් ඔහු හොඳ සිහියෙන් සිටිනැ යි එයාකාරයෙන් ම සහතික කරනු ලැබුවහොත් ඒ තැනැත්තා සිහි විකල නොවී සිටියේ නම් සිර කරනු ලැබිය හැකි ව තුබූ යම් බන්ධනාගාරයක් වෙත හෝ නිවර්තන නිවාසයක් වෙත ඔහු ගෙන යා යුතු ය යි ද ඒ වාරයේ ඉතිරි කොටස ඔහු එහි දි ගෙවිය යුතු ය යි ද ජනාධිපති විසින් අණ කළ හැකි ය .

නාවික බන්ධනාගාර සහ නිවර්තන නිවාස පිහිටුවීම

**129.** (1) ගොඩනැගිලි හෝ නැව් කිසිවක් හෝ ඒවායේ කොටස් කිසිවක් නාවික බන්ධනාගාර ලෙස හෝ නාවික නිවර්තන නිවාස ලෙස ඇමතිවරයා විසින් වෙන් කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය. තවද කාරණයට ගැලපෙන පරිදි නාවික බන්ධනාගාර ලෙස හෝ නාවික නිවර්තන නිවාස ලෙස එසේ වෙන් කරන ලද ගොඩනැගිලි හෝ නැව් කිසිවක් හෝ ගොඩනැගිලිවල හෝ නැව්වල කොටස් කිසිවක් මේ පනතේ අර්ථය ඇතුළත පිලිවෙලින් නාවික බන්ධනාගාර හෝ නාවික නිවර්තන නිවාස විය යුතු බව සැලකිය යුතුය.

(2) සතුරාට විරුධ ව යුධ ක්‍රියා මෙහෙයවනු ලබන යම් රටක දි (1) වෙනි උප වගන්තිය යටතේ ඇමතිවරයා සතුව ඇති බලතල යුධ වැදි සිටින ලංකා බල හමුදාවල් එවකට තම අණ යටතේ තබාගෙන සිටින නිලධාරියා විසින් පාවිච්චි කළ යුතු ය.

## දහතුන් වෙනි කොටස
## සිවිල් අධිකරණ

මේ පනතින් හානියක් නොවූ සිවිල් අධිකරණවල අධිකරණ බලය

**130.** (1) යම් සිවිල් වරදක් සම්බන්ධයෙන් නාවික නීතියට යටත් යම් තැනැත්තකු විභාගයකට භාජන කොට ඔහුට දඬුවම්දිමෙහි ලා සිවිල් අධිකරණයකට ඇති අධිකරණ බලයට (2) වෙනි උපවගන්තියේ යොදා ඇති විධි විධාන හැර මේ පනතේ කිසිවකින් හානියක් නො විය යුතු ය.

(2) යුධාධිකරණයක් විසින් නාවික නීතියට යට්ත තැනැත්තකු යම් සිවිල් වරදකට වරදකරු කොට දඬුවම් නියම කරනු ලැබ ඉක්බිති සිවිල් අධිකරණයක් විසින් ඔහු ඒ වරද සම්බ්නධයෙන් ම විභාගයකට භාජන කොට වරදකරු කරනු ලැබුවහොත් එවිට සිවිල් අධිකරණය විසින් ඔහුට දඬුවම් දිමෙහි දි යුධාධිකරණයේ දණ්ඩන නියමට පරිදි කලින් ම ඒ තැනැත්තා විඳින්නට ඇති දඬුවම් ගැන නිසි සැලකිලි දැක්විය යුතුය.

නාවික වරද කරුවන් සිවිල් බලදරන තැනකට භාර දීම

**131.** (අ) යම් සිවිල් වරදක් සම්බන්ධයෙන් සිවිල් අධිකරණයක් ඉදිරියේ චෝදනා ලැබ හෝ වරදකරු කරනු ලැබ තම අණ යටතේ සිටින යම් නිලධාරියකු හෝ නාවිකයකු ඒ අධිකරණය වෙත භාර දිම සඳහා ඒ අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබූ විට ඔහු ඒ අධිකරනය වෙත භාරදිම හා

(ආ) එසේ චෝදනා කරනු ලැබූ හෝ වරදකරු කරනු ලැබූ යම් නිලධාරියකු හෝ නාවිකයකු අත් අඩංගුවට ගැනිමෙහිලා නීතිය ක්‍රියාවේ යෙදවිමට බැඳුනු හෝ සම්බන්ධ වූ යම් පොලිස් නිලධාරියකුට ඒ වෙන යම් නිලධාරියක සහාය විම ද සැම අණ දෙන නිලධාරියාගේ ම යුතුකම විය යුතු ය.

ශ්‍රේෂ්ඨාධිකරණය මගින් පරමාධිකාර ආඥාපත්‍ර නිකුත් කිරිම

**132.** (1) මන්ඩාමුස් කර්ටියෝරි සහ තහනම් කිරිමේ ආඥාපත්‍ර ප්‍රදානය කිරිමත් නිකුත් කිරිමත් සම්බන්ධයෙන් අධිකරණ ආඥා පනතේ 42 වෙනි වගන්තියේ ඇති විධිවිධාන යම් යුද්ධාදිකරණයක් සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ අධිකරණ බලතල පාවිච්චි කරන යම් නාවික නිලධාරියකු සම්බන්ධයෙන් අදාළ විය යුතු බව සැලකිය යුතු ය.

6 වෙනි අධිකාරිය

(2) හබෙයාස් කෝර්පුස් ආඥාපත්‍ර නිකුත් කිරිම සම්බන්ධයෙන් අධිකරණ ආඥාපනතේ 45 වෙනි වගන්තියේ ඇති විධිවිධාන යුධාධිකරණයක හෝ වෙනත් නාවික බලධාරියකුගේ ආඥාවක්

මගින් නිති විරෝධී ලෙස නවත්වා ගනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් අදාල විය යුතු බව සැලකිය යුතුය.

මේ පනත යටතේ කරනු ලබන ක්‍රියාවලට විරුද්ධ ව නඩු පැවරීම

**133**. මේ පනත අනුව හෝ මෙය ක්‍රියාවේ යෙදවීමේ ලා හෝ ක්‍රියාවේ යෙදවීමේ අදහසින් කරනු ලැබූ යම් ක්‍රියාවග් සම්බන්ධයෙන් හෝ මේ පනත ක්‍රියාවේ යෙදවීමේදී වී ඇතැයි කියනු ලබන යම් නොසැලකිල්ලක් හෝ පැහැර හැරීමක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන යම් නඩුවක් පැමිණිල්ලක් හෝ නීතිකෘත්‍යයක් -

(අ) අවලාදයට ලක් වු ක්‍රීයාවෙන් නො සැලකිල්ලෙන් හෝ පැහැර හැරීමෙන් පසු හයමසක් ඇතුලත අරඹනු ලැබුවහොත් ද

(ආ) සංස්ථාපනය කිරිමට අදහස් කොට ඇති නඩුවට පැමිණිල්ලටහෝ නීතිකෘත්‍යයට අසුවන තැනැත්තාගේ නිවාසය වෙත හෝ කාර්යාලලීය ලිපනය අනුව නඩු නිමිත්ත හෝ කොට ඇතැයි කියනු ලබන වරදක් පැමිණිලිකරුවට හෝ චෝදකයා විමට අදහස් කරන තැනැත්තාගේ නම සහ ලිපිනයත් ඉල්ලනු ලබන යම් සහනයකුත් දැක්වෙන ලිඛිත දැන්විමක් භාර දි හෝ තබා ඇතොත් හා

(ඇ) ඒ දැන්විම එසේ භාර දෙනු ලැබීමෙන් හෝ තබනු ලැබීමෙන් පසු මසක් ඉකුත් වි ඇතහොත් ද විනා. සංස්ථාපනය කිරිම හෝ භාර ගැනිම නො කළ යුතුය

## දහහතරවන කොටස
## සාක්ෂි නීති

යුධාධිකරණ ඉදිරියේ පැවැත්වෙන නීති කාකෘත්‍ය සම්බන්ධ සාක්ෂි නීති

**134**. මේ කොටසේ සෙසු විධිවිධානවලට යටත් ව යුධාධිකරයක් ඉදිරියේ පැවැත්වෙන නීතිකෘත්‍යවල දී යොදා ගත යුතු සාක්ෂි නීති ලංකාවේ අසෛනික අධිකරණවල දී අනුගමනය කරනු ලබන සාක්ෂි නීතිමය විය යුතුය

**136 සිට 146** දක්වා වූ වගන්ති අදාළ කිරිම

**135**. යුදාධිකරණයක් ඉදිරියේ වුවත් අසෛනික අධිකරණයක් ඉදිරියේ වුවත් වෙනයම් නීතියක තිබෙන කිසිවක් ගැන නො සලකා මේ පනත යටත් පැවැත්වෙන නීතිකෘත්‍යවලට **136** සිට **146** දක්වා දෙකම ඇතුළුව ඇති වගන්ති අදාළ කළ යුතුය

නාවිකයකු ලෙස තැනැත්තකු බඳවා ගැනිමේ දි හෝ නැවත සේවයෙහි යෙදවිමේ දී ඔහු විසින් දෙන පිළිතු-රුවලට සාක්ෂි බඳවාගත් බව ඔප්පු කිරිම

**136**. නාවික හමුදාවේ නාවිකයකු ලෙස තැනැත්තකු බඳවා ගනු ලබන විට ඔහු අත්සන් කොට ඇතැ යි හැගෙන සහතික කිරිමේ පත්‍රිකාවෙහි හෝ නාවික හමුදාවේ සේවයට තැනැත්තකු නැවත බඳවා ගනු ලබන විට ඔහු කොට ඇතැ යි හැගෙන ප්‍රකාශයෙහි දැක්වෙන අයුරින් ඔහු ප්‍රශ්ණවලට පිළිතුරු දි ඇති බවට ඒ සහතික කිරිමේ පත්‍රිකාව ම හෝ ඒ ප්‍රකාශය ම සාක්ෂියක් විය යුතු ය

**137**. නාවික හමුදාවේ නාවිකයකු ලෙස තැනැත්තකු බඳවා ගත් බව ඔහුගේ සහතික කිරිමේ පත්‍රිකාව භාරව සිටින නිලධාරියා විසින් සහතික කරනු ලැබූ පිටපතක් ඉදිරිපත් කිරිමෙන් පිටපතහි අත් අකුරු එකී නිලධාරියාගේ බව හෝ එකී භාරය ඒ නිලධාරියාට ඇති බව ඔප්පු කිරිමක් නොමැතිව ඔප්පු කල හැකිය

සේවය පිළිබඳ වූ ලියුම් වාර වාර්තා හෝ වෙනත් ලේඛණ

**138**. යම් තැනැත්තකු -

(අ) යම් කාලයක දි නාවික හමුදාවේ සේවය කොට ඇති හෝ නැති බව හෝ නාවික හමුදාවෙන් නිදහස් කොට ඇති හෝ නැති බව හෝ

(ආ) නාවික හමුදාවේ යම් කොටසක තනතුරක් හෝ පත්වීමක් දරා ඇති හෝ නැති බව හෝ නාවික හමුදාවේ යම් කොටසකට පත් කොට හෝ මාරු කොට ඇති හෝ නැති බව හෝ යම් විශේෂ රටක හෝ ස්ථානයක සේවය කොට ඇති හෝ නැති බව හෝ

(ඇ) බලය නොලත් තැනැත්තකු විසින් පාවිච්චි කිරීම හෝ පැළඳීම මේ පනත යටතේ වරදක් වූ යම් නාවික පළදනාවක් පදක්කමක් පදක්කම් බදනයක් තිල ලකුණක් සම්මාන පටියක් හෝ සංකේතයක් පාවිච්චි කිරීමට හෝ පැළඳීමට බලය පවරනු ලැබ ඇති හෝ නැති බව ඔහු සම්බන්ධයෙන් දැක්වෙන්නා වූද නාවික හමුදාවේ ඒ තැනැත්තා අයිති ව සිටි බව පෙනෙන හෝ අයිති ව සිටිනබව හෝ යම් කාලයක අයිති ව සිටි බව කියනු ලබන කොටසේ අණදෙන නිලධාරියා විසින් හෝ ඒ කොටසේ ලේඛන භාරව සිටින නිලධාරියා විසින් අත්සන් කොට ඇතැ යි හැගෙන්නා වූ ද ලියුමක් වාර වාර්තාවක් හෝ සෙසු ලේඛනයක් ම ඒ ලිපියේ වාර වාර්තා වේ හෝ සෙසු ලේඛනයේ සඳහන් කොට ඇති කරුණුවලට සාක්ෂි දැරිය යුතුයි

**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් මුද්‍රිත නියෝග සහ ආඥා පිටපත්**

**139**. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් මුද්‍රණය කොට ඇතැයි හැගෙන මේ පනත යටතේ පනවනු ලැබූ නියෝග හෝ ආඥා පිටපත් ම ඒ නියෝග වලට හෝ ආඥාවලට සාක්ෂි දැරිය යුතු ය

**නාවික ලේඛණය හෝ ගැසට් පත්‍රය**

**140**. ජනාධිපතිගේ බලය ප්‍රකාර ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් ප්‍රසිද්ධ කරනු ලැබූ ලෙස හැගෙන නාවික ලේඛනයක් හෝ ගැසට් පත්‍රයක් ම එහි සඳහන් නිලධාරින්ගේ තනතුරුවලට ද ඒ නිලධාරින් විසින් දරනු ලබන පත්වීම් කිසිවකට හා නාවික හමුදාවේ ඒ නිලධාරින් අයිති ව සිටින හෝ යම් කාලයක අයිති ව සිටි කොටස්වලට ද සාක්ෂි දැරිය යුතු ය

**නාවික බලධාරින් විසින් මේ පනත යටතේ පනවනු ලබන ආඥා**

**141**. මේ පනත යටතේ නාවික බලධාරියකු විසින් පනවනු ලබන ආඥාවක්ම එහි සඳහන් කිරීමට මේ පනතින් නියම කෙරෙන කරුණුවලට සාක්ෂියක් විය යුතු බව සැලකිය යුතු ය තව ද ඒ ආඥාවේ සැබෑ පිටපතක් බව සහතික කිරීමට නාවික හමුදාධිපති විසින් බලය පරවනු ලැබ සිටිතැ යි එහි කියනු ලබන නිලධාරියා විසින් සහතික කොට ඇතැ යි හැගෙන පිටපතක් සාක්ෂි වශයෙන් පිළිගත හැකි විය යුතු ය

**රාජකාරිය අනුව නාවික හමුදාවේ පොතක කරනු ලබන සටහනක්**

**142**. යම් නාවික රාජකාරියක් අනුව නාවික හමුදාවේ යම් පොතක සටහනක් කරනු ලැබ අණ දෙන නිලධාරියා විසින් හෝ ඒ සටහන ලිවීමේ කාර්යය පැවරි ඇති නිලධාරියා විසින් එය අත්සන් කොට ඇති බව හැගෙන අවස්ථාවක ඒ සටහනම එමගින් දැක්වුණු කරුණුවලට සාක්ෂියක් විය යුතුය ඒ පොත භාරව සිටින නිලධාරියා විසින් ඒ සටහනේ සැබෑ පිටපතක් බව සහතික කොට ඇතැයි හැගෙන පිටපතක් ම ඒ සටහනට සාක්ෂි දැරිය යුතුය

**සවිස්තර වාර වාර්තාව**

**143**. සුලු අපරාධ විනිශ්චයකරුවකු විසත් අත්සන් කොට ඇතැයි හැගෙන 151 වෙනි වගන්තියේ අර්ථය ඇතුළත සවිස්තර වාර වාර්ථාවක් එහි ම දැක්වෙන කරුණුවලට සාක්ෂි දැරිය යුතුය

**පැන ගොස් හෝ නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු හෝ අතිසි ලෙස ඉවත් ව ගිය තැනැත්තකු භාරවීම පිළිබඳ සහතිකය**

144. (1) පැනයන්නකු වීම හෝ නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු හෝ අතිසි ලෙස ඉවත්ව ගිය තැනැත්තකු වීම සම්බන්ධයෙන් චෝදනා ලැබූ යම් නිලධාරියකු හෝ නාවිකයකු ප්‍රොවස්ට් මාර්ෂල්වරයකු වෙත හෝ උප ප්‍රොවස්ට් මාර්ෂල්වරයකු වෙත හෝ සෙසු නිලධාරියකු වෙත පැමිණ භාරවන අවස්ථාවක ඒ ප්‍රොවස්ට් මාර්ෂල්වරයා විසින් හෝ ඒ උප ප්‍රොවස්ට් මාර්ෂල්වරයා විසින් හෝ ඒ සෙසු නිලධාරියා විසින් අත්සන් කොට ඇතැයි හැගෙන්නා වූ ද භාරවීම පිළිබඳ සිද්ධිය දිනය හා ස්ථානය සඳහන් වන්නාවූ ද සහතිකයක් ම එසෙ සඳහන් කරන ලද කරුණු සාක්ෂි දැරයි යුතු ය

(2) පැනයන්නකු වීම හෝ නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු හෝ අතිසි ලෙස ඉවත්ව ගිය තැනැත්තකු වීම සම්බන්ධයෙන් චෝදනා ලැබූ යම් නිලධාරියකු හෝ නාවිකයකු පොලිසියක් භාරව සිටින පොලිස් නිලධාරියකු වෙත පැමිණ භාර වූ විට ඒ පොලිස් නිලධාරියා විසින් ඔහු නාවික සිරභාරයට පවරනු ලැබූ අවස්ථාවක ඒ පොලිස් නිලධාරියා විසින් අත්සන් කොට ඇතැයි හැගෙන්නා වූ ද භාරවීම පිළිබඳ සිද්ධිය දිනය හා ස්ථානය සඳහන් වන්නා වූ ද සහතිකයක් ම 'එසේ සඳහන් කරන ලද කරුණු වලට සාක්ෂි දැරිය යුතුය

**නිලධාරියකු හෝ නාවිකයකු ලංකා වෙන් පිටත දි අත්අඩංගුවට ගැනිමහෝ භාර විම පිළිබඳ සහතිකය**

145. ලංකාවෙන් පිටත වූ යම් තැනක දි යම් නිලධාරියකු හෝ නාවිකයකු අත් අඩංගුවට ගෙන ලංකාවේ පොලිසියකට අනුරූප වූ යම් කාර්යාලයක් සේවා ස්ථානයක් හෝ මුරපලක් වෙත ගෙන යනු ලැබූ අවස්ථාවක හෝ ඔහු භාර වූ විට එබඳු යම් කාර්යාලයක දි සේවා ස්ථානයක දි හෝ මුරපල කදි සිරභාරයට ගනු ලැබූ අවස්ථාවක ඒ කාර්යාලය සේවා ස්ථානය හෝ මුරපල භාර නිලධාරියා විසින් අත්සන් කොට ඇතැයි හැගෙන්නා වූ ද අත් අඩංගුවට ගැනිම හෝ භාරවීම පිළිබඳ සිද්ධිය දිනය හා ස්ථානය සඳහන් වන්නාවූ ද සහතිකයක් ම එසෙ සඳහන් කරන ලද කරුණුවලට සාක්ෂි දැරිය යුතු ය

**යුධාධිකරණයක නිතිකෘත්‍යවල පිටපතක්**

146. නාවික හමුදාධිපති විසින් හෝ නාවික හමුදාධිපති විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ යම් නිලධාරියකු විසින් යුධාධිකරණයක සම්පූර්ණ නිති කෘත්‍යවල හෝ ඒවායේ යම් කොටසක සැබෑ පිටපතක් බව සහතික කොට ඇතැයි හැගෙන ඒ නිති කෘත්‍යවල හෝ ඒ කොටසේ පිටපතක් ඒ අධිපතිගේ හෝ නිලධාරියාගේ අත්සන් ප්‍රත්‍යක්ෂ කිරිමක් නොමැති ව සාක්ෂි වශයෙන් පිළිගත හැකි විය යුතු ය

**අසෛනික අධිකරණ යක් විසින් වරදකරු කරනු ලැබූ බවට හෝ නිදොස් කරනු ලැබූ බවට සාක්ෂි**

147. යම් වරදක් සම්බන්ධයෙන් අසෛනික අධිකරණයක් විසින් නාවික නිතියට යටත් යම් තැනැත්තකු විභාගයකට භාජන කරනු ලැබූ අවස්ථාවක ඒ තැනැත්තාගේ අණදෙන නිලධාරියා විසින් හෝ ඒ අණදෙන නිලධාරියා ඒ සඳහා බලය පවරනු ලැබූ වෙන යම් නිලධාරියකු විසින් ඉල්ලීමක් කරනු ලැබුවහොත් ඒ තැනැත්තා විභාගයකට භාජන කරනු ලැබිමට හේතු වූ වරදත් ඒ පිළිබඳ ඒ අධිකරණයේ නඩු තින්දුවත් දැක්වෙන සහතිකයක් ඒ අධිකරණයේ ලේඛකාධිකාරි ලේකම් හෝ ප්‍රධාන ලිපිකරුවා විසින් ඉල්ලීම කළ නිලධාරියා වෙත යැවිය යුතුය යුධාධිකරණයක් ඉදිරියේ හෝ මේ පනත යටතේ අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරියකු ඉදිරියේ පැවැත්වෙන යම් නිතිකෘත්‍යයක දි ඒ සහතික ය ම එහි සඳහන් කරන ලද කරුණුවලට සාක්ෂි දැරිය යුතුය

## පහළොස්වන කොටස
## විවිධ කරුණු

යුධ කාලය තුළ විනය කඩකිරීමේ වරදවල් සම්බන්ධයෙන් නිල ධාරීන් විභාගයකට භාජනය කිරීම

148. (1) නිලධාරියකු විනය පිළිබඳ වරදක් යුද්ධ කාලය තුළ දී කළ අවස්ථාවක යුධාධිකරණයක් පැවැත්වීමට අණකිරීමේ බලය පැවරි ඇති නිලධාරියා විසින් එය යුධාධිකරණයක් මගින් පැවැත්වෙන නඩු විභාගයක් අවශ්‍ය නොවන ස්වභාවයේ වරදක් ලෙස සැලකුවහොත් වරදකරුවාගේ නඩු විභාගය සඳහා යුධාධිකරණයක් වෙනුවට මෙහි මින්මතු සඳහන් කෙරෙන අයුරින් සංස්ථාපනය වූ විනයාධිකරණයක් පවත්වන ලෙස අණ කළ හැකිය

(2) විනයාධිකරණයක් තුන් දෙනෙකුට අඩුනොවූ ද පස් දෙනෙකුට වැඩි නොවූ ද නිලධාරීන් ගණනකින් සමන්විත විය යුතු ය මොවුන් ගෙන් එක් තැනැත්තකු අණ දෙන්නකු හෝ තනතුරින් ඊට වඩා උසස් වූවකු විය යුතු ය

(3) රදවා තැබීමට වඩා පහත් වූ එහෙත් උසස් නොවූ දණ්ඩන ක්‍රමයේ යම් දඩුවමක් නියම කිරීමේ බලය විනයාධිකරණයකට තිබිය යුතුය

සන්නද්ධ කැරලි කරුවන් සහ හමුදා කැරලි කරුවෝ

149. සන්නද්ධ කැරලිකරුවන් සන්නද්ධ හමුදා කැරලිකරුවන් සහ මුහුදු කොල්ලකරුවන් සියලු දෙනා ම මේ පනතේ අර්ථය ඇතුළත සතුරන් ලෙප සැලකිය යුතු ය

වරදකරුවන් අත්අඩංගුවට ගැනීමේ බලය

150. නාවික හමුදාවේ නැවත් තම අණ යටතේ ඇති නිලධාරියකු විසින් හෝ අධිකරණ බලතල පාවිච්චි කිරීමට මේ පනතින් බලය පැවරුනු නිලධාරියකු විසින් තම අත්සන යෙදූ වරෙන්තුවක් මගින් මේ පනත යටතේ ඒ වරෙන්තුවේ සඳහන් කරනු ලැබිය හැකි යම් වරදක් සම්බන්ධයෙන් නාවික නීතියට යටත් තැනැත්තකු අත් අඩංගුවට ගන්නා ලෙස යම් තැනැත්තකු වෙත බලය පැවරිය හැකිය එබඳු යම් වරෙන්තුවක එක ම ස්වභාවයේ වරදවල් කිපයක් සම්බන්ධයෙන් එක් තැනැත්තකුට වැඩි ගණනකගේ නම් ඇතුළත් කළ හැකි ය තව ද එබඳු යම් වරෙන්තුවක නම් කරන ලද යම් තැනැත්තකු අත්අඩංගුවට ගනු ලැබූ විට ඔහු අයිති ව සිටින නැවට හෝ නාවික හමුදාවේ අන්කිසි නැවකට ඔහු ගෙන යන ලෙස වරෙන්තුවේ නියම කොට තිබේ නම් අප්‍රමාද ව ම එසේ කළ හැකි ය වරදකරුවකු අත් අඩංගුවට ගැනීම පිණිස එබඳු යම් වරෙන්තුවක් මගින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් අත් අඩංගුවට ගැනීම ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා අවශ්‍ය වූවහොත්බලය පාවිච්චි කළ හැකිය

පැනයන්නන් හා නිවාඩු නොගෙන බැහැරව සිටින්නන් අත්අඩංගුවට ගැනීම

151. පැනයන්නන් වූ හෝ නිවාඩු නොගෙන බැහැරව සිටින්නන් වූ නිලධාරීන් හා නාවිකයන් සම්බන්ධයෙන් පහත දැක්වෙන විධිවිධාන බලපෑ යුතු ය

(අ) නිලධාරියකු හෝ නාවිකයකු පැනයන්නකු වෙතැ යි හෝ නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තන් හෝ අතිසි ලෙස ඉවත්ව ගිය තැනැත්තකු වෙතැ යි සාධාරණ ලෙස සැක කරනු ලැබූ විට යම් පොලිස් නිලධාරියකු විසින් හෝ පොලිස් නිලධාරියකු ළඟ නොසිටිය හොත් යම් තැනැත්තකු විසින් අත් අඩංගුවට ගෙන අප්‍රමාද ව ම සුළු අපරාධ අධිකරණයක් ඉදිරියට ගෙන යාම නීත්‍යානුකූල විය යුතුය

(ආ) නිලධාරියකු හෝ නාවිකයකු පැනයන්නකු වෙතැ යි හෝ නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තන් හෝ අතිසි ලෙස ඉවත්ව ගිය තැනැත්තකු වෙතැ යි සාධාරණ ලෙස සැක කරනු ලැබ

ඔහු සුළු අපරාධ අධිකරණයක් ඉදිරියට ගෙනයනු ලැබූ අවස්ථාවක අධිකරනය විසින්

(i) දිවුරුම් පිට හෝ සහතික ප්‍රකාශයක් පිට දෙනු ලබන නිදහස් සාක්ෂි මගින් නැතහොත් ඒ නිලධාරියාගේ හෝ නාවිකයාගේ පාපෝච්ඡාරණයක් මගින් ඔහු පැනයන්නකු බව හෝ නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු හෝ අනිසි ලෙස ඉවත්ව ගිය තැනැත්තකු බව එත්තු ගනු ලැබුවහොත් ඔහු ආරක්ෂා සහිතව සිරභාරයේ තැබ්මෙහි ලා අතිශයින් ම යෝග්‍ය යි අධිකරනයටපෙනි යා හැකි ලෙසකින් ඔහු නාවික සිරභාරයට භාර කරවීම හෝ එහි එසේ භාර කරවිය හැකි වන තෙක් ඔහු නාවික සිරභාරයට භාර කිරිමේ කාර්යය සඳහා සාධාරණ ව අවශ්‍ය වෙතැ යි අධිකරණයට හැගෙන කාලයක් යම් බන්ධනාගාරයකට පොලිසියකට හෝ සිරභාර යේ සිටින තැනැත්තන් අඩස්සි කිරිම සඳහා නීත්‍යානුකූලව විධි විධාන යොදා ඇති සෙසු තැනකකට අප්‍රමාදව ම භාර කරවිය යුතු අතර

(ii) ඒ නිලධාරියා හෝ නාවිකයා තමා ඔහු පැනයන්නකු බව හෝ නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු හෝ අනිසි ලෙස ඉවත්වගිය තැනැත්තකු බව පිළිගත් විට ඒ පාපෝච්චාරණය පිළිබඳ සත්‍යය අධිකරණයට අවබෝධ නොවූ අවස්ථාවක පාපෝච්චාරණය පිළිබඳ ෂත්‍යය හෝ අසත්‍යය සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනිමේ කාර්යය සඳහා ඔහු රක්ෂණ බන්ධනාගාරයට යැවිය යුතුය තවද ඒ කාර්යය සඳහා ඒ නිලධාරියා හෝ නාවිකයා සම්බන්ධයෙන් නියම කළ හැකි තොරතුරු ඇතුළත් නියමිත ආකෘතියේ ලියූ සවිස්තර වාර වාර්තාවක් අධිකරණය විසින් නාවික හමුදාධිපති වෙත යැවිය යුතුය

(ඇ) මේ වගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් නිලධාරියා හෝ නාවිකයා අධිකරණය විසින් එක් එක් අවස්ථාවේ දි දින අටකට වැඩි නොවන කාලයක් වරින් වර රක්ෂණ බන්ධනාගාරයට යැවිය හැකිය

(ඇ) මේ වගන්තයේ (ආ) (i) ඡේදය යටතේ අධිකරණයක් විසින් නිලධාරියකු හෝ නාවිකයකු නාවික සිරභාරයට භාර කරවනු ලැබූ අවස්ථාවක නැතහොත් පැනයන්නකු ලෙස හෝ නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු හෝ අනිසි ලෙස ඉවත්ව ගිය තැනැත්තකු ලෙස භාර කරවුන ලැබූ අවස්ථාවක අධිකරණය විසින් ඒ නිලධාරියා හෝ නාවිකයා පිළිබඳ විස්තර වාර වාර්ථාවක් නාවික හමුදාධිපති වෙත යැවිය යුතුය

(ඉ) නිලධාරියකු හෝ නාවිකයකු පැනයන්නකු ලෙස හෝ නිවාඩු නොමැතිව නොපැමිණ සිටි තැනැත්තකු ලෙස පොලිස් නිලධරයකුට භාර වූ අවස්ථාවක දි ඔහු රැගෙන එනු ලැබූ පොලිස් ස්ථානය භාර නිලධාරියා විසින් වහාම පරීක්ෂණයක් පවත්වා එම නිලධාරියාගේ හෝ නාවිකයාගේ පාපෝච්චාරණයෙන් ඔහු සේවය අත්හැර ගිය අයකු හෝ නිවාඩු නොමැතිව නොපැමිණ සිටි අයකු හෝ අනිසි ලෙස ඉවත්ව ගිය අයකු බව පෙනි ගියහොත් මේ වගන්තිය යටතේ ඒ නිලධාරියා හෝ නාවිකයා සුළු අපරාධ අධිකරණයක් ඉදිරියට නොපමුණුවා නාවික සිරභාරයට භාර කරවිය හැකි ය එවැනි අවස්ථාවක දි ඒ නිලධාරියාගේ හෝ නාවිකයාගේ භාරවිම පිළිබඳ සිද්ධිය දිනය හා ස්ථානය දැක්වෙන සහතිකයක් ඔහු විසින් ම අත්සන් කොට නාවික හමුදාධිපති වෙත යැවිය යුතුය

152. (1) නයකාරයා ණය වන විට ඔහු නාවික හමුදාවේ සාමාජිකයකු ව නො සිටියහොත් හෝ පැමිණිලිකරු විසින් හෝ ඔහු වෙනුවෙන් යම් තැනැත්තකු විසින් වරෙන්තුවක් කැඳවීම් නියෝගයක් හෝ ආඥාපත්‍රයක් නිකුත් කිරිමට පෙර පැමිණිලිකරුට ලැබිය යුතු ණය ගන්නා ලද්දේ ණය කාරයා නාවික හමුදාවේ සාමාජිකයකු ව නොසිටි කාලයක බව දැක්වෙන දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබුවහොත් හෝ ඒ දිවුරුම් පෙත්සම පිළිබඳ සටහනක් වරෙන්තුවේ කැඳවීම් නියෝගයේ හෝ ආඥාපත්‍රයේ පිට පැත්තේ ලියා තිබුණහොත් මිසි නිලධාරියකුගෙන් හෝ නාවිකයකුගෙන් ලැබිය යුතු ණයක් අය කර ගැනිම සඳහා වූ සිවිල් නඩුවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් මගින් නිකුත් කරන ලද යම් වරෙන්තුවක් කැඳවීම් නියෝගයක් හෝ ආඥාපත්‍රයක් පිට යම් තැනැත්තකු විසින් නිලධාරියකු හෝ නාවිකයකු අත් අඩංගුවට ගැනිම නිත්‍යානුකූල නො විය යුතු ය.

(2) නිලධාරියකු හෝ නාවිකයකු (1) වෙනි උපවගන්තියේ විධි විධාන වලට පටහැනි ව අත් අඩංගුවට ගනු ලැබූ අවස්ථාවක ඒ නිලධාරියා හෝ නාවිකයා විසින් හෝ ඔහුගේ උසස් නිලධාරියකු විසින් පැමිණිල්ලක් කරනු ලැබූ විට ඔහු අත් අඩංගුවට ගැනිමට ආධාර කොට ගත් වරෙන්තුව කැඳවීම් නියෝගය හෝ ආඥාපත්‍රය නිකුත් කළ අධිකරණය විසින නඩුව විභාග කොට අත් අඩංගුවට ගැනිම කෙරි ඇත්තේ ඒ විධි විධානවලට පටහැනිව බව ඒත්තු ගියහොත් අත් අඩංගුවට ගනු ලැබූ නිලධාරියා හෝ නාවිකයා වහා ම නිදහස් කරන ලෙස අණ කිරිම හා පැමිණිල්ල පිළිබඳ ගාස්තු ඔහුට ප්‍රදානය කිරිමත් කළ හැකි ය. වරෙන්තුව කැඳවීම් නියෝගය හෝ ආඥා පත්‍රය නිකුත් කිරිමට යෙදුනු සිවිල් නඩුවේ තින්දුව ගාස්තු සහිතව පැමිණිලිකරුගේ වාසියට දුන් විටක ඒ පැමිණිලිකරුට තිබිය යුතු මාර්ගය ම එය අය කර ගැනිමේ ලා ඔහුට ද තිබිය යුතු ය

153. (1) යම් නිලධාරියකුගේ හෝ නාවිකයකුගේ පඩිය හෝ යම් දිමනාවක් හෝ වෙනත් වේතන පිළිබඳ වූ සැම පැවරිමක් ම සැම බැදිමක් ම හා පැවරිමට හෝ බැදිමට ඇති කර ගත් සැම ගිවිසුමක් ම ජනාධිපතිවරයා විසින් හෝ ජනාධිපතිවරයා විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් අනුමත කරනු ලැබුවහොත් මිස අවලංගු විය යුතුය

(2) යම් අසෛනික අධිකරණයක් මගින් නිකුත් කරන ලද යම් ආඥාපත්‍ර යක් පිට හෝ ආඥාවක් පිට කිසි ම නිලධාරියකුගේ හෝ නාවිකයකුගේ පඩිය දිමනාව හෝ වෙනත් වේතන අල්ලා ගැනිම හෝ තහනම් කිරිම නොකළ යුතු ය.

අඹු දරුවන් නඩත්තු කිරිම

154. නිලධාරියකු හෝ නාවිකයකු ව සිටි හෝ පසු ව නිලධාරියකු හෝ නාවිකයකු වන තැනැත්තකුගේ භාර්‍ය්‍යාව නඩත්තු කිරිමේ හෝ ඔහුගේ සුජාත හෝ අවජාත දරුවකු හෝ දරුවන් නඩත්තු කිරිමේ වියදම වශයෙන් යම් මුදලක් ගෙවිම සඳහා ඔහුට විරුද්ධව තින්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් අසෛනික අධිකරණයක් විසින් කරනු ලැබූ අවස්ථාවක ඒ තින්දු ප්‍රකාශයේ හෝ ආඥාවේ විධිමත් ලෙස සහතික කළ පිටපතක් නාවික හමුදාධිපති වෙත යවනු ලැබුවහොත් නිලධාරියාට හෝ නාවිකයාට ඔහුගේ පඩියෙන් කෙසේ හෝ තුනෙන් එකකට අඩු නො වන මුදලක් ඉතුරු විය යුතු අයුරින් නාවික හමුදාධිපති විසින් තිරණය කළ හැකි කොටසක් නිලධාරියාගේ හෝ නාවිකයාගේ පඩියෙන් අඩු කරවා ඒ මුදල ගෙවිම සඳහා යෙදවිය හැකි ය.

**සොර ගත් බඩු ආපසු දීමේ බලය**

155. (1) යම් දේපලක් සොරකම් කිරීමේ වරදට හෝ යම් දේපලක් සම්බන්ධයෙන් සාපරාධ විශ්වාස කඩ කිරීමේ වරදට හෝ සොර ගත් බඩුවක් බව දැන ගෙන ම යම් දේපලක් ලැබීමේ වරදට යුධාධිකරණයක් විසින් නාවික නීතියට යටත් තැනැත්තකු වරදකරු කරනු ලැබ එකී දේපල හෝ යම් කොටසක් ඒ තැනැත්තා සතුව තිබී සොයා ගනු ලැබූ අවස්ථාවක එසේ සොයාගනු ලැබූ දේපල එහි නීත්‍යානුකූල හිමියා ලෙස පෙනී යන තැනැත්තාට දෙන ලෙස යුධාධිකරණය විසින් හෝ ජනාධිපති විසින් අණ කළ හැකි ය.

(2) (1) වෙනි උපවගන්තියේ සඳහන් වරදකට යුද්ධාධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ තැනැත්තකු සතුව තිබී සොයා ගත් යම් දේපලක් ඒ වරද කිරීමට සම්බන්ධ වූ දේපල කිසිවක් පරිවර්තනය කිරීමෙන් හෝ හුවමාරු කිරීමෙන් ලබා ගෙන ඇති බව යුධාධිකරණයට හෝ ජනාධිපතිට පෙනී ගිය අවස්ථාවක යුධාධිකරණය විසින් හෝ ජනාධිපති විසින් ඒ උප වගන්තිය යටතේ පැනවිය හැකි ආඥාවකට සමාන ව ආඥාවක් පැනවිය හැකි ය.

**ශ්‍රී ලංකා නාවික හමුදාවට සම්බන්ධ වෙනත් විදේශීය නාවික හමුදාවල සාමාජිකයන්**

156. ලංකාවෙන් පිට වෙනත් විදේශ නාවික බලහමුදාවක යම් සාමාජිකයකු රාජකාරිය සහ සේවය සඳහා හෝ යම් අභ්‍යාස හෝ පුහුණුව සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවට සම්බන්ධ කරනු ලැබූ අවස්ථාවක ඔහු එසේ සම්බන්ධ කරනු ලැබ සිටිය දී මේ පනතේ විධි විධානවලට යටත් විය යුතුය

**නාවික හමුදාවේ දේපල නාවික හමුදාධිපතිට පැවරීම**

157. නාවික හමුදාවේ එක් එක් සාමාජිකයාගේ දේපල හැර නාවික හමුදාවට අයිති සියලු ම දේපල සම්බන්ධයෙන් සිවිල් නඩු පැවරීමට ගිවිසුම් ඇති කර ගැනීමට පැවරීම් කිරීමට සහ වෙනත් නීත්‍යානුකූල සියලු ම දේවල් කිරීමට බලය ඇති ව ඒ දේලපල ද සිවිල් නඩු පවරා නාවික හමුදාවට ලැබිය යුතු මුදල් සහ වෙනත් දේපල ආපසු ලබා ගැනීමේ තනි අයිතිය ද නාවික හමුදාවේ එවකට සිටින නාවික හමුදාධිපතිට පැවරී තිබිය යුතු ය තවද නාවික හමුදාධිපති විසින් මේ වගන්තිය ප්‍රකාර කරනු ලබන සිවිල් හෝ අපරාධ නීති කෘත්‍ය කඩ කල යුතු නොවන අතර ඔහුගේ මරණය ඉල්ලා අස්වීම විශ්‍රාම ගැනීම හෝ නිලයෙන් අස් කරනු ලැබීම හේතු කොට ගෙන ඒවා නිෂ්ප්‍රභා නො කළ යුතු ය එහෙත් ඔහුගේ තනතුර දරන අනුප්‍රාප්තිකයා විසින් ඔහුගේ නාමයෙන් ම ඒවා කළ හැකි ය.

**නාවික හමුදාධිපති විසින් කරනු ලබන ආඥාවල් පිලිබඳ විධි විධාන**

158. නාවික හමුදාධිපති විසින් යම් ආඥාවක් කිරීමට මේ පනතින් බලය පවරනු ලැබූ අවස්ථාවක නාවික හමුදාධිපති වෙනුවෙන් ආඥාවල් නිකුත් කිරීමට බලය පවරනු ලැබූ යම් නිලධාරියකුගේ අත්සනින් ඒ ආඥාව සැල කල හැකි ය තවද එසේ බලය පවරනු ලැබ සිටිතැ යි එහි පෙනෙන යම් නිලධාරියකු විසින් අත්සන් කොට ඇති බව හැගෙන ආඥාවක් ම ඔහුට එසේ බලය පැවරී ඇති බවට සාක්ෂි දැරිය යුතුය.

**නාවික නැව් තොටු**

159. යම් නැව්තොටක් සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් ම නාවික හමුදාව විසින් පරිහරණය කරනු ලැබූ අවස්ථාවක අමාත්‍යයා විසින් ඒ නැව් තොටට බලපාන කරුණු සම්බන්ධයෙන් මේ පනත යටතේ නියෝග පැනවිය හැකි වීමේ කාර්යය සඳහා ඒ නැව්තොට නාවික නැව්තොටක් ය යි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන ආඥාවක් මගින් ප්‍රකාශ කළ හැකි ය. නැව්තොට නාවික නැව්තොටක් ය යි ප්‍රකාශ කරනු ලැබූ ආඥාවේ සෑම නාවික නැව් තොටක ම මායිම් පැහැදිලි කොට දැක්විය යුතු ය.

**නැව් තොටුවලට බලපාන ලිඛිත නීතිය බැහැර කිරීම හෝ එය වෙනස්කොට අදාළ කිරීම**

160. (1) ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන ආඥාවක් මගින් ඒ ආඥාවේ සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් සඳහන් කොට ඇත්තා වූ ද නැව්තොටුවලට හෝ නැව්තොටුවල වූ තැනැත්තන් ට හෝ වෙනත් දේපල කට හෝ නැව්තොටුවල දි භාරගත් යම් කටයුත්තක් කර ගෙන යාමට හෝ යම් ක්‍රියාවක් කිරීමට හෝ

කිරීමෙහි ලා ඇතිවන ප්‍රමාදයකට සම්බන්ධ වූ ද (මේ පනත යටතේ පනවන ලද නියෝග හැර) ලිඛිත නීතියේ යම් විධානයක් හා නිරු බඳු නියම කිරීමකට අය කිරීමකට හෝ ගෙවීමකට හෝ හොරෙන් බඩු ගෙන යාම වැළැක්වීමෙහි ලා හෝ සොයා දැන ගැනීමෙහි ලා අදාළ නොවූ හෝ සම්බන්ධ නොවූ විධි විධානයක් ද ආඥාවේ සඳහන් කරනු ලබන දිනයක සිට නාවික හමුදාවේ සාමාජිකයන්ට හෝ නැව්වලට හෝ නාවික හමුදාවේ සාමාජිකයන් සම්බන්ධයෙන් හෝ නැව් සම්බන්ධයෙන් -

(අ) අදාළ නො කළ යුතු යයි හෝ
ආ) ආඥාවේ නියම කරනු ලැබිය හැකි වෙනස් කිරීම් සහිත ව අදාළ කළ යුතු ය යි ප්‍රකාශ කළ හැකි ය

(2) ඇමතිවරයා විසින් (1) වෙනි උපවගන්තිය යටතේ කරනු ලබන සෑම ආඥාවක ම නීතියේ බලය තිබිය යුතු ය

නියෝග

161. (1) මේ පනතින් නියම කිරීමට අවශ්‍ය වූ හෝ අවසර දෙනු ලැබූ හෝ නාවික හමුදාවේ විනය හා මනා වූ පාලනය ආරක්ෂා කර ගැනීම සඳහා හෝ මේ පනත ක්‍රියාවේ යෙදවීම සඳහා නියම කිරීමට නියමිත සියලු ම කරුණුද විශේෂයෙන් මෙහි පහත සඳහන් කරුණු සියල්ල හෝ එයින් කිසිවක් ද දැක්වෙන නියෝග මේ පනතට පටහැනි නොවන ලෙස ඇමතිවරයා විසින් පැනවිය හැකි ය

(අ) නාවික හමුදාවේ පත් කිරීම් සහ උසස් කිරීම්
(ආ) නිලධාරීන්ගේ සහ නැවියන්ගේ පඩි දීමනා සහ වෙනත් වේතන
(ඇ) නිලධාරීන්ට සහ නාවිකයන්ට හෝ මියගිය නිලධාරීන්ගේ සහ නාවිකයන්ගේ වැන්දඹුවන්ට සහ අනාථ දරුවන්ට විශ්‍රාම වැටුප් පාරිතෝෂ
(ඈ) නිලධාරීන්ගේ සහ නාවිකයන්ගේ දුක් ගැනවිලි පිළිබඳ සහන ලබාගැනීමේ ක්‍රියා පිළිවෙළ
(ඉ) යුධාධිකරණය ඉදිරියේ සහ මේ පනත යටතේ අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරීන් ඉදිරියේ සාක්ෂි දීමට නියමිත සාක්ෂිකරුවන් කැඳවීම
(ඊ) විනයාධිකරණ රැස්වීම සහ ඒවායේ ක්‍රියා පිළිවෙළ
(උ) නාවික බන්ධනාගාරය සහ නාවික නිවර්තන නිවාස පාලනය කිරීම හා විධිමත් කිරීම
(ඌ) නාවික බන්ධනාගාරවල සහ නාවික නිවර්තන නිවාසවල සිරකරුවන්ගේ වැඩ සහ ඒ සිරකරුවන් තුළ විශේෂ උද්‍යෝගයක් හා මනා පැවැත්මක් ඇති කිරීමෙන් ඔවුන්ගේ දණ්ඩන නියමවලින් කොටසක් ලිහිල් කරවා ගැනීමේ ශක්තියක් ඔවුන්ට ලබා දීම
(එ) නාවික බන්ධනාගාරවල සහ නාවික නිවර්තන නිවාසවල සිටින සිරකරුවන් අතර විනය ආරක්ෂා කිරීම ඔවුන් විසින් කරනු ලබන වරදවල් සම්බන්ධයෙන් පෞද්ගලික ව මට්ටු කිරීමෙන් දඬුවම් දීම මැඩ පැවැත්වීම හෝ ඒවා සම්බන්ධයෙන් අන් ලෙසකින් කටයුතු කිරීම නියම කරනු ලැබිය හැකි අවස්ථාවල දී නියම කරනු ලැබිය හැකි කාලයක් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව ඔවුන් තාවකාලිකව නිදහස් කිරීම
(ඒ) නාවික ආයතන මනා ලෙස පාලනය කිරීම නාවික ආයතනවල හෝ ඒවා සම්බ්නධයෙන් උපදෙස් හෝ පුහුණුව ලබන හෝ සේවයෙහි යෙදී සිටින තැනැත්තන්ගේ විනය

(ඔ) නාවික නැව්තොටුවලට නැව් ඇතුළුවීම නාවික නැව් තොටු වලින් නික්මයාම නාවික නැව්තොටුවල යාම ඊම හෝ නැංගුරම් ලෑම තහනම් කිරීම හෝ විධිමත් කිරීම

(ඕ) නාවික නැව්තොටුවල දී චුවමනා කරන තැනැත්තන්ට නැව්තොටු උපකරණ හා නැව්තොටු පහසුකම් සම්පාදනය කිරීම සහ ඒ උපකරණ සහ පහසුකම් ප්‍රයෝජනයට ගැනීම සඳහා ගාස්තු නියම කිරීම

(ක) නාවික නැව්තොටුවල ආරක්ෂාව

(ග) නාවික නැව්තොටුවලට තැනැත්තන් ප්‍රවේශවීම තහනම් කිරීම හෝ විධිමත් කිරීම

(ච) නාවික නැව්තොටු ඇතුළත දී තැනැත්තන්ගේ හැසිරීම

(ජ) නාවික නැව්තොටු ඇතුළත යාත්‍රා ගමනාගමනය පාලනය කිරීම

(ට) නාවික නැව්තොටු ඇතුළත දී දේපළවලට අලාභ හානි වැළැක්වීම

(ඩ) නාවික නැව්තොටුවලට බලපාන වෙනත් යම් කරුණක්

(2) නියෝග කඩ කිරීම සම්බන්ධයෙන් මාස තුනකට වැඩි නොවූ කාලයක් වැඩ නැතිව හෝ බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමෙන් හෝ රුපියල් දෙසියයකට වැඩි නොවන දඩයකින් හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ ඒදඩය යන දෙකින් ම දඬුවම් කිරීම සඳහා නියෝගවල විධිවිධාන සැළැස්විය හැකි ය.

(3) යම් වරදකට ශාරීරික දඬුවම් දීමේ බලය (1) වෙනි උප වගන්තියේ (එ) ඡේදයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පනවන ලද කිසිම නියෝගයකින් පැවරී නො තිබිය යුතු අතර එවකට වලංගුව ඇති නීතිය අනුව බන්ධනාගාර ගත කිරීම හෝ රඳවා තැබීම යම් අසෛනික බන්ධනාගාරයක දි ක්‍රියාත්මක වෙනවාට වඩා බරපතල නො විය යුතු ය.

(4) ඇමතිවරයා විසින් මේ වගන්තිය යටතේ පනවනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු වන අතර එය එසේ පළ කරනු ලැබූ දිනයේ සිට වලංගු විය යුතුය නොහොත් පසු දිනයක වලංගුවන බව නියෝගයෙහි විශේෂයෙන් සඳහන් කරනු ලැබූ අවස්ථාවක ඒ පසු දිනයේ සිට වලංගු විය යුතු ය

(5) මේ වගන්තිය යටතේ ඇමතිවරයා විසින් පනවනු ලබන සෑම නියෝගයක් ම අනුමත කළ යුතු යයි පාර්ලිමේන්තුව ඉදිරියට හැකි තරම් ඉක්මණින් යෝජනා මගින් ගෙන ආ යුතු ය

(6) පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂෙපප කරනු ලැබූ යම් නියෝගයක් එය යටතේ කලින් කරන ලද කිසි දෙයක වලංගු බවට හෝ යම් අලුත් නියෝගයක් පැනවීමට හානියක් නොමැතිව අවලංගු විය යුතු බව සැලකිය යුතුය. පාර්ලිමේන්තුව විසින් නියෝගයක් අනුමත කිරීම ප්‍රතික්ෂෙපප කරනු ලබන දිනය ම ඒ නියෝගය අවංලගු විය යුතු ය

(7) මේ වගන්තිය යටතේ ඇමතිවරයා විසින් පනවනු ලබන මේ නියෝගයක් අවලංගු විය යුතු දිනය පිළිබඳ දැන්වීම ගැසට්පත්‍රයේ පළ කළ යුතුය

**162.** **1972** ට පෙර තිබූ රාජකීය නාවික පනත නාවික හමුදාවට උචිත පරිදි වෙනස් කොට සකස් කොට ඇත

**163**. මේ පනතෙහි පද සංසන්දනයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස "සක්‍රිය සේවයණී" යන්නෙන් තියම යුද්ධයක් පවතින හෝ යුද්ධයක් ඇති වෙතැයි සැක කරන කාලයක ලංකාව ආරක්ෂා කිරීමෙහි ලා හෝ ලංකාවේ යම් කැරැල්ලක් හමුදා කැරැල්ලක් හෝ වෙනත් මහජන අරගලයක් වැළැක්වීමේ හෝ මැඩලීමෙහි ලා කරනු ලබන සේවය අදහස් කෙරෙයි. සිවිල් අධිකරණයණී යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ හෝ පාර්ලිමේන්තුව යටතේ හෝ පිහිටුවන ලද යම් අධිකරණයක් අදහස් වේ. සිවිල් වරදක් යන්නෙන් නාවික වරදක් නොවූ ද ලංකාවේ යම් නීතියකට පටහැනි වූ ද වරදක් අදහස් කෙරෙයි. විනය පිළිබඳ වරදණී යන්නෙන් 61 68 69 70 89 හෝ 104 වෙනි වගන්තිය කඩ කිරීමක් අදහස් කෙරෙයි. අමාත්‍යවරයා. යන්නෙන් රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ

"නාවික නැව්තොට" යන්නෙන් 159 වෙනි වගන්තිය යටතේ නාවික නැව්තොටක් ය යි ප්‍රකාශ කරනු ලැබූ නැව්තොටක් අදහස් කෙරෙයි

"නාවික සිරකරුවා" යන්නෙන් යුධාධිකරණයක් විසින් හෝ මේ පනත යටතේ අධිකරණ බලතල පාවිච්චි කරන නාවික නිලධාරියකු විසින් බන්ධනාගාරගත කිරීමේ හෝ රඳවා තැබීමේ දඩුවම් නියම කරනු ලැබූ තැනැත්තකු අදහස් කරයි

"නිලධාරියා" යන්නෙන් අධිකාරලත් නිලධාරියෙක් බලලත් නිලධාරියෙක් හෝ යටත් නිලධාරියෙක් අදහස් කෙරෙයි

"ලේකම්වරයා" යන්නෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වරයා අදහස් කෙරෙයි

"සුලු නිලධාරියා" යන්නට ප්‍රධාන සුලු නිලධාරියෙක් ඇතුලත් වේ

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ පනවනු ලබන නියෝගයකින් නියමිත වුවක් අදහස් කෙරෙයි

"දණ්ඩන ක්‍රමය" යන්නෙන් 120 වෙනි වගන්තියේ දැක්වෙන දණ්ඩන ක්‍රමය අදහස් කෙරෙයි

"නාවිකයා" යන්නෙන් නිලධරයකු නොවන නාවික හමුදාවේ සාමාජිකයකු අදහස් වන අතර එය කාන්තා නාවිකයකු ඇතුලත් වේ

"යටත් නිලධාරියා" යන්නෙන් මධ්‍ය නිලධාරි හෝ ශිෂ්‍යභට නිලධාරි ඇතුලත් වේ

"ඉහළ නිලධරයා" යන්නට යම් නිලධරයකු බලලත් නිලධරයකු සහ සුළු නිලධරයකු ඇතුළත් වේ

"බලලත් නිලධරයා" යන්නෙන් පාලක ප්‍රධාන සුලු නිලධාරියකු හෝ සමූහ ප්‍රධාන සුලු නිලධාරියකු අදහස් වේ